## බුද්ධ පහළ වී

# දම්සක් පැවතුම් සූත්‍රය

## දේශනා කළ වගයි




ආචාර්ය

**තිස්ස සේනානායක**

බුද්ධ පහළවී

# දම්සක්පැවතුම් සූත්‍රය

## දේශනා කල වගයි

*පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදී ඥානං උදපාදී ප්‍රඥා උදපාදී විජ්ජා උදපාදී ආලෝකෝ උදපාදී.*

*පෙර නැසූ ධර්මයකින් පිළිවලින් ඇස ඥානය ප්‍රඥාව විද්‍යාව සහ ආලෝකය පහළ වීමෙන් පසු මෙසේ දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කෙළෙමි.*

ආචාර්ය
තිස්ස සේනානායක

ආචාර්ය තිස්ස සේනානායක සහ වෛද්‍ය රුක්ෂලා ජයරත්න විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

පිටකවරය: සමන් කළුබෝවිල

ප්‍රථම මුද්‍රණය: 2014 නොවැම්බර්

Published by Dr. Tissa Senanayake (PhD in Astrophysics) and Dr. Rukshala Jayaratne.

Cover design: Saman Kalubowilla

Printed by A.M.P Print Shop (Pvt) Ltd, No 54, Nuwara Eliya road, Gampola.

First Printing: 2014 November

Copyright by Dr. Tissa Senanayake

**ISBN** 978-0-9804613-4-3

# හැඳින්වීම

චක්ඛු උදපාදී, ඤාන උදපාදී, ප්‍රඥා උදපාදී, විජ්ජා උදපාදී, ආලෝකෝ උදපාදී ලෙස හඳුන්වන ඇස, ඤානය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය පහළවීමෙන් බුද්ධත්වය සාක්ෂාත් විය. දෙවනුව බුදුවරු පමණක් වැඩවාසය කරන සත්සතියෙන් සතිපහක සතිය පිහිටුවිය. තුන්වෙනුව බුද්ධ වර්ෂ 2558 (කි.ව. 2013) ක් වූ ඇසල පුරපසළොස්වක් පොහෝ දිනයේ සිට දම්සක්පැවතුම් සූත්‍රය දේශනාව ආරම්භ විය.

මවිසින් දේශනා කල දම්සක්පැවතුම් සූත්‍රය මේ කුඩා ග්‍රන්ථයෙන් සංක්ෂිප්තව පෙන්වා ඇත. මේ දේශනාව මට පහළවූ ධර්මයක් විනා ත්‍රිපිටකයේ දක්වා ඇති සූත්‍ර දේශනාවේ සිංහල අනුවාදයක් නොවන බව සලකන්න. එසේම මවිසින් සඳහන් කරන්නට යෙදුන “චක්ඛු උදපාදී, ඤාන උදපාදී, ප්‍රඥා උදපාදී, විජ්ජා උදපාදී, ආලෝකෝ උදපාදී” ආදී වචන දම්සක්පැවතුම් සූත්‍රයෙන් උකහාගත් වචන සමුහයක් පමණක් බවත් මවිසින් පහළකරගත් ධර්ම පෙන්වා දීමට එම වචන උදව් කරගත් බවත් සලකන්න.

දර්ශනයට පත්වූයේ යයි කියන බොහෝ දෙනෙක් බුද්ධිය ඤාන සහ ප්‍රඥාව එක ගොඩකට දමා පොතපතෙන් හෝ ගුරුවරුන්ගෙන් හෝ අසා දැනගත් ඤානය ගැන හෝ ප්‍රඥාව ගැන අවබෝධයෙන් දේශනා කරති. ඤාණ හෝ ප්‍රඥාව පහළ නොවී ඤාණ ගැන හෝ ප්‍රඥාව ගැන පොතපතින් හෝ ගුරුවරුන්ගෙන් හෝ අසා දැනගෙන ඤාණ සහ ප්‍රඥාව අවබෝධකරගැනීම, ගුරුවරුන්ගෙන් අසා දැනගෙන ලැජ්ජාව අවබෝධ කරගන්නවා වැනි දෙයකි. ලැජ්ජාව ගුරුවරුන්ගෙන් ඉගෙනගෙන වැඩියහැකි ධර්මයක් නොවන්නා සේ ප්‍රඥාවද අවබෝධයෙන් හා වැඩීමෙන් පහළකරගත හැකි ධර්මයක් නොවෙයි.

ඉන්ද්‍රිය ධර්ම පිළිගෙන ඒ තුලින් නව ධර්මතා වර්ධනය කර ගැනීම බුද්ධියේ ඵලයකි. ඤාන සහ ප්‍රඥාව බුද්ධිය ඉක්මවයි, නාමරූප ඉක්මවයි. යමෙක් ඇස, ඤානය, ප්‍රඥාව, විද්‍යාව සහ

ආලෝකය පහළනොවී දර්ශනයට පත්වුයේයයි කියමින් එම ධර්ම ගැන දේශනා කිරීම ලැජ්ජාවක් නැති සත්වයා ලැජ්ජාව ගැන දේශනා කරනවා වැනිය.

දම්සක්පැවතුම් සුත්‍රයේ පෙන්වා ඇති මාර්ගය 'බුද්ධ' පහළවන ඒකායන මාර්ගය බව මම ප්‍රත්‍යක්ෂ කර ප්‍රකාශ කර සිටිමි. සියලුම බුදුන් වහන්සේලා බුද්ධත්වය පහළකරගත් පසු එකම දම්සක්පැවතුම් සුත්‍රයක් දේශනා කරති. 'බුද්ධ' පහළකරගත් මවිසින් දේශනා කරන මාර්ගය ද සියළුම බුදුවරු බුද්ධත්වය පහළකරගත් ඒකායන මාර්ගයම වෙයි. මෙම මාර්ගයේ ඇස පහළවෙයි, ඥාන පහළවෙයි, ප්‍රඥාව පහළවෙයි, විද්‍යාව පහළවෙයි, ආලෝකය පහළවෙයි, චතුරාර්ය සත්‍යය දකියි, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන්කරයි. ඇස පහළවූ තැන් සිට 'සත්තමං රාජායතනං' ලෙස සත්සතියේ පෙන්වන, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා සමාධියෙන් අවසන්වන මෙම මාර්ගය තුල අසූහාර දහසක් වූ ධර්ම ස්කන්ධයම පිළිබිඹු වෙයි. (ඥාන පහළකරගත්) ඥානවන්තයා බුදුන්වහන්සේ කරා පැමිණ අසන තමන්ගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් උන්වහන්සේ දේශනා කරන ධර්මය නිසා එම ඥාන වන්තයා ප්‍රඥාව පහළකර ගනියි. මේ විවිධ ප්‍රශ්න සහ පිළිතුරුවලින් අසූහාරදහසක් ධර්මස්කන්ධය මතුවෙයි. ඥානවන්තයාට ප්‍රඥාව පහළවීමෙන් පසු ප්‍රශ්නයත් පිළිතුරත් දෙකම අහෝසි වෙන නමුත් පිළිතුර ධර්මයක් ලෙස ගෙන ප්‍රගුණ කරන යෝගාවචරයෝ ඉන්ද්‍රිය මුළාවට අසුවෙති. නමුත් යම් දවසක ඔවුන්ගේ ඇස පහළවීමට ද මේ මුළාවම හේතුවෙයි. ඇස පහළවූ පසු මෙතෙක් පිළිගත් ධර්මය වෙනුවට ප්‍රශ්නයක්ම පැන නගියි. එයම ඥාන පහළවීමට හේතුවෙයි. තම ප්‍රශ්නයට පිළිතුරු සොයා යන මේ ඥානවන්තයාට සත්ධර්ම ශ්‍රවණයෙන් ප්‍රශ්නයත් පිළිතුරත් අහෝසි වී ප්‍රඥාව පහළවෙයි.

**මවිසින් පහළකරගෙන දේශනා කරනු ලබන ඇස පහළවීම, ඥාණ පහළවීම, ප්‍රඥාව පහළවීම, විද්‍යාව පහළවීම ආලෝකය පහළවීම සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යම් මනුෂ්‍යයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් එම මනුෂ්‍යයා හෝ දෙවියා හෝ බ්‍රහ්මයා හෝ තමන් විසින් පහළකරගත් වෙනස් ආකාරයක ඇස, ඥාණය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය**

**පහළවීමත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයත් කුමක්ද යන්න පෙන්වා දිය යුතුය.**

මවිසින් දේශනා කල බුද්ධ මාර්ගය ගැන යමෙකුට විචිකිච්ඡාව පහළ වන්නේ නම් එයම ඇස පහළවීමට හේතුවෙයි.

ආචාර්ය තිස්ස සේනානායක

2014/11/03

Dr Tissa Senanayake (PhD in Astrophysics)
Senior Lecturer of Mathematics
GISM campus
(**G**raduate **I**nstitute of **S**cience and **M**anagement)
203A, High level road, Colombo 5, Sri Lanka

Home Address: Polwatta, Kobbewala, Gampola
Telephone: home: +94812067044,
Mobile: +94716585871,
Facebook: Tissa Mahima Senanayake
Web site: http://www.enlightenedones.org
E-mail: tissamahima@gmail.com

පහත සඳහන්
http://www.enlightenedones.org
වෙබ්අඩවියට ඇතුල්වී අවශ්‍ය අයට මේ පොතේ විද්‍යුත් පිටපත බාගත හැක.

# කතෘගේ වෙනත් කෘති

1. ධර්ම පහුර හිසතබාගෙන මෝහ ගඟ තරණය කරන්නෝ
2. තථාගත
3. බුද්ධ පහළවිය
4. Magic Visual Aids for Directed Numbers

# පටුන


| | | |
|---|---|---|
| 1 | බුද්ධ පහළවිය | 1 |
| 2 | සත්වයාගේ උපත | 3 |
| 3 | අන්ත දෙක | 7 |
| 4 | චක්ඛුං උදපාදී | 14 |
| 5 | ඤානං උදපාදී | 25 |
| 6 | ප්‍රඥා උදපාදී | 30 |
| 7 | විජ්ජා උදපාදී | 48 |
| 8 | ආලෝකෝ උදපාදී | 53 |
| 9 | සත්සතිය සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය | 62 |

1

# බුද්ධ පහළවිය

බුද්ධ පහළවීමෙන් පසු එම බුද්ධ (තථාගත) මාර්ගය කුමක්ද යන්න වර්ෂ 2013 වෙසක් මාසයේ 'බුද්ධ පහළවිය' නමින් පොතක් ලෙස එළිදැක්වීය. ඒ සමඟම ධම්මචක්ක පවත්වන සූත්‍රය කියවීමට අවස්ථාව ලැබීමෙන් පසු බුද්ධ පහළවීමට හේතු වූ මගේ අත්දැකීමත් ධම්මචක්ක පවත්වන සූත්‍රයේ පෙන්වා ඇති මාර්ගයත් එකක් වන බව මට ප්‍රත්‍යක්‍ෂ විය.

ඉනික්බිති, බුද්ධ වර්ෂ 2558 (ක්‍රි.ව. 2013) ක් වූ ඇසළ පුරපසළොස්වක පොහෝ දිනයේ සිට දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කිරීම ආරම්භ විය. මගේ දේශනා අන්තර්ජාලය හරහා ස්කයිප් (Skype) තාක්‍ෂණය ඔස්සේ ප්‍රචාරය විය. අන්තර්ජාල පහසුකම් නොමැති ශ්‍රාවකයින් උදෙසා දම්සක්පැවතුම් සූත්‍රය සාරාංශ ලෙස පොතක් වශයෙන් එළිදැක්වීමට මෙසේ කටයුතු කෙළෙමි.

බුද්ධ ශූන්‍යය කාලයකට පසු පහළවන සෑම බුදුවරයෙක්ම දම්සක්පැවතුම් සූත්‍රය දේශනාකර 'බුද්ධ' පහළවූ බවට ප්‍රතිඥා දෙයි. පංච උපාදානස්කන්ධයේ විවිධත්වය අනුව සත්වයාගේ උපතත් පැවැත්මත් විවිධවෙයි. අසූහාරදහසක් වූ ධර්මස්කන්ධයක් පැනනැගුනේ සත්වයන්ගේ විවිධත්වය නිසාමය. නමුත් ඉන්ද්‍රියන් සඳහා දේශනා කරන දම්සක්පැවතුම් සූත්‍රය සියළු සත්වයන්ටම පොදුවූ සූත්‍ර දේශනාවකි. දම්සක්පැවතුම් සූත්‍රයේ 'භික්ඛවේ' ලෙස අමතන්නේ ඉන්ද්‍රියන්ටය. සෑම සම්මාසම්බුදුවරයෙක්ම බුද්ධත්වයෙන් පසු දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කරන්නේ එබැවිනි.

'බුද්ධ' පහළවීමෙන් පසුව පමණක් දේශනා කළහැකි දම්සක්පැවතුම් සූත්‍රය ඉතා කෙටියෙන් සඳහන් කරනවා නම්

මෙසේයි: “ද්වෙ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතෙන න සේවිතබ්බා. යොචා’යං කාමේසු කාමසුකල්ලිකානු යෝගෝ හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ. යෝචා’යං අත්තකිලමථානු යෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථ සංහිතෝ. ඒතේ තේ භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවස්සති”

“කචමා ච සා භික්ඛවේ මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවස්සති”

“අයමේවඅරියෝ අට්ඨංගිකෝ මග්ගෝ, සෙයියතිදං: සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා, සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මා සති සම්මා සමාධි.”

මෙසේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය විස්තර කරන තථාගතයන් දුක්ඛ යනු කුමක්ද යන්න පෙන්වා දෙයි. දුක්ඛ ආර්ය සත්‍යය දැකීම සඳහා පහළ වූ ධර්ම මෙසේ පෙන්වා දෙයි.

ඉදං දුක්ඛං අරියසච්චංති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදී ඤාණං උදපාදී ප්‍රඥා උදපාදී විජ්ජා උදපාදී ආලෝකෝ උදපාදී.

දම්සක් පැවතුම් දේශනාව අතර මැදදී කොණ්ඩඤ්ඤ තවුසාට ඇස පහළවිය. එය සූත්‍රයේ දක්වා ඇත්තේ මෙසේයි: ආයුෂ්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදී යංකිංචි සමුදය ධම්මං සබ්බංතං නිරෝධ ධම්මංති.

මවිසින් පහළකරගත් ඇස ඤානය ප්‍රඥාව විද්‍යාව සහ ආලෝකය සවිස්තරාත්මකව පෙන්වා දෙමි. එසේම චතුරාර්ය සත්‍යයද ආර්ය අෂ්ඨාංගික මාර්ගයද පෙන්වා දෙමි.

2

# සත්ත්වයාගේ උපත

යම් දවසක බුද්ධ පහළවී මරණයෙන් නිදහස් වන්නේ උත්පත්තිය ලැබූ සත්ත්වයෙක් බැවින් 'උපත' ගැන හා 'සත්ත්වයා' ගැන මනා අවබෝධයක් තිබීම අනවශ්‍ය දෙයක් වන්නේ නැත. තථාගත දේශනාවට අනුව උපත හෙවත් ජාතිය ඇතිවන්නේ රූප වේදනා සඥා සංඛාර විඥාන නම් වූ ස්කන්ධයන්ගේ පහළවීමත්, ඇස කණ නාසය දිව ශරීරය නම් වූ ආයතනවල ප්‍රතිලාභයත් නිසයි (ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චතාවුසො ජාති).

මව් කුසෙන් බිහි වූ පමණින්ම ස්කන්ධයන්ගේ පහළවීම සහ ආයතනවල ප්‍රතිලාභය ඇතිවන්නේ නැත. නමුත් කාලයාගේ ඇවෑමෙන් ගුරු දෙමව්පිය වැඩිහිටියන් ආදීන් නිසා (ඉන්ද්‍රියයන් මගින්) ඇස කණ නාසය දිව ශරීරය සහ මන නම් වූ ආයතන ඇතිවෙයි (ආයතන යනු ඉන්ද්‍රිය නොවෙයි). ඒ සමගම රූප වේදනා සඥා සංඛාර විඥාන නම්වූ පංචස්කන්ධයේ උපාදානය නිසා එම ස්කන්ධයන්ගේ පහළවීම ඇතිවෙයි. එය සත්ත්වයාගේ ජාතිය හෙවත් උත්පත්තියයි.

ස්කන්ධයන්ගේ පහළවීමත්, ආයතනවල ප්‍රතිලාභයත් හේතුකොටගෙන සත්ත්වයාගේ උපතත් මරණයත් ඇතිවෙයි. උපත

සිදුවන ආකාර හතරකි. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ සහ ඕපපාතික යනු එම උත්පත්ති හතරයි. වේදනා, සඥා, සංඛාර, විඥාන යන නාමස්කන්ධ හතර මූලික කරගෙන සත්ත්වයාගේ හතර ආකාරයක උපත මේ බඹයක් පමණ වූ ශරීරය තුලම සිදුවෙයි. අණ්ඩජ හෙවත් බිජුවටයෙන් සිදුවන උපත නම් විඥානය තුල සිදුවන උපතයි (විඥානය තුල ද්විත්වයෙන් යුත් ධර්මයක් නැත). ජලාබුජ හෙවත් ගර්භාෂය නම් වේදනාවයි. සත්ත්වයන් අතරින් මනුෂ්‍යයා ගර්භාෂයේ හෙවත් වේදනාවේ උපත ලබයි. සංසේදජ නමින් හඳුන්වන්නේ සංස්ඛාර තුල සිදුවන උපතයි. සංස්ඛාර ධර්ම නමැති කොළරොඩු (කුණුගොඩ) තුල උපදින සත්ත්වයෝ මේ ගණයට වැටෙති. ඕපපාතික උපත යනු සංඥාව තුල ඉපදීමයි. සඥාව සත්ත්වයාගේ මුළාව නිසා පහළවූ ස්කන්ධයක් නොව මහාභූතයන්ට පොදුවූ විශ්ව ධර්මයක් බැවින් සඥාව තුල ඕපපාතිකව උපදින සත්ත්වයා ඕනෑම තැනක පහළවිය හැක. බ්‍රහ්මයෝ ඕපපාතිකව උපදිති.

***සත්ත්වයා උපත ලබන වේදනා, සඥා, සංඛාර, විඥාන නම් වූ නාමධර්ම හතරම පහළවන්නේ බඹයක් පමණ වූ ශරීරය තුලම බැවින් දෙවියන්, බඹුන්, තිරිසන්, නිරිසතුන් ආදී සියලුම සත්ත්වයන් මේ බඹයක් පමණ වූ ශරීරය තුලම පහළවෙති. මම ලෝකයත් ලෝක නිරෝධයත් මේ බඹයක් පමණ වූ ශරීරය තුළ පනවමි.***

උප්පත්තිය අනුව සත්ත්වයෝ කුල හතරකට බෙදෙති. ඒවා ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය සහ ක්‍ෂුද්‍ර නම්. මෙම කුල හතරට අයත් සත්ත්වයෝද වේදනා සඥා සංඛාර විඥාන නම්වූ නාම ස්කන්ධ මූලික කොටගෙන උපදිති. ක්ෂත්‍රියෝ වේදනා ස්කන්ධයේත්, හොඳ නරක කියාදෙන බ්‍රාහ්මණයෝ සංස්ඛාර තුලත් උපත ලබන බව මම කියමි. වෛශ්‍යාවන් වෙළෙන්දන් වැනි වෛශ්‍ය කුලයේ අයගේත් ක්ෂුද්‍රයන්ගේත් උපත සිදුවන ආකාරය ගැන යම් ගවේෂණයක් කිරීමට ඔබට භාරකරමි. මෙම කුල අතුරෙන් උසස්ම කුලය ක්ෂත්‍රිය වෙයි. තථාගත වචනයට අනුව කුල හතරේම අයට නිවන් දැකීමට

හැකියාව ඇත. මේ සෑම උපතක්ම (ජාති) උපාදානයෙන් පසුව සිදුවෙයි (උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති).

මෙම උප්පත්ති හතරෙන් වේදනාවේ උපත ලබන මනුෂ්‍යයා තුල පැවැත්මක් (ජීවත්වීමක්) ඇත. මේ පැවැත්ම මනෝසංචේතනා නිසා ඇතිවෙයි. සත්ත්වයා ජීවනෝපාය ගෙනයන විට තමන් තුල ක්‍රියාත්මකවන කර්මාන්තය (කම්මන්ත) මනෝසංචේතනා නමැති ආහාරයෙන් පෝෂණය වෙයි. තම කර්මාන්තය ගෙනයන සත්ත්වයා චින්තනයට අසුවූ පසු පැවැත්ම සිදුවන අතරතුර ජරාවට සහ ව්‍යාධියට ද පත්වී අවසානයේ රූපස්කන්ධය තුල මරණයට පත්වෙයි. මේ ආකාරයට සත්ත්වයා තුල ජාති ජරා ව්‍යාධි සහ මරණ ඇතිවෙයි. උපදින තැන ජීවත් නොවන බැවින් පෘතග්ජන සත්ත්වයාට නාම ස්කන්ධයන්හි පැවැත්ම චින්තනය හරහා දැනගත නොහැක. එසේම රූපස්කන්ධයේ මරණය සිදුවන බැවින් බුද්ධ පහළවනතෙක් කිසිම සත්ත්වයෙකුට ඉන්ද්‍රියයන්ගෙන් 'රූපය' දැකිය නොහැකිය. සත්ත්වයා ඇස ඇතුළු ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කරගන්නේ රූපය හෝ නාමය නොව නාමරූප වල සංකලනයකි.

වර්ණ, ගන්ධ, ශබ්ද, රස, ස්පර්ශ යනුවෙන් රූප පසකි. ඇසට ඇතුල්වන්නේ වර්ණයක් නොව ආලෝක කිරණ කදම්භයකි. මේ ආලෝක කිරණ (ආලෝක සඥා) මගින් මොළය තුල දෘශ්‍ය ආලෝකයේ සංඛ්‍යාතයට අනුරූප වූ වර්ණය සාදයි. එය වර්ණ රූපයයි. වර්ණ රූපය සඥාව විසින් සාදයි. භාහිර වර්ණ රූපයක් නොමැති වුවත් වර්ණ රූපයට හේතුවන 'රූප සඥාව' විශ්ව ධර්මයකි.

ඔබ ඉදිරියෙන් පුටුවක් ඇතැයි සිතන්න. මේ පුටුවට කකුල්, ඇඳි, බාහු ඇතැයි ඔබ කියයි. ඔබ සිතන්නේ මේ පුටුවේ ඇති කකුල්, ඇඳි, බාහු ආදිය ඇසෙන් දකිනවා කියායි. ඔබ සිතන්නේ 'පුටුව' රූපය ලෙසයි. නමුත් ඇසෙන් දකින 'පුටුව' යනු රූපය නොව නාමරූප වල සංකලනයකි. ඇසෙන් ග්‍රහණය කරගත් විවිධ සංඛ්‍යාත

වලින් යුත් සඤ්ඤාවන්ගෙන් සෑදෙන වර්ණ රූපයත්, කණෙන් ග්‍රහණය කරගත් ශබ්ද සඤ්ඤාවෙන් සෑදෙන ශබ්ද රූපයත්, මූලික කරගෙන ‘පුටුව’ නිර්මාණය වෙයි.

සඤ්ඤාව මිරිඟුව ඇතිකරයි. මුවා මේ මිරිඟුවට ජලය යයි රැවටී මිරිඟුව පසුපස දුවයි. වේදනාව යනු මේ මිරිඟුව නමැති ජලය මත සෑදෙන (දිය) බුබුළකි. දිය බුබුළ අවකාශයෙන් කොටසක් වටකරගනියි. අවකාශය නම් ‘මන’යි. මිරිඟුව නමැති ජලය තුළම ‘රූපය’ නමැති පෙනපිඬු සෑදෙයි. පෙනපිඬු සෑදෙන්නේ ජලය කැලතීමෙනි. පිරිසිදු ජලයේ පෙනපිඬු නොසෑදෙන්නාක් මෙන් කෙලෙස්වලින් අපිරිසිදු නොවී ‘රූපය’ නොසෑදෙයි. පෙනපිඬු (රූපය) නිර්මාණය වන්නේ දියබුබුළු (වේදනා) රාශියක් එකට එකතු වීමෙනි. එලෙස වේදනා ස්කන්ධයේත් රූපස්කන්ධයේත් ස්වභාවය දැකිය යුතුය. සංස්කාර යනු හරයක් නැති කෙසෙල් කඳකි. විඤ්ඤානය මායාවකි. මේ පංච උපාදානස්කන්ධයේ ස්වභාවයයි. මෙසේ පංචස්කන්ධය උපාදානය කරගත් සත්ත්වයා ජාති, ජරා, ව්‍යාධි සහ මරණයට යටත්වෙයි.

3

# අන්තදෙක

ජාති ජරා ව්‍යාධි සහ මරණයට අසුවූ සත්ත්වයන් අතුරෙන් මනුෂ්‍යයා පමණක් යම් දවසක 'දුක්ඛ ආර්ය සත්‍යය' දැක එයින් නිදහස් වීමේ ආර්ය මාර්ගයට වැටෙයි. ගුරුවරයෙක් කරාගොස් යම් ධර්මයක් පිළිගෙන ප්‍රගුණකරමින් යන සත්ත්වයා සංස්ඛාර තුල උපත ලබන්නෙකි. කසළගොඩේ (සංසේදජ) උපදින මේ සත්ත්වයෝ ධර්මය තුලින් තාවකාලික සැනසීමක් ලබන්නෝ වෙති. ඔවුහු තමන් ලබාගත් ඒ සැනසීම තුල නතරවෙති. ධර්මයෙන් සැනසීම සොයන සත්ත්වයා යම් ධර්මයක අනුගාමිකයෙක් වී එම ධර්මය පිළිගෙන ඒ අනුව හැසිරෙයි. ධර්මයට අනුව හැසිරෙන අනුගාමිකයා අන්ත දෙකෙන් එකකට වැටෙයි. ධම්මචක්ක පවත්වන සූත්‍රයේ මේ අන්ත හඳුන්වන්නේ කාමසුකල්ලිකානු යෝගය හා අත්තකිලමථානු යෝගය ලෙසයි.

සත්ත්වයා ආහාරයෙන් යැපෙයි. කබලින්කාහාර, ඵස්සය, මනෝසංචේතනා සහ විඤ්ඤාන යනුවෙන් ආහාර හතරකි. මෙම ආහාරයෙන් හතරෙන් එකක් පරිභෝජනයට යොදාගනියි. තවත් හතරෙන් එකක් දන්දෙයි. තුන්වන හතරෙන් එක තම කර්මාන්තයේ දියුණුව සඳහා යොදවයි. අවසාන හතරෙන් එක මතු ප්‍රයෝජනය සඳහා තැන්පත් කරයි. කබලින්කාහාර ශරීරයේ පැවැත්ම උදෙසා පරිභෝජනය කරන හතරෙන් එකයි. උපයන ආහාරයෙන් දන්දියයුතු හතරෙන් එක ඵස්සයයි. ඵස්සය වූ තැනම එය අවසන් වෙයි. දන්දීම යනු එයයි. මනෝසංචේතනා තම කර්මාන්තය (ජීවිතය) ගෙනයාම සඳහා යොදවන තුන්වන හතරෙන් එකයි. ජීවිත කර්මාන්තය

පවතින්නේ මනෝසංචේතනා නිසයි. උපයන ධනයෙන් මතු ප්‍රයෝජනය සඳහා තැන්පත් කරන්නේ විඥාන ආහාරයයි.

ආහාර නිසා පංච උපාදානස්කන්ධයේ පහළ වීමත්, එමගින් කෙලෙස් පර්වතය ගොඩනැගීමත් නිසා විමර්ශන බුද්ධිය ඇතුළුව මොළයේ වර්ධනය සිදුවෙයි. එසේම සංයෝජන වලින් බැඳෙයි. මෙම සංයෝජන අතුරින් සක්කායදෘෂ්ඨිය ප්‍රධාන වෙයි. සක්කායදෘෂ්ඨියෙන් ආරම්භ වන සංයෝජනයන්ගෙන් බැඳීම සත්ත්වයා පරිණතභාවයට පත්වන මාර්ගයයි. එය මනුෂ්‍යයෙක් වන මාර්ගයයි. බුද්ධ පහළ කරගන්නේ එවැනි පරිනත වූ බුද්ධිමත් මනුෂ්‍යයෙක් පමණි.

අත්තකිලමතානුයෝගයෙදී ඇස, කණ, නාසය, දිව, ශරීරය නම් වූ පංච ඉන්ද්‍රියයන් පිනවීම සිදුනොවන බැවින් කබලිංකාර, ඵස්සය, මනෝසංචේතනා සහ විඥාන නම්වූ ආහාර නොලැබී යයි. ඵස්සය නොමැති කල්හි වේදනාව මතුනොවෙයි (ඵස්ස පච්චයා වේදනා). එබැවින් යෝගාවචරයා අත්තකිලමතානුයෝගය අනුගමනය කරනවිට ඉන්ද්‍රියයන් මගින් උපාදානස්කන්ධය සේවනය (පෝෂණය) වීම සිදුනොවෙයි. එමගින් සංස්ඛාර, වේදනා සහ විඥාන යන නාම ස්කන්ධ යටපත් වී සඥා ස්කන්ධය පමණක් මතුවෙයි. එහෙයින් අත්තකිලමතානුයෝගයේ (දුෂ්කර ක්‍රියාවේ) අවසාන ඵලය ලෙස සත්ත්වයා බ්‍රහ්ම ලෝක වල ඕපපාතිකව උපත ලබයි. මේ යෝගය අනුගමනය කරන යෝගාවචරයෝ එය කුසල් වැඩීමක් ලෙස තේරුම් කරගනිති. නමුත් නැවත මනුෂ්‍ය ලෝකයේ උපදින තෙක් සඥාවේ උපන් ඕපපාතික සත්ත්වයාට බුදුන් දැකිය නොහැකිය. සිදුහත් තවුසාත් අත්තකිලමතානු යෝගය අනුගමනය කළේය. දැනුදු බොහෝ යෝගාවචරයන්ට අත්තකිලමතානුයෝගය තම විමුක්තිය උදෙසා අනුගමනය කරන මාර්ගයකි. මේ මාර්ගය තුල වේදනා ස්කන්ධ යටපත් වීම හේතුකොටගෙන යෝගාවචරයාට යම් තාවකාලික සැනසීමක් ලැබෙයි.

කාමසුඛල්ලිකානුයෝගය විමුක්ති මාර්ගය ලෙස පිළිගත් යෝගාවචරයෝ ඉන්ද්‍රිය පිනවීම තුලින් විමුක්තිය සොයායති. ගෞතම බුදුන් වහන්සේගේ කාලයේ පමණක් නොව දැනුදු මේ මාර්ගය අනුගමනය කරන සත්ත්වයෝ සිටිති. ඔවුහු ගලායන ගඟක් දෙස බලා සිටිති. නැතිනම් ගසක් දෙස බලා සිටිමින් එහි ඇති නිසලතාව අත්දකිති. එතනදී යෝගාවචරයෝ 'නාමය' දවා රූපය පමණක් ප්‍රගුණ කරති. එවිට නාමරූප වල ගොඩනැගීමක් සිදුනොවෙයි. එබැවින් සලායතන වල ප්‍රතිලාභය සිදුනොවන අතර (නාමරූප පච්චයා සලායතන) ඒ හේතුවෙන් ඵස්සය ක්‍රියාත්මක නොවෙයි (සලායතන පච්චයා ඵස්ස). **පටිච්චසමුප්පාදයේ එන 'ඵස්සය' යනු ඉන්ද්‍රිය ගැටීම නොවෙයි.** ඵස්සය සිදුනොවන විට මනෝ සංචේතනා ඇතිවීමට ඇති ඉඩකඩ ඇහිරී යයි. ඵස්සයෙන් තොරව නොකඩවා ඇසෙන් දකිනවිට හෝ කණෙන් අසනවිට තමන් තුල යම් දුකක් හෝ කණගාටුවක් හෝ තිබුනි නම් ඒවාද යටපත් වී යයි. දුක හෝ කණගාටුව වැනි හැඟීම් මනෝසංචේතනා නිසා ඇතිවන්නෙකි. මනෝ සංචේතනා ඇතිනොවන විට වේදනාව මතුනොවනවා පමණක් නොව විඥාණය පෝෂණය වීමද ඇනහිටියි. සලායතන නිසා ඇතිවන ඵස්සය ආහාරයක් බව අපි දනිමු. 'ඵස්ස පච්චයා වේදනා' යයි පටිච්චසමුප්පාදයේ සඳහන් වුවත් **ඵස්ස ආහාරය දන්දෙන තුරු ඵස්සය නිසා වේදනාව ඇති නොවෙයි.** එයට හේතුව මනෝසංචේතනා නොමැති තැන වේදනාව ක්‍රියාත්මක නොවීමයි. ගඟක් දෙස හෝ ගසක් දෙස නොකඩවා බලා සිටින විට සුවදායක බවක් මනසට ඇතිවන බැවින් බොහෝ දෙනෙකුට මෙය යෝගී ක්‍රමයක් ලෙස පිළිගත් මානසික ප්‍රතිකාරකයකි. දිගින්දිගටම සංගීතයට කණ යොමා සිටීමෙන්ද මේ ක්‍රියාවලියම සිදුවෙයි. මෙය කාමසුකල්ලිකානු යෝගයේ තවත් අවස්ථාවකි. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙස පියා (නාමය) මැරීමේ ආනන්තරිය පාපකර්මයට අසුවී අවීචි මහා නරකයේ උපත ලැබිය හැක. යෝගාවචරයා සඥාව තුල ඕපපාතිකව උත්පත්තිය ලබයි.

භාහිය දාරුචිරිය නමැති දර පතුරු ඇඳගත් අයෙකුට බුදුන් වහන්සේ දේශනා කල ධර්මයක් ඇත. ‘දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති’ ආදී වශයෙන් විස්තර වන ‘දැක්කා දැක්කා පමණයි, ඇහුවා ඇහුවා පමණයි’ යනු බොහෝ සත්ත්වයන් විසින් පුරුදු පුහුණු කරන යෝගධර්මයකි (කරුණාකර 37 වන පිටුව බලන්න). එය දැක්ක දේ, ඇහුව දේ, රස ගත් දේ, එතන එතනම විනාශ වීමට සලස්වා මනෝ සංචේතනා ඇතිවීම වළක්වාලන යෝග ක්‍රමයකි. දැක්ක දේ ඇසූ දේ රස බැලූ දේ ගැන මනොසංචේතනා ඉපදීමට ඉඩප්‍රස්ථා ඇතිවීමට ඉඩ නොදෙන බැවින් මේ යෝගයෙන්ද උපාදාන ස්කන්ධය සේවනය වීම තවදුරටත් සිදුනොවෙයි. බුද්ධ වචනය හේතුඵල ධර්මයක් ලෙස පිළිගෙන ඒ අනුව ක්‍රියාත්මක වීමද කාමසුකල්ලිකානු යෝගයේම තවත් අවස්ථාවකි. සඥා නිරෝධය සඳහා ධර්මය පුහුණු කරන්නෝද මේ අතරවෙති. ඔවුහු පංච උපාදානස්කන්ධය සේවනය වීම වැළැක්වීමට ප්‍රවෘති පත්‍ර බැලීම් ආදී තොරතුරු රැස්කිරීම් වලින් පවා ඈත්වන්නට තම අනුගාමිකයින්ට උපදෙස් දෙති. තවත් සමහර ගුරුවරු පංච උපාදානස්කන්ධයම දුක යයි පවසමින් පංච උපාදානස්කන්ධය නැතිකර දැමීමට වීර්යය දරති.

වර්තමානයේ බොහෝ දෙනෙකු කරගෙන යනු ලබන තවත් යෝග ක්‍රමයක් නම් මනසින් සියල්ල අතහැරීමයි. ඔවුහු මනොසංචේතනා අතහැර දමති. එමගින් ඔවුහු විවිධ සත්ත්ව තලවල උපත ලබන අතර එම උපත නිසා ඇතිවන සැනසීමට නිවන යයි රැවටෙති. සමහර යෝගාවචරයෝ සතර සතිපට්ඨානය පුහුණු කරති, ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩති. සත්ත්වයෝ ඇස පහළවන තෙක් මෙසේ විවිධ ධර්ම මාර්ග අනුගමනය කරති. බුදුවරයෙක් මේ කිසිම මාර්ගයක හරි වැරැද්දක් දකින්නේ නැත.

ධර්මය තුලින් විමුක්තිය සොයන කිසිම සත්ත්වයෙක් තමන් අන්තයකට අසුවී ඇති බව නොදනියි, ධර්මය නමැති උගුලට අසුවී ඇති බව නොදනියි. තමන් විසින් අවබෝධකරගත් යම් විමුක්ති මාර්ගයක යම් යෝගාවචරයෙක් ගමන්කරන්නේ නම්, එම යෝගාවචරයා අන්ත දෙකෙන් එකකට අසුවී ඇත. උදාහරණයක්

ලෙස, පෘතග්ජන සත්ත්වයා කෙලෙස් නිසා දැවෙන බව දන්නා යම් යෝගාවචරයෙක් නිවන යනු දැවීමෙන් තොර තැනක් යයි නිගමනය කර නොදැවෙන තැනක් සොයායන්නේ නම් ඔහු පැහැදිලිවම අන්තයකට අසුවී ඇත. දැවීම එක් අන්තයකි, නොදැවීම අනෙක් අන්තයයි. මේ යෝගාවචරයා කරන්නේ දැවීමට හේතුවන පංච උපාදානස්කන්ධය නැතිකර නොදැවෙන තැනක් සොයා යාමයි.

වැඩි කාලයක් වාදන භාණ්ඩයකින් පැනනගින ශබ්දයට කණ යොමාගෙන සිටින විට ද පංච උපාදාන ස්කන්ධය සේවනය වීම ඇනහිටියි. මෙසේ ගායනයට සහ වාදනයට වැඩි කාලයක් යොදවන විට සත්ත්වයා නොමේරු පුද්ගලයෙක් බවට පත්වෙයි. තමන්ගේ දරුවන් 'ලිට්ල්ස්ටාර්ලා' කිරීමට වලිකන දෙමව්පියන් ඒ ගැන දෙවරක් සිතා බැලිය යුතුව ඇත. මෙ 'ලිට්ල්ස්ටාර්ලා' ඕපපාතිකව සංඥාවේ පමණක් උපත ලබයි. වේදනා උපාදානස්කන්ධය යටපත් වී ඇති බැවින් ආදරය කරුණාව ආදී ගුණධර්ම මේ අයට වර්ධනය නොවෙයි. ඔවුන්ට මනුෂ්‍ය ලෝකයේ උපතක් නැත.

මෙම අන්ත දෙකම හේතුකොටගෙන ඉන්ද්‍රියයන් මගින් පංච උපාදානස්කන්ධය සේවනය නොවන බව පැහැදිලිය. මේ අන්ත දෙකෙන් යුත් යෝග ධර්ම නිසා මනුෂ්‍යයෙකුගේ උපතට හේතුවන වේදනා ස්කන්ධය යටපත් වෙයි. එදා මෙදා තුර පුහුදුන් සත්ත්වයා සත්‍යය සොයා යාමට අනුගමනය කල මෙම මාර්ග දෙකෙහි ප්‍රතිඵලය එයයි. බෞද්ධ අනුගාමිකයන් මේ අන්ත දෙකට වැටෙන්නේ බුද්ධ වචනය පිළිගෙන ක්‍රියාත්මක කිරීමට යාමෙනි. බුද්ධ වචනය මහායාන, ථෙරවාද ලෙස බෙදී ගියේ ද අන්ත දෙකට වැටීමෙනි.

එක් අතකින් පංච උපාදානස්කන්ධය යනු කෙලෙස් පර්වතයකි. ඉන්ද්‍රියයන් මගින් පංච උපාදානස්කන්ධය සේවනය වීම තුල මේ කෙලෙස් වර්ධනය වෙයි. බොහෝවිට අන්ත දෙකකින් යුත් යෝග අනුගමනය නිසා පංච උපාදානස්කන්ධය තවදුරටත් සේවනය

නොවීමත් සමග අනුශය දක්වා කෙලෙස් යටපත් වීමත් සිදුවෙයි. මේ යෝගාවචරයින්ගේ අරමුණද කෙලෙසුන් නසා මාර්ගඵල ලැබීමයි. 'කෙලෙසුන් නසා මාර්ගඵල ලැබීම' තථාගත මාර්ගයද?

ත්‍රිපිටකධාරීන්ගේ ධර්මයට අනුව අත්තකිලමථානු යෝගය සහ කාමසුඛල්ලිකානු යෝගය නිවන සොයන්නෙකු විසින් අත්හැරිය යුතු මාර්ග දෙකකි. එසේ දේශනා කලත් තමන් නොදැනුවත්වම ඒ අන්ත දෙකෙන් එකකට ඔවුහු වැටෙති. ලොවපහළවන කිසිම බුදුවරයෙකු මේ අන්ත අතහරින්න යයි දේශනා නොකරන බව මට ප්‍රත්‍යක්ෂ වූ බැවින් ත්‍රිපිටකයේ මෙම ධර්මය කෙසේ සඳහන් වී ඇත්දැයි විමර්ශනය කිරීමට මට අවශ්‍ය විය.

කාමසුකල්ලිකානු යෝගයත් අත්තකිලමථානු යෝගයත් සත්‍යය සොයන්නෙකු විසින් සේවනය නොකළයුතු මාර්ග දෙකක් ලෙස දම්සක්පැවතුම් සූත්‍රයේ සිංහල අනුවාදයේ සඳහන් වුවත් පාලි පිටකය මනාලෙස පරිශීලනයෙන් බුදු කෙනෙක් දේශනා කරන්නේ කුමක්ද යන්න පැහැදිලි වෙයි. ඊට අදාළ පාලි පාඨය මෙසේයි: "ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතෙන න සේවිතබ්බා". ගෞතම බුදුන් වහන්සේ කොන්ඩඤ්ඤ ,භද්දිය, වප්ප, මහානාම සහ අස්සජි නම්වූ තවුසන් ඉදිරියේ දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කලත් සියලුම බුදුවරු කරන්නා සේ උන්වහන්සේ ඇමතුවේ ඉන්ද්‍රියයන්ටය. 'භික්ඛවේ' යනු භික්ෂාවෙන් ජීවත් වන ඉන්ද්‍රියයන් පහයි. ඉන්ද්‍රියයන් හැරුණ කල මේ බඹයක් පමණ ශරීරය තුල පර්වතයක් ඇත. එය නම් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාන නම්වූ පංච උපාදානස්කන්ධයයි. මෙම පර්වතය ජයගන්නා පබ්බජිත නම් වෙයි. ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්වයෙන් පංච උපාදානස්කන්ධය පෝෂණය වෙයි, නැතහොත් සේවනය වෙයි. ළදරුවා වැඩිහිටියෙක් වනවිට ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය නිසා පංචස්කන්ධය උපාදානය වී සත්ත්වයා සංයෝජනයන්ගෙන් බැඳෙයි. පටිච්චසමුප්පාදය තුල පෙන්වන්නේත් මේ ධර්මයයි. 'න සේවිතබ්බා' යන්න 'සේවනය නොවේ' යන

තේරුම දෙයි. මුළු පාලි පාඨයම එකට ගත්විට එහි තේරුම "(කාමසුඛල්ලිකානුයෝගය සහ අත්තකිලමථානුයෝගය නම්වූ) **මේ අන්ත අනුගමනය නිසා ඉන්ද්‍රියයන් මගින් පංච උපාදානස්කන්ධය සේවනය නොවීම නිසා පර්වතය ජයගැනීම සිදුනොවේ**"ය යන්නයි.

2013 වර්ෂයේ ඇසල මහා පුරපසළොස්වක පොහෝ දින සිට අද දක්වා මේ අන්ත දෙක අනුගමනය කිරීම නිසා පංච උපාදානස්කන්ධය සේවනය නොවන බවත් එමගින් නිවන් දැකීමේ මාර්ගය අවහිර වන බවත් මගේ දේශනා මගින් පෙන්වා දී ඇත. කාමසුඛල්ලිකානුයෝගය "හීනයි, ග්‍රාම්‍යයයි, පෘතග්ජනිකයි, අනාර්යයි" යනුවෙන් ද අත්තකිලමතානුයෝගය දුකයි, අනාර්යයි යනුවෙන් ද දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ සඳහන් වුවත් තමාටත් අනුන්ටත් වැඩක් නැති මේ අන්ත දෙකෙන් යුත් යම් ධර්මයක් අනුගමනය කරන්නාටද යම් දවසක ඇස පහළවෙයි. ඔවුන් අනුගමනය කරන යෝගයම ඔවුන්ගේ ඇස පහළවීමට හේතුවෙයි. ඇස පහළවීමෙන් පසු කිසිම යෝග ධර්මයක් අනුගමනය කරන්නේ නැත.

ඉන්ද්‍රියයන් මගින් පංච උපාදානස්කන්ධය සේවනය වීමත්, කෙලෙස් මතුවීමත් නිවන් දකින තෙක්ම සිදුවිය යුතු දෙයකි. ඇස පහළ වීමට පමණක් නොව ප්‍රඥාව පහළ වී විද්‍යාව පහළවීමට කෙලෙස් සහිත පංච උපාදානස්කන්ධය මනා කාර්යයක් ඉටුකරයි. නමුත් සත්‍යය සොයායන ගමනේදී මුළාව නිසා නිවන් මාර්ගය යයි රැවටී සත්ත්වයා යම් අන්තයකට වැටෙයි.

විමුක්තිය සඳහා යම් ධර්මයක් ප්‍රගුණ කරන අනුගාමිකයා සංස්කාර ලෝකයේ උපත ලබයි. සංස්කාර ලෝකයේ මනුෂ්‍යයෝ නූපදියි. සත්ත්වයා මනුෂ්‍යයෙක් වනතෙක් බුද්ධ පහළවන්නේ ද නැත. එබැවින් බුදුන් දකින්නට නම් මෙතෙක් ප්‍රගුණ කළාවූ ධර්මයන් නිරෝධ විය යුතුය.

**4**

# ඇස පහළවීම (චක්ඛුං උදපාදී)

පංච ඉන්ද්‍රියයන් හරහා ගොඩනගාගත් දැනුමක් ප්‍රයෝජනයට ගනිමින් සත්ත්වයා ජීවත් වෙයි. මේ දැනුම දරාගෙන උසුලාගෙන සිටින්නක් නොවන නමුත් අවශ්‍ය විටකදී ප්‍රයෝජනයට ගනියි. නමුත් ධර්මය (ධම්මං) යනු සත්ත්වයා විසින් පිළිගත්විට දරාගෙන උසුලාගෙන සිටින්නාවූ ද නිරෝධ වීමෙන් පසුව තමන්ගේ විමුක්තිය සඳහා යොදාගන්නාවූ ද මෙවලමකි. සත්ත්වයා යම් පමණකට පිළිගත් ධර්මයක් තුල ජීවත්වෙයි.

පරිපූර්ණ මනුෂ්‍යයා සංයෝජන දහයකින් බැඳී පවතියි. සක්කායදෘෂ්ඨි, විචිකිච්ඡා, ශීලබ්බතපරාමාස, කාමරාග, පටිඝය, රූපරාග, අරූපරාග, මාන, උද්දච්ඡ සහ අවිද්‍යා ලෙස හඳුන්වන මෙම සංයෝජන දහයෙන් පළමු පහ චින්තනය හරහා අපි නිර්මාණය කරගන්නෙමු. දෙවන සංයෝජන පහ චින්තනයට පරිබාහිරව ඇතිවන නමුත් චින්තනය නිසා මතුවෙයි. බඹයක් පමණ වූ ශරීරයකින් යුත් මව්කුසින් උපත ලැබූ සත්ත්වයා මනුෂ්‍යයෙක් ලෙස සාමාන්‍ය ව්‍යවහාරයේ හැඳින්වුවද තථාගත වචනයට අනුව මේ බඹයක් පමණ වූ ශරීරය තුල සැමවිටම මනුෂ්‍යයෙක් උපත නොලබයි. මේ බඹයක් පමණ වූ ශරීරය තුල උපදින සැම සත්ත්වයෙක්ම සංයෝජන දහයෙන්ම බැඳී නැත. මනුෂ්‍යයෙක් වන්නේ සත්ත්වයා මෙම සංයෝජන දහයම සම්පූර්ණ වී ඇත්නම් පමණි.

මනුෂ්‍යයෙක් වීම දුර්ලභ කරුණක් වන අතර එයට කරුණු තුනක් සැපිරිය යුතු යයි ත්‍රිපිටකයේ ද සඳහන් වෙයි. මෙම කරුණු තුන නම් **විචිකිච්ඡාව, රාගය සහ අපේක්ෂාවයි**. මේ කරුණු තුන

සපිරෙන්නට නම් සත්ත්වයා තුල සංයෝජන දහයම තිබිය යුතුය. විචිකිච්ඡාවෙන් තොරව යම් පිළිගත් ධර්මයක් දේශනා කරන ගුරුවරයෙක් හෝ ගුරුවරයෙකුගේ එවැනි ධර්මයක් පිළිගත් අනුගාමිකයෙක් හෝ මනුෂායෙකු වන්නේ නැත. ලෝකය තුල විවිධ සත්ත්ව තල තිස්එකක් ඇත. විචිකිච්ඡාව හෝ රාගය හෝ අපේක්ෂාවෙන් තොර අනුගාමිකයා මනුෂායකු නොවී අන් ඕනෑම සත්ත්ව තලයක උපත ලැබිය හැක.

මව්කුසින් බිහිවන විට ළදරුවා ජාතිය හෙවත් උපතට අසුවී නැත. එතන සක්කායදෘෂ්ඨිය ද නැත. දෙමව්පිය වැඩිහිටියන් සමග හැදෙන ළදරුවා ළමයෙකු වී යම් පමණකට මොළය වර්ධනය වීමෙන් පසු සක්කායදෘෂ්ඨිය ඇතිවෙන බව පැහැදිලිය. නමුත් කවදා මේ සක්කායදෘෂ්ඨිය ඇතිවන්නේද යන්න නිශ්චිතවම කිව නොහැකිය. සමහරවිට ජිවිත කාලය තුලම සක්කායදෘෂ්ඨිය ඇති නොවී මරණයට පත්වන්නෝද මේ බඹයක් පමණ ශරීරයක් දරාගෙන සිටිය හැක. සක්කායදෘෂ්ඨිය නැතිකරගෙන විමුක්තිය සොයන්නෝද ඒ අතර වෙති. සක්කායදෘෂ්ඨියෙන් පසු සත්ත්වයා තුල පහළ වන්නාවූ දෙවන සංයෝජනය විචිකිච්ඡාවයි. පරම්පරාවෙන් තමන්ට උරුමවූ ආගම මරණය තෙක් පිළිගෙන ප්‍රගුණ කරන සත්වයෝ විචිකිච්ඡාව නම් වූ සංයෝජනය පහළ නොවී ම සම්මුති මරණයට පත්වෙති.

සැකය යනු විචිකිච්ඡාව නොවෙයි. ගුරුවරයෙක් යටතේ ධර්මය ප්‍රගුණකරන විට යම් ධර්මතාවයක් පිළිබඳ සැකයක් ඇතිවෙයි. **එය තමන් ප්‍රගුණකරන ධර්මය තුල ඇතිවන සැකයකි.** මේ සැකය ගුරුවරයාත් සමග සාකච්චා කිරීමෙන් විසඳා ගනියි. සමහර විට ගුරුවරයාගේ පිළිතුර කෙරෙහි අනුගාමිකයා සෑහීමකට පත්නොවිය හැක. එවිට අනුගාමිකයා කරන්නේ වෙනත් ගුරුවරයෙක් සොයායාමයි. නැතිනම් අනුගාමිකයා මෙතෙක් ඉගෙනගත් ධර්මයට අනුව (මෙය තමා තුලින් බැලීම ලෙස බොහෝ දෙනෙකු හඳුන්වන ක්‍රියාදාමයකි) නිවැරදි පිළිතුරක් තමන් විසින්ම සොයාගනියි. එවිට මෙතෙක් ධර්මය කෙරෙහි තිබූ සැකය පහව යයි. මේ සැකය පහවයාම තුල එම ධර්මය ශ්‍රද්ධාවෙන් යුත්තව පිළිගනියි.

ඉහත විස්තර කරන ලද සැකය ඉන්ද්‍රියයන් හරහාම දුරුකරගත හැකි, තමන් පිළිගත් ධර්මය තුල ඇතිවන්නා වූ ඉන්ද්‍රිය මුලික ධර්මයකි. තමන් පිළිගත් ධර්මය කායිකව හෝ මානසිකව ක්‍රියාත්මක වන විට එතන ධර්ම මාර්ගයක් ඇත. මෙසේ විවිධ ශාස්තෘවරයෙකු තුල විවිධ මාර්ග ඇත. පෙර සඳහන් කර ඇති පරිදි මේ සියළුම විමුක්ති මාර්ග අන්ත දෙකෙන් එකකට වැටෙයි: අත්තකිලමථානුයෝගය සහ කාමසුකල්ලිකානුයෝගය එම අන්ත දෙකයි. මෙම අන්ත දෙකම ඉන්ද්‍රිය ගෝචර වන බැවින් අනුසෝතගාමී වෙයි. යම් පිළිගැනීමකින් යුතුව සත්ත්වයා තුල ගොඩනැඟුණු ධර්මය බුදුන් වහන්සේ විසින් පහුරකට උපමා කරයි. සෑම ආගමකින්ම යම් ධර්මයක් කියාදෙන බැවින් ආගම් භේදයකින් තොරවම ධර්මය නමැති පහුර සත්ත්වයා තුල ගොඩනැගෙයි.

ධර්මය කුමක් වුවත් ඒ ධර්මය කෙරෙහි විශ්වාසය සහ පිළිගැනීම ඇති තැනක ඇත්තේ අන්ධානුකරණයයි. ධර්මය කෙරෙහි විශ්වාසය තබන්නා ධර්මය නමැති කණවැල අල්ලාගෙන යන අන්ධයෙකි. ඇස පහළවන තෙක් තනිවම ගමනක් ගිය නොහැකි බැවින් අන්ධයාට කණවැල අවශ්‍ය වෙයි. එය අතහැරියහොත් අතරමං වෙයි. අන්ධභාවයෙන් නිදහස් වුවිට ධර්මය නමැති කණවැල තවදුරටත් අවශ්‍ය වන්නේ නැත. එවිට ධර්මය කෙරෙහි විශ්වාසය තැබීමක් නැත. අන්ධව සිටි සිද්ධාර්ථ තවුසාද බුද්ධ පහළකරගැනීමට පෙර සියලුම ගුරුවරුන්ගේ ධර්ම වලින් නිදහස් විය. එය සිදුවුයේ ඇස පහළ වීමෙන් පසුවයි.

සියළුම බුදුන් වහන්සේලා (චක්ඛුං උදපාදී, ඥානං උදපාදී, ප්‍රඥා උදපාදී, විජ්ජා උදපාදී සහ ආලෝකෝ උදපාදී ලෙස දම්සක්පැවතුම් සුත්‍රයේ පෙන්වා දෙන) ඇස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය පහළ වූ බවට ප්‍රතිඥා දෙන සේක. සෑම බුදුවරයෙකුම බුද්ධත්වය ලබා දේශනා කරන, බුදුවරයෙකු හැර වෙනත් අයෙකුට දේශනා කල නොහැකි, දම්සක්පැවතුම් සුත්‍රය ගෞතම බුදුන් වහන්සේ පහළවී අවුරුදු 2500 කට පසු මෙසේ නැවත විවෘත විය.

**දම්සක්පැවතුම් සූත්‍රය තුල මාර්ගයක් පෙන්වා ඇත. නමුත් එය ධර්ම මාර්ගයක් නොවෙයි. අනුපාදා පරිනිර්වාණය දක්වා වූ මාර්ගය සම්පූර්ණ කිරීමට රථ හතකින් ගමන්කල යුතුය. රථ විනීත සූත්‍රයෙන් පෙන්වා ඇත්තේ ද මේ චක්ඛු උදපාදී ලෙස හඳුන්වන ඇස පහළවීමෙන් පටන්ගන්නා රථ හතකින් ගමන් කරන්නාවූ මාර්ගයයි.**

දම්සක්පැවතුම් සූත්‍ර දේශනාව ශ්‍රවණය කරනවිට කොණ්ඩඤ්ඤ තවුසා ඇස පහළ කර ගත්බව එම සූත්‍රයේ මෙසේ පෙන්වා ඇත: ආයුෂ්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදී යංකිංචි සමුදය ධම්මං සබ්බංතං නිරෝධ ධම්මංති.

මේ පාඨයෙන් පෙන්වා දෙන ධර්මය කුමක්ද?

ඇස පහළවීමත්, ධර්මය නිරෝධ වීමත් ඇස පහළනොවූ ගුරුවරු විවිධ ආකාරයට විස්තර කරති. ඇස පහළවීම තේරුම් ගැනීම ඇස පහළ වීමට උදව්වක් නොවනු ඇත. ඇස පහළ වන තෙක් ඇස පහළ වීම යනු කුමක්ද යන්න තේරුම්ගත නොහැකිය. තේරුම්ගැනීම තුල නැවත නැවත ධර්මයම සමුදය වෙයි. ඇස පහළවීමට එම ධර්මයද නිරෝධ විය යුතුය. නමුත් මා ඇස පහළවීම ගැන යම් සඳහනක් කරන්නේ තථාගත දර්ශනය අවබෝධ කරගත්තේ යයි මුළාවූ අයෙකුට ඉන් නිදහස් වී තථාගත මාර්ගයට වැටීම සඳහා පමණි.

කොණ්ඩඤ්ඤ තවුසාට දහම් ඇස පහළවන විට සමුදය වී තිබූ ධර්මය නිරෝධ වූ බව සඳහන් වෙයි. මෙතනදී 'යංකිංචි' යන වචනය වැදගත් වෙයි. සමුදය වී තිබුනේ යම්කිසි (යංකිංචි) ධර්මයක් විනා විශේෂයෙන් සඳහන් කරන ලද ධර්මයක් නොවෙයි. විවිධ සත්ත්වයින් විවිධ ආගම් ධර්ම ප්‍රගුණ කරන බැවින් ඔවුන් තුල විවිධ වූ ධර්ම සමුදය වී ඇත. ඇස පහළවීමට තමන් තුල කවර ආකාරයේ ධර්මයක් සමුදය වී තිබිය යුතුද යන්න, ඇස පහළවීමට ප්‍රශ්නයක් නොවෙයි. බුදුවරයෙක් කිසිම ධර්මයක් ප්‍රතික්ෂේප නොකරන්නේ එබැවිනි. අලගද්දූපම සූත්‍රයේ ධර්මය පහුරකට උපමා කර ඇත. එම සූත්‍රයට අනුව මේ ධර්ම පහුර සාදා ඇත්තේ කොළපරඬලා වලිනි.

එය ලෞකික වූද මුළාවක් වූද ධර්මයකි. ධර්ම පහුර සෑදීමේදී සහ එමගින් මෝහ ගඟෙන් එගොඩ වීමේදී තමන් අනුගමනය කල ආගම ධර්මය කුමක්ද යන්න ප්‍රශ්නයක් නොවෙයි. **නමුත් ඇස පහළවීමෙන් පසු සියල්ලෝම එකම මාර්ගයට වැටෙති.**

සමුදය වූ යම් ධර්මයක් නිරෝධ වී රාගාදී කෙලෙස් දුරුකිරීමට හේතුවන ඇස කොන්ඩඤ්ඤ තවුසාට පහළවිය. ඇසවත් පහළනොවී දර්ශනය පහළවුයේ යයි කියන බොහෝදෙනෙක් ඇස පහළවීම, ඥාන පහළවීම, ප්‍රඥාව පහළවීම, විද්‍යාව පහළවීම සහ ආලෝකය පහළවීම ගැන හාංකවිසියක්වත් නොදන්නා බැවින් මේ සියළුම පහළවීම් එකවර සිදුවන්නක් ලෙස හුවාදක්වයි. නමුත් ඇස පහළවීමෙන් තොර ඥාන පහළවීමක් හා ඥාන පහළවීමෙන් තොර ප්‍රඥාව පහළවීමක් නැත. ඥාන පහළවීමට පෙර ඇස පහළවිය යුතුමය. ඇස, ඥාන, ප්‍රඥාව, විද්‍යාව, සහ ආලෝකය පහළනොවී දකින දර්ශනයක් තථාගත දර්ශනයක් නොවෙයි.

මෙසේ විමුක්තිය සොයා යන අනුගාමිකයා තුල යම් මොහොතක මෙතෙක් සමුදය වී තිබූ ධර්මය එකවරම නිරෝධ වෙයි. මෙතෙක් කාලයක් සත්ත්වයා තුල යම් ධර්මයක් සමුදය වුයේ විචිකිච්ඡාවකින් තොරව එම ධර්මය ශ්‍රද්ධා සම්පන්නව පිළිගත් නිසාවෙනි. ඇස පහළවන මොහොතේදී දස සංයෝජනයන්ගෙන් එකක් වූ මෙතෙක් මතු නොවී තිබූ විචිකිච්ඡාව මතුවෙයි. මෙතෙක් සමුදයවී තිබූ ධර්මය කෙරෙහි විචිකිච්ඡාව මතුවීමත් සමග සමුදයවී තිබූ ධර්මය නිරෝධවී ඇස පහළ වෙයි. තවදුරටත් අන්ධයෙක් නොවන බැවින් කණකැල අතහැරෙයි.

**ධර්මය තුල සැක ඇතිවෙයි. ධර්මය කෙරෙහි විචිකිච්ඡාව පහළවෙයි.** ධර්මය තුල ඇතිවූ සැකය ඉන්ද්‍රිය පිළිගැනීම තුලින්ම පහවෙයි. එවිට සැකය නිසා පළුදු වූ ධර්මය නැවත ලියලා වැඩෙයි. විචිකිච්ඡාව නමැති ධර්මය එවැනි ඉන්ද්‍රිය ධර්මයක් නොවෙයි. විචිකිච්ඡාව පහළවනවිට පිළිගත් ධර්මයම නිරෝධ වෙයි.

විචිකිච්ඡාව නමැති සංයෝජනය බුද්ධ පහළවීමෙන් පසු පමණක් ප්‍රහාරණය වෙයි.

*ඇස පහළවීමට පෙර මා තුළ ද යම් පිළිගත් ධර්මයක් සමුදයවී තිබුණි. නිතිපතා පන්සිල් සමාදන්වීම, පොහෝදිනයේ අටසිල් සමාදන් වීම සහ භාවනාව මගින් නිවන් දැකීම මවිසින් පිළිගත් මගේ විමුක්ති මාර්ගය විය. මේ මාර්ගය දේශනා කල බුදුන් වහන්සේ ගැන තදබල ලෙස විස්වාශයක්, ශ්‍රද්ධාවක් මාතුල තිබුණි. "උන්වහන්සේ කවදාවත් බොරු කියන්නේ නැහැ, උන්වහන්සේ දේශනා කල ධර්මය තමයි පොත්වල ලියවිලා තියෙන්නේ. යම් දවසක නිවන් දකින්නේ මේ පොත්පත්වල තියන බුදුන් වහන්සේ දේශනා කල ධර්මය පිළිපැදලා තමයි" යනුවෙන් වූ ශ්‍රද්ධාවක් මා තුල තිබිණි.*

*අටසිල් සමාදන් වීමක් නොකලත් පොහොය දිනට අටසිල් සමාදන්වීමට පන්සල් යන උපාසක අම්මලා කෙරෙහි ලොකු ගෞරවයක් මා තුල ඇතිවී තිබුණි. මාද වයසට ගියාම භාවනා ක්‍රම පුරුදු පුහුණු වී අටසිල් සමාදන් වී නිවන් දකිනවාය යන අපේක්ෂාව මා තුළ තිබුණි. නමුත් දිනපතා පන්සිල් සමාදන් වීම පමණක් කරගෙන ගියෙමි. මේ අතරතුර අපේ ගමට අල්ලපු ගමේ සිටි මන්දමානසික ළමයෙක් යක්ෂයන් භූතයන් දෙවියන් අදහමින් සිටියේය. මේ ළමයා නුග ගසක පොඩියට මල්පැලක් අටවාගෙන ඒ තුල බුද්ධ රූපයක් තබා බුදුන් වහන්සේ වෙනුවෙන් පහනක් පත්තු කරනවා මා දැක තිබුණි. එක්දිනක් පන්සලේ ප්‍රබල උපාසිකා මාතාවක් අපේ අම්මා හමුවෙන්න ආ වෙලාවක දෙදෙනා අතර ඇතිවූ කතාබහකදී ඇය අපේ අම්මාට මෙසේ කියනවා මට අසන්නට ලැබුණි: "බලන්නකෝ නංගියේ අර (මවිසින් පෙර සඳහන් කල) ළමයා නුගගහේ පැලක් හදාගෙන බුදු හාමුදුරුවන්ට මල් පහන් පූජා කරනවා". උපාසිකා මාතාව ඒ ගැන අපේ අම්මට කීවේ අවඥාවට මෙනි. එකවරම මගේ හිතට නැගුනේ "අනේ ඉතින් එහෙම කියන මේ උපාසක අම්මල කරන්නේත් අර මන්දමානසික ළමයා කරන*

*දේමනෝ" යන්නයි. එකෙනෙහිම මා තුල මෙතෙක් තිබූ ශ්‍රද්ධාව වෙනුවට මාතුල මෙතෙක් සමුදය වී තිබූ (හේතුන් නිසා ඇතිවූ) ධර්මය කෙරෙහි විචිකිච්ඡාව පහළවිය. සමුදය වී තිබූ ධර්මය නිරෝධ වී ඇස පහළවිය. එදා සිට නිවන කුමක්ද යන්න සෙවීම ආරම්භ විය. මේ තමයි ගවේෂණයේ ආරම්භය. ඇස පහළවනවිට මගේ වයස අවු 25 ක් පමණ විය.*

සිද්ධාර්ථ කුමරු ගිහිගෙයි සිටින කල කාමසුඛල්ලිකානු යෝගය අනුගමනය කළේය. නමුත් කාලයාගේ ඇවෑමෙන් තමන්ගේ යෝගය ගැන සැක පහළවිය. උයන්කෙලියට යනවිට චන්නගෙන් ප්‍රශ්න කලේ එබැවිනි. නමුත් එම ප්‍රශ්න කිරීම තුලින් සිද්ධාර්ථට සැකය දුරුකරගැනීමට නොහැකි විය. ඔහු වෙනත් මාර්ගයක් සොයාගියේ එබැවිනි. එය අත්තකිලමතානු යෝගයයි. මාළිගාව හැරගිය සිද්ධාර්ථ තවුසාණෝ අත්තකිලමථානු යෝගය අනුගමනය කරමින් මනසට ගන්නා ඵස්සය, මනෝසංචේතනා සහ විඤාන ආහාර අඩුකරමින් ප්‍රභාෂ්වර මනස සොයා ගුරු උපදෙස් අනුව දිගු ගමනක් ගියහ. එය එක ගුරුවරයෙක් අතහැර තවත් ගුරුවරයෙක් සොයා ගිය ගමනකි.

මෙසේ සය අවුරුද්දක් ගෙවෙන විට තවත් එක් දිනක දිනපතා කරන කාර්යයක් ලෙස උදෙන්ම මුහුණ කට සෝදාගැනීමට උන්වහන්සේ එදත් වෙනදා මෙන්ම සැරයටියත් රැගෙන ගඟට පියනැගුහ. රොන්මඩ ආදිය ගඟ පතුලේ තැන්පත් වී තිබූ බැවින් ඇත තියාම සිද්ධාර්ථ තවුසා දුටුවේ පැහැදිලිව ගලා යන පිරිසිදු ජල පහරයි. පැහැදිලි වූ ජලය තුලින් උන්වහන්සේ ප්‍රභාෂ්වර මනස දුටුවෝය. "මගේ මනසත් ප්‍රභාෂ්වර වූවිට මේ පැහැදිලි ජලය වගේ" යයි සිතුන උන්වහන්සේගේ සිතෙහි ප්‍රීතියක් පැන නැගුණි. තමන්ගේ යෝග ධර්මය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිවිය. ඒ ප්‍රීතියත් සමගම උන්වහන්සේ මුහුණ සෝදාගන්නට ගඟට බැස්සෝය. සැරයටිය පැහැදිලි ජලය මත තබනවාත් සමග මෙතෙක් පැහැදිලිව තිබූ ජලකඳ

මත රැළි නැගුණි, රොන් මඩ කැළතුණි. පැහැදිලිව ගලාගිය ජල කඳ අපැහැදිලි විය. එවිට එකවරම උන්වහන්සේට මෙවැනි අදහසක් පහළ වුනි: "ඉතා පැහැදිලිව තිබූ ජලකඳ සැරයටිය වැදීමෙන් අපැහැදිලි වූවාසේ ප්‍රභාෂ්වර මනසත් ඕනෑම වෙලාවක බාහිර දෙයකින් අපිරිසිදු වියහැක". ඒ සමගම උන්වහන්සේ මෙතෙක් විශ්වාසයෙන් ප්‍රගුණ කල යෝගධර්මය කෙරෙහි විචිකිච්ඡාව පහළවිය. සමුදයවී තිබූ ධර්මය එකවරම නිරෝධ විය, ඇස පහළවිය. "යංකිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මංති" ලෙස ධම්ම චක්ක පවත්වන සූත්‍රයේ පෙන්වන ආකාරයට හේතූන් නිසා ඇතිවූ යම් ධර්මයක් නිරෝධ වීමෙන් සිද්ධාර්ථ තවුසාගේ 'ඇස පහළවිය.

මේ වර්තමාන කාලයේ ඇස පහළ වූ කීපදෙනෙක් මට හමුවී ඇත. ඉන් එක් අයෙකුට ඇස පහළ වී ඇත්තේ පාසල් යන අවධියේය. මේ ශිෂ්‍යයා බුදුදහම ගැන ශ්‍රද්ධාවක් ඇති කරගෙන තිබූ අයෙකි. පාසලේ බුද්ධාගම විෂය ඉගෙන ගන්නා විට එක් දිනක් ගුරුවරයා විසින් බුදු හිමියන් කියාදුන් පාඩමක් ළමයින්ට ඉගැන්වුයේ "ළමයිනේ, බුදු හාමුදුරුවෝ කියල තියෙන්නේ තමන් උපයන දෙයින් හතරෙන් එකක් පරිභෝජනය කරන්න, හතරින් එකක් දන් දෙන්න, ඊ ළඟ හතරෙන් එක තමන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කර ගැනීම සඳහා යොදවන්න, අවසාන හතරෙන් එක මතු ප්‍රයෝජනය සඳහා තැන්පත් කරන්න" කියල. මේ කතාව ඇසූ අපේ කතානායකයාට එකවරම කල්පනාවට ආවේ " දැනට මගේ පියා හරි හම්බ කරන දෙයින් යන්තම් කාලා ඇඳලා ජීවත් වෙන්නවත් බැරිකොට හම්බ කරන දෙයින් හතරෙන් එකක් පමණක් ආහාරයට ගෙන බුදුහාමුදුරුවෝ දේශනාකල දේ පිළිපැද්දා නම් මෙලහකට පවුලේ ඔක්කොම ආහාර නැතිවම මියගිහින්" කියල. එවිටම මෙතෙක් ඉගෙනගෙන තිබූ බුදුදහම කෙරෙහි විචිකිච්ඡාව පහළවිය. ඒ සමගම සමුදය වී තිබූ ධර්මය නිරෝධ විය, ඇස පහළ විය.

මේ මුස්ලිම් ආගමිකයෙක් ගැන කතාවකි. මේ කතානායකයා වෛද්‍ය විද්‍යාව හැදෑරීමට ශිෂ්‍යත්වයක් ලැබී

රුසියාවට ගියේය. අධ්‍යාපනය ලබන අතරතුර සංචාරයක් ලෙස සයිබීරියාවට යාමට ඔහුට අවස්ථාවක් ලැබුණි. ඒ රටට යනවිට සයිබීරියාවට පැය 24 පුරාම හිරු නොබසින කාලයක් විය. එවිට කළුවර වැටීමක් නැත. උත්තර සහ දක්ෂිණ ධ්‍රැව ආසන්නයට ගියවිට මේ අත්දැකීම ලැබිය හැක. මේ කතානායකයාට එකවරම ඇතිවුන සිතුවිල්ල නම් සයිබීරියාවේ සිට නෝම්බි ඇල්ලුවොත් ආහාර ගන්නේ කොහොමද කියලයි. ඔහු හිතා හිටියේ නෝම්බි ඇල්ලුවාම ආහාර ගන්නේ කළුවර වැටුනම කියලයි. එකවරම ඇස පහළ විය.

මෙතැනදී පැහැදිළිව පෙනෙන දෙයක් නම් ඇස පහළවන්නේ මෙතෙක් විමුක්ති මාර්ගය ලෙස තදින්ම විශ්වාසය තැබූ ධර්මයක් කෙරෙහි ක්ෂණිකවම විචිකිච්ඡාව මතුවීම නිසාය යන්නයි. මෙසේ ක්ෂණිකව පහළවන විචිකිච්ඡාව යම් ධර්මයක් තුල ඇතිවන ‘සැකය’ නොවන බව තේරුම් ගතයුතුය. සැකය කවදා හෝ ඉන්ද්‍රියන් වලින්ම විසඳාගැනීමට පුළුවන. නමුත් විචිකිච්ඡාව ‘බුද්ධ’ පහළවනතෙක් පහනොවෙයි. විචිකිච්ඡාව පහළවීමට පෙර සත්ත්වයා විවිධ මාර්ග අනුගමනය කරමින් විමුක්තිය සොයයි. විචිකිච්චාව පහළවීමට හේතුවූ ධර්මය කුමක් වුවත් විචිකිච්ඡාව නිසා ඇස පහළ වූ සත්ත්වයෝ එකම මාර්ගයක ගමන් කරති. ධම්ම චක්ක පවත්වන සූත්‍රයේ පෙන්වා ඇති එම මාර්ගය තුළ ඇස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය පහළ වෙයි, චතුරාර්යය සත්‍යය දකියි, ආර්යාෂ්ඨාංගික මාර්ගය විවෘත වෙයි. මෙය ආගමකින් හෝ ධර්මයකින් ස්වාධින වූ මාර්ගයකි. තමන් ළඟ සමුදය වී තිබූ ධර්මය නිරෝධවීමෙන් ආරම්භ වන මාර්ගයකි. එම මාර්ගය තුල ඇස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය යන වචනත් චතුරාර්යය සත්‍යය පිලිබඳ දැනුමක් හෝ ආර්යාෂ්ඨාංගික මාර්ගය ගැන අවබෝධයක් හෝ නැත. යමෙක් චතුරාර්යය සත්‍යය සහ ආර්යාෂ්ඨාංගික මාර්ගය අවබෝධ කරගෙන නිවන් දැකීමට දරන උත්සාහය, ගුරුවරුන්ගෙන් අසා ඉගෙනගෙන ලැජ්ජාව පුහුණු කරන්නට දරන උත්සාහය වැනිය.

***කුමාරකස්සප තෙරුන්වහන්සේට දේශනා කල වම්මික සූත්‍රයේද මේ ඇස ආදී පහළවීම් පෙන්වා දෙයි. එය තුඹසක කතාවකි. මේ තුඹස දවල්ට ගිනි ගනියි, රෑට දුම්දමයි. හේතුව හොයන්න යවුලකින් තුඹස හාරන විට මුලින්ම දොර අගුළක් හමුවෙයි. දොර අගුළ ඉදිරි ගමනට බාදාවකි. දේවතාවෙකුගේ උපදෙස් අනුව මේ දොර අගුළ පැත්තකින් තබයි. එය ඇස පහළ වීමයි, මාර්ගය විවෘත වීමයි.***

ඇස පහළවූ සත්ත්වයා එකම ධර්මයක රැඳී නොසිට සියලු ආගම් සහ ධර්ම අධ්‍යයනය කරයි. එම ආගම් සහ ධර්ම තුල විමුක්තිය තිබේදැයි විමර්ශනය කරයි. සත්ත්වයාගේ සත්‍යය ගවේෂණය ආරම්භ වන්නේ ඇස පහළවී විචිකිච්ඡාව නමැති සංයෝජනයෙන් බැඳුන පසුවයි. එසේම ඇස පහළවීමට පෙර සත්ත්වයා යම් ශීලව්‍රතයක පිහිටයි. ඇස පහළවීමෙන් පසු මෙතෙක් කරගෙන ගිය ශීලය අතහරින්නේ නැත. පසුගිය කාලයේදී මා අත්දුටු දෙයක් නම් පන්සිල්, අටසිල් ආදී ව්‍රත අනුගමනය කරමින් යම් ධර්මයක සිටි බොහෝදෙනෙක් “මේ ශීලයෙන් නිවන් දකින්නට නොහැකියැ”යි කියමින් එම සිල්ව්‍රත අතහැර දැමීමයි. ඔවුන් එක් අන්තයක ධර්මය ප්‍රගුණ කරමින් සිට ගුරුවරුන්ගේ බස් අසා අනෙක් අන්තය අල්ලාගත් අයයි. ඇස පහළවූ විට අන්තයකට නොවැටෙන බැවින් මෙතෙක් කරගෙන ගිය සිල්ව්‍රත එලෙසම කරගෙන යයි. නමුත් මෙතෙක් කරගෙනගිය ශීලය ඇස පහළවීමෙන් පසු විශුද්ධ වෙයි. ශීල විශුද්ධිය ලෙස හඳුන්වන්නේ මෙයයි. රථ විනීත සූත්‍රයට අනුව ශීල විශුද්ධිය යනු අනුපාදා පරිනිර්වාණයට ගමන් කරන මාර්ගයේ පළමු ඇරඹුමයි. මේ මාර්ගය රථ හතකින් සම්පූර්ණ කරයි. ශීල විශුද්ධිය යනු පළමු රථයයි (කරුණාකර රථ විනීත සූත්‍රය කියවන්න). ඇස පහළවීමට පෙර තමන් පිළිගත් ධර්මයට අනුව ශීලයෙන් හැසිරෙයි. එය ගුරුවරයාගෙන් ඉගෙනගත් ශීලයකි. එම ශීලය ඉන්ද්‍රිය මුළාවෙන් යුත් ධර්මයෙන් අපිරිසිඳු වී ඇත. ඇස පහළවීමෙන් පසු ඉන්ද්‍රිය මුළාවක් වූ ධර්මය නිරෝධ වන බැවින් ශීලය පිරිසිදුවීම ඇරඹෙයි. රථ විනීත සූත්‍රයේ පුණ්ණ ස්ථවිරයන් ට අනුව උන්වහන්සේ බ්‍රහ්මචර්යාව පුරන්නේ ශීල විශුද්ධිය පිණිස

නොවෙයි. උන්වහන්සේ අනුපාදා පරිනිර්වාණය සඳහාම බ්‍රහ්මචර්යාව පුරති. එසේම ශීල විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය ද නොවෙයි. ශීල විශුද්ධිය හෙවත් 'ශීලය පිරිසිදුවීම' සත්ත්වයාට කළහැකි දෙයක් නොවන බව තේරුම්ගත යුතුය. ඇස පහළවීමෙන් පසු එය සිදුවෙයි. ඒ සඳහා ශීල විශුද්ධිය අවබෝධ කරගත යුතු නැත.

ඔබගේ දැනගැනීම සඳහා අනුපාදා නිර්වාණය දක්වා යන මාර්ගගේ රථ විනීත සූත්‍රයේ සඳහන් වන සප්ත විශුද්ධිය මෙසේ සඳහන් කරමි

1. ශීල විශුද්ධිය
2. චිත්ත විශුද්ධිය
3. දිට්ඨි විශුද්ධිය
4. කංඛාවිතරණ විශුද්ධිය
5. මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය
5. පටිපදා ඤාණදස්සන විශුද්ධිය
7. ඤාණදස්සන විශුද්ධිය

ථෙරවාද, මහායාන, ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු ආදී ඕනෑම ධර්මයකින් කරන්නේ සත්ත්වයාගේ ඇස පහළ කර නිවන් මාර්ගය පාදා දීමයි. ඒ නිසා බුදුවරු කිසිම ධර්මයකට එරෙහි නොවෙති. කපටි වෙළෙන්දා නිසා පාරිභෝගිකයාගේ බුද්ධිය පහළ වන්නේ යම්සේද ආගමික ගුරුවරයාගේ ධර්ම උගුලට අසුවන සැදැහැවත් අනුගාමිකයා යම් දවසක උගුලෙන් නිදහස් වී ඇස පහළ කරගනියි. යම් දවසක සත්ත්වයා රාගාදී කෙලෙස්වලින් නිදහස් වීමට ඇස පහළවීමම හේතුවෙයි. "කොන්ඩඤ්ඤස්ස **විරජං වීතමලං** ධම්ම චක්ඛුං උදපාදී යංකිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මංති" යන්නෙහි 'විරජං වීතමලං' යන වචන දෙකෙන් පෙන්වන්නේ එම සදාතනික සත්‍යයයි.

5

# ඥාන පහළවීම (ඥානං උදපාදී)

ඇස පහළවීමත් සමග සමුදයවී තිබූ ධර්මය නිරෝධවන බැවින් තවදුරටත් ගවේශකයා තුල පිළිගන්නා හෝ ප්‍රතික්ෂේප කරන ධර්මයක් නැත. ඇස පහළවූ පසු මවිසින් ධර්ම ශ්‍රවණය හෝ පොත්පත් පරිශීලනය අතනොහැරීයෙමි. නමුත් ගුරුවරුන් අතහැරියෙමි. මෙතන ගුරුවරුන් ලෙස හඳුන්වන්නේ ඉන්ද්‍රිය පිළිගැනීමය. තමාගේ ගුරුවරයා වන්නේ ඉන්ද්‍රියන් මිස වෙන කවරෙක්ද? සිදුහත් තවුසා ද ගුරුවරුන් හැරගියේ ඇස පහළ වූ පසුවයි. ඇස පහළවීමත් සමග විචිකිච්ඡාව පහළවන බැවින් තවදුරටත් සංස්ඛාර ධර්ම ප්‍රගුණ නොකරයි. එබැවින් සංස්ඛාර තුල ඉපදීම (කුණුගොඩේ ඉපදීම) ක්‍රමයෙන් අඩුවී යයි.

***වම්මික සූත්‍රයේ ද තථාගත මාර්ගය තුල විචිකිච්ඡාව පහළවීම පෙන්වා දී ඇත. පෙර පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිදි දවල්ට ගිනිගන්නා රාත්‍රියට දුම්දමන තුඹසේ රහස් සොයා යනවිට පළමුව දොරගුළක් හමුවෙයි. එක්තරා දේවතාවෙක් දොරගුළ ඉවත් කිරීමට කියයි. දොරගුල ඉවත් කිරීම යනු ඇස පහළ වීමයි. දොරගුල ඉවත්කල විට හමුවන්නේ ගෙම්බෙකි. ගෙම්බාගේ ස්වභාවය එහාමෙහා පැනීමයි. එය විචිකිච්ඡාවේ ස්වභාවයයි.*** විචිකිච්ඡාව ක්‍රියාත්මක වන්නේ ඇස පහළවීමෙන් පසුව බව තේරුම්ගත යුතුය.

කාලාම සූත්‍ර දේශනාව අනුවද කරුණු දහයකින් පිළිගැනීම ප්‍රතික්ෂේප වෙයි. විචිකිච්ඡාව පහළවී තථාගත මාර්ගයට වැටීම බොහෝ ධර්මධර ගුරුවරුන්ට ප්‍රහේළිකාවක් බව මම දනිමි. විචිකිච්ඡාවට පෙර සත්ත්වයා ධර්මය ප්‍රගුණ කරන බවත් විචිකිච්ඡාවෙන් බැඳුන පසු එම ධර්මයම පහුරක් සේ එතෙර වීමට උපකාර කරගන්නා බවත් තේරුම් ගත යුතුය. විචිකිච්ඡාව පහළවීමට

පෙර සත්ත්වයා ධර්මයෙන් හැසිරෙයි. විචිකිච්ඡාව පහළවීමෙන් පසු සත්ත්වයා (එනම් සක්කායදෘෂ්ඨිය) ධර්මය හසුරුවයි. සක්කායදෘෂ්ඨිය නමැති තොටියා ධර්මපහුර හසුරුවන්නේ විචිකිච්ඡාව නමැති හබලෙනි.

ඕනෑම ධර්මයක් ගවේෂණය කිරීමට අවස්ථාව විචිකිච්ඡාව විසින් සලසා දෙයි. ඇස පහළවීමෙන් පසු මම ක්‍රිස්තු ධර්මය ගැන පවා අධ්‍යයනයක යෙදුනෙමි. ඇස පහළ නොවූ පෘතග්ජනයාට ධර්මය යනු උගුලකි. කෙළවරක් නොපෙනෙන අන්ධකාරයේ ගමන් කරන විචිකිච්ඡාව පහළනොවූ සත්ත්වයා ධර්ම උගුලට අසුවෙයි. එක උගුලකින් නිදහස් වන්නේ තවත් උගුලකට අසුවීමෙන් පසුවයි. ධර්ම උගුලෙන් සත්ත්වයා නිදහස් වන්නේ ඇස පහළ වීමෙන් පසුව පමණි. බුද්ධ මාර්ගයේ පළමු පියවර එයයි.

ගුරුවරයාගේ ධර්මය පිළිගත්, එම ධර්මය අනුගමනය කරන, ඇස පහළනොවූ සත්ත්වයා ගුරුවරයාගෙන් අසා දැනගත් විමුක්තියක් ප්‍රගුණකරයි. එය පහසු කාර්යයක් වනවා සේම මනසට සහ සිතට සහනයක් ද ගෙනදෙයි. ඇස පහළ කරගත්විට ගුරුවරයාගේ විමුක්ති මාර්ගය කෙරෙහි විචිකිච්ඡාව ඇතිවන බැවින් ගවේෂණයේ කෙළවරක් දකින්නේ නැත. **අනුගාමිකයා ගුරුවරයාගෙන් අසා දැනගත් නිවනක් සොයායයි. නමුත් ගවේශකයා නොපෙනෙන නිවනක් සොයායයි.** ගවේශකයා සංවාදයේ යෙදෙන නමුත් නිගමනවලට නොබසියි. ඇස පහළකරගත්තෝ තමන්ගේ බුද්ධියෙන් විමසා බලා හෝ පිළිගන්නේ නැත. එසේ පිළිගන්නට අන් අයට උපදෙස් දෙන්නේද නැත.

ඇස පහළ කරගත් සත්ත්වයා ගවේෂකයෙකි, වෙනත් අය සමග ධර්ම සාකච්ඡා කරන්නෙකි, සංවාදශීලී ය. මෙසේ ධර්මයේ විවිධ පැති දෙස අන් අයගේ අදහස් උදහස් අනුව යන මේ ගමනේදී විචිකිච්ඡාව මනා සේවයක් කරයි. නමුත් යම් අවස්ථාවකදී තව දුරටත් විචිකිච්ඡාවේ අවශ්‍යතාව නැතිවී යයි. එවිට විචිකිච්ඡාව පැත්තකින් තබයි.

***වම්මික සූත්‍රයේ එය දක්වා ඇත්තේ තුඹස හාරමින් යන ගමනේදී හමුවූ ගෙම්බා පැත්තකින් තැබීමක් ලෙසයි. විචිකිච්ඡාව පැත්තකින් තැබීමත් සමගම ප්‍රශ්නයක් පැනනැගෙයි. මේ 'ඤානං උදපාදී' ලෙස හඳුන්වන ඤාන පහළවීමයි. ද්විත්වයෙන් යුත් ධර්මය තුල ප්‍රශ්නයට පිළිතුරු ඇත. නමුත් ධර්මය නිරෝධවී ඇති ඤානවන්තයාට තමන්ගේ ප්‍රශ්නයට පිළිතුරක් නැත. ඤාන පහළවීම වම්මික සූත්‍රයේ පෙන්වා ඇත්තේ තුඹස හාරමින් යනවිට 'දෙමංහන්දිය' හමුවීම ලෙසයි.***

දෙමංහන්දිය ඉදිරිපිට සිටින්නාට මාර්ග දෙකෙන් කුමක් තෝරාගන්නේද යන ප්‍රශ්නය ඇතිවෙයි. නමුත් ඤානවන්තයා යනු ගුරු වචනය හෝ තථාගත වචනය කෙරෙහි විශ්වාසය තබා මාර්ගය තෝරාගන්නෙක් නොවෙයි. යම් ධර්මයක් කෙරෙහි විශ්වාසය තබන්නේ අන්ධයෙක් මිස ඤානවන්තයෙක් නොවෙයි. ඤානවන්තයා තුල පිළිගත් ධර්මයක් නැත. පිළිගත් ධර්මය අනුන්ගේ ධර්මයකි. එය කණකවැලකි. ඤානවන්තයා බුද්ධිමතා මෙන් ධර්මය නැමැති කණකවැල අල්ලාගෙන විමුක්තිය සොයන්නෙක් නොවේ. **එමනිසා ඤානවන්තයාට පැනනගින ප්‍රශ්නයට පිළිතුරක් නැත.**

මාර්ගය තෝරාගැනීමට ගුරුවරයෙකුගෙන් පිහිටක් පැතූ විට එක් ගුරුවරයෙක් එක් මාර්ගයක් පෙන්වයි, තවත් ගුරුවරයෙක් තවත් මාර්ගයක් පෙන්වයි. මේ බව දන්නා ඤානවන්තයා තමන්ගේ ප්‍රශ්නය කෙලින්ම ගුරුවරයෙකුට යොමුකරන්නේ නැත. ගුරුවරයෙකුගෙන් පිළිතුරක් බලාපොරොත්තු වන්නේද නැත. නමුත් ඤානවන්තයා ප්‍රශ්නය අතහරින්නෙත් නැත.

*ඇස පහළ වීමෙන් පසු විවිධ පොත්පත් පරිශීලනය කරමින්, ධර්මය ශ්‍රවණය කරමින් මමද වයස අවුරුදු තිස්පහක් වනතෙක් කෙළවරක් නොපෙනෙන මාර්ගයේ ගමන්කෙළෙමි. සත්‍යය හෝ නිවන් යනු කුමක්දැයි නොදැන පොත්පත් පරිශීලනය කරමින් මගේ ගවේෂණය සිදුවිය. එය එක් අතකින් අවසානයක් නොදකින ගවේෂණයක් විය. පොතපත පරිශීලනයෙන් නිවන් සොයා ගමනක් ගියද මවිසින් කරන ලද එකම සිල්ව්‍රතය සැමදා උදයේ බුදුන් වහන්සේට පහන් දල්වා පන්සිල් සමාදන්වීම පමණි. වෙනත් භාවනා*

*ආදී කිසිම කායික සහ මානසික වීර්යයක් නිවන්දැකීම වෙනුවෙන් නොකෙළෙමි. ගුරුවරුන්ගේ සහ පොත්පත් වල ඉගැන්වීම අනුව භාවනාව නිවන් මගට හේතුවන්නේ යයි අසා තිබුනද සිත එක්තැන් කිරීම මට කල හැකි දෙයක් නොවීය. එමනිසා එම උත්සාහය ද අතහැරියෙමි.*

*උසස් අධ්‍යාපනය සඳහා නවසීලන්තයට සංක්‍රමණය වන විට හැකිතාක් බෞද්ධ පොත්පත් ද රැගෙන ගියෙමි. මෙම පොත් කියවන විට එම විවිධ ඉගැන්වීම් අතර ඇති පරස්පර විරෝධතාවයන් මම දුටුවෙමි. මේ කාලයේ අචාන්චා හාමුදුරුවන්ගේ ධර්ම දේශනා ඇතුලත් පොත්පත් පරිශීලනයට ද අවස්ථාව ලැබුන අතර එම ධර්මතුල යම් වෙනසක් මම දුටුවෙමි. මා තේරුම්ගත් ආකාරයට උන්වහන්සේගේ දේශනාව වූයේ සුදානම්වී කරන භාවනාවක් වෙනුවට තමන්ගේ වැඩකටයුතු කරමින් ම කරන ක්‍රියාව දෙස සිහියෙන් බලා සිටීමකි. මට වැටහුන ආකාරයට කාර්යය ආරම්භ කෙළෙමි.*

*මම ඒ දිනවල නවසීලන්තයේ වයිකාටෝ විශ්වවිද්‍යාලයේ (The University of Waikato) අධ්‍යාපනය හදාරමින් සිටියෙමි. වාහන නැවතුම්පොලේ සිට මගේ කාර්යාලයට යන දුර සිහියෙන් යුත්තව ගමන් ඇරඹුවෙමි. පය ඔසවන විට එසවීම සිහියට ගතිමි. පය බිම තබන විට බිම තැබීම සිහියට ගතිමි. කෙසේ නමුත් මෙය මගේ හිතට වදයක් විය. දින හයකින් එම ව්‍රතයද අවසන් විය. නමුත් ගමනේ අවසානයක් නොදුටුවෙමි.*

***අවසානයේදී පන්සිල් අටසිල් රකිමින් විවිධ භාවනා කරමින් විමුක්තිය ලබාගත හැකිද යන ප්‍රශ්නය මට ඇතිවිය. පිළිතුරක් නැති එම ප්‍රශ්නය පැනනැගීමත් සමග ඥාන පහළවිය.** ඥාණ පහළවීමෙන් පසු මා මෙතෙක් කරගෙන ගිය එකම සිල්ව්‍රතය වූ පංචශීලය සමාදන්වීම නතරවිය. එය විමුක්තිය සඳහා අවශ්‍යය නොවන දෙයක් බව මට ප්‍රත්‍යක්ෂ විය. නමුත් ඥාණ පහළවීමට පෙර ශීලයත් ශිලවිශුද්ධියත් අවශ්‍යම ධර්මයකි. එය රථ විනීත සූත්‍රයෙන් ද පැහැදිලිව පෙන්වා දෙයි.*

රථ විනීත සූත්‍රයට අනුව ශීල විශුද්ධිය සම්පූර්ණ වනවිට චිත්ත විශුද්ධිය ඇරඹෙයි. ශීල විශුද්ධියම චිත්ත විශුද්ධියට හේතුවෙයි. එසේ නැතිව චිත්ත විශුද්ධිය ඇතිකර ගතහැකි ධර්මයක් නොවෙයි. ඥාණ පහළවනවිට විචිකිච්ඡාව පැත්තකින් තබා ඇති බැවින් චිත්තය පිරිසිදුවීම ඇරඹෙයි. එය චිත්ත විශුද්ධියයි. ශීල විශුද්ධිය නම් වූ රථය රථගාලේ තබා චිත්ත විශුද්ධිය නමැති රථයෙන් ගමන් අරඹයි. චිත්ත විශුද්ධියෙන් ද අනුපාදා පරිනිර්වාණය දක්වා ගමන්කළ නොහැකිබව තේරුම් ගත යුතුය.

ඥාන පහළවූ පසු මා එතෙක් කරගෙන ගිය ව්‍රතය වූ පංචශීලය විමුක්තිය සඳහා අවශ්‍ය නොවන බව ප්‍රත්‍යක්ෂ වූ බව පෙර සඳහන් කෙළෙමි. රථ විනීත සූත්‍රයට අනුව ඥාණ පහළවන විට ශීල විශුද්ධියේ ගමන සම්පූර්ණ වෙයි. ශීල විශුද්ධිය නමැති රථය රථගාලේ තබා චිත්ත විශුද්ධිය නමැති රථයට නගින්නේ එබැවිනි. තවදුරටත් ශීලව්‍රතයක් අවශ්‍යය නොවෙයි.

6

# ප්‍රඥාව පහළ වීම (ප්‍රඥා උදපාදී)

ඇස පහළ නොවූ පෘතග්ජන සත්ත්වයාට ගුරුවරයා පෙන්වා දුන් ධර්ම මාර්ගයක් ඇත. එම මාර්ගයේ ගුරුවරයා පෙන්වා දුන් කෙළවරක් ද ඇත. කෙළවර දන්නා බැවින් ඔහුට/ඇයට ගවේෂණයක් අවශ්‍ය නැත. කරන්නට තියෙන්නේ ගුරුවරයාගේ මාර්ගය අනුගමනය කිරීම පමණි. අවසානයේදී ගුරුවරයා පෙන්වා දුන්, ගුරුවරයාට සාපේක්ෂ වූ විමුක්තිය සාක්ෂාත් කරගනියි. නමුත් එය තාවකාලික විමුක්තියක් බව තමන් දන්නේ නැත.

තමන්ගේ ප්‍රශ්නය කරතබාගෙන ගවේෂණයක යෙදෙන ඇස පහළකරගත් ඥානවන්තයා තර්ක කරයි, ප්‍රශ්න කරයි, විමර්ශණය කරයි, සංවාද කරයි. නමුත් කිසිවෙකුගේ හව්හරණක් හෝ සරණක් යදින්නේ නැත. පිළිතුරක් නැති ප්‍රශ්නයක් රැගෙන කෙළවරක් නොදකින මාර්ගයක විමුක්තිය සොයා ඥානවන්තයා ගමන් කරයි. **ඥානවන්තයා විචක්‍ෂණයට අසුවී ඇති බැවින් ඥානවන්තයාගේ ගමන එක් අතකින් මානසික වශයෙන් වදයකි. මේ විචක්ෂණයම ප්‍රමාදයට හේතුවෙයි.**

තමන් නිවන් මාර්ගය තුල ගමන්කරන බවක් මේ ඥානවන්තයා දන්නේ නැත. ධර්මය කෙරෙහි තමන් තුල ඇති ප්‍රශ්නය විසදා ගැනීම හැර කලයුතු අන් යමක් ද මේ ඥානවන්තයාට නැත. අන් අයකුගේ පිළිතුරක් කෙරෙහි විශ්වාසය නොතබා මේ යන ගමනේ අවසානය කුමක්ද?

ඥානවන්තයා තවත් අයෙකුට තමන්ගේ ප්‍රශ්නය කෙලින්ම ඉදිරිපත් කරන්නේ නැත. එය ඥානවන්තයාගේ ස්වභාවයයි. අන් අයගෙන් පිළිතුරක් බලාපොරොත්තු නොවන බැවින් බොහෝවිට තමන්ගේ ප්‍රශ්නය අන් අය සමග කතා නොකර සිටියි. මෙසේ මහමෙරක් සේ ප්‍රශ්නය හිසතබාගෙන යන ඥානවන්තයාට යම් අවස්ථාවකදී ඔහුට විශේෂ වූ පුද්ගලයෙක් හමුවන අතර ඔහුගෙන් තමන්ගේ ප්‍රශ්නය කෙලින්ම නොඅසා එම පුද්ගලයා සමග සංවාදයට වැටෙයි. නැතිනම් සංවාදයකින් තොරව එම පුද්ගලයාගේ දේශනාව ශ්‍රවණය කරයි. මෙසේ ධර්මය ශ්‍රවණය කරන ඥානවන්තයාට ක්ෂණයකින් ප්‍රඥාව පහළ වෙයි. තමන් තුල මෙතෙක් මහමෙරක් සේ තිබූ ප්‍රශ්නය ඒ මොහොතේම අතුරුදහන් වෙයි. ප්‍රඥාවෙන් ප්‍රශ්නය සිඳ බිඳ දමයි. දැන් ප්‍රශ්නයත් නැත, පිළිතුරත් නැත. මෙය කවදා කෙසේ වේදැයි කිව නොහැකි වුවත් අවශ්‍ය හේතු සම්පූර්ණ වනතෙක් ප්‍රඥාව පහළ වෙන්නේ නැත.  ප්‍රඥාව පහළවූ පසු සම්මා දිට්ඨියෙන් ආරම්භ වන ආර්ය මාර්ගයේ ආරම්භය පමණක් නොව අවසානයත් පෙනෙයි. එමගින් මෙතෙක් තමන් නොදුටු නිවන සඳහා යම් මාර්ගයක් ඇතිබව ප්‍රත්‍යක්ෂ වෙයි. එබැවින් බුද්ධ ධම්ම සංඝ කෙරෙහි **අචල ශ්‍රද්ධාවක්** ඇතිවෙයි. එම ‘අචල ශ්‍රද්ධාව’ තමන් තුල ඇති විචිකිච්ඡාවෙන් විනාශ නොවෙයි.

ද්විත්වයෙන් යුත් ධර්මයට අසුවී ඇති සත්ත්වයාට ප්‍රඥාව පහළකරගත නොහැකිය. ද්විත්වය තුල ඇත්තේ අවබෝධයකි. මෙම අවබෝධය කොළරොඩු ගොඩකි. එතන තමන්ගේ ප්‍රශ්නයට පිළිතුරක් ඇත. එම පිළිතුර ද්විත්වයට අසුවූ එක් අන්තයකි. ධර්මය නිරෝධවීමට පෙර ද්විත්වයට අසුවූ මනුෂ්‍යයා තුල හොඳනරක පින්පව් ආදී ධර්මයන් ඇත. එය සංස්කාර ලෝකයේ ස්වභාවයයි. ප්‍රඥාව පහළවනවිට හොඳ නරක කුසල් අකුසල් ආදී ද්විත්වයෙන් තොරවෙයි. හොඳනරක ආදී ධර්ම සහ ආදරය කරුණාව ආදී ගුණයන්ගෙන් තොරවූ තැන විඥානයයි. එතන මනුෂ්‍යයෙක් නූපදියි. මනුෂ්‍යයා වේදනාව හඳුනයි, නමුත් විඥානය තුල උපදින සත්වයා වේදනාව නොහඳුනයි. ප්‍රඥාව පහළකරගන්නේ විඥානය තුල උපත ලබන ඇස සහ විඥානය පහලකරගත් එවන් සත්වයෙකි. හොඳ නරක නොදන්නා මෙම සත්වයා යක්ෂයෙකි.

සසරින් නිදහස් වූ නිවන් දුටු සෑම අයෙක්ම පළමුව ප්‍රඥාව පහළකරගනියි. බොහෝදෙනෙක් (සමහරවිට ඔබත්) සිතන ආකාරයට ප්‍රඥාව යනු බුද්ධියේ ඉහළ ඵලයක් නොවෙයි. බුද්ධිය අන්ධ ගමනේ ප්‍රතිඵලයකි. නමුත් ප්‍රඥාව තුල අන්ධ ගමනක් නැත, ධර්මය ප්‍රගුණකිරීමක් නැත. ප්‍රඥාව පහළවීමෙන් පසු, මෙතෙක් සම්පූර්ණ නොවූ සංයෝජන ද, මෙතෙක් යටපත්වී තිබූ උපාදානස්කන්ධය සම්පූර්ණවීම ද ඇරඹෙයි. 'සංකිච්චෙන පංච උපාදානස්කන්ධා දුක්ඛා' ලෙස බුද්ධ වචනයේ පෙන්වා ඇති 'දුක්ඛ ආර්ය සත්‍යය' දකින්නට නම් ඇස පහළවීමට පෙර විවිධ ධර්ම ප්‍රගුණ කිරීම නිසා මෙතෙක් යටපත්වී තිබූ පංච උපාදානස්කන්ධය සම්පූර්ණ වී තිබිය යුතුය.

***වම්මික සූත්‍රයේ පෙන්වා ඇති පරිදි තුඹස හාරමින් යනවිට දෙමන්හන්දිය හමුවෙයි. එතැනදී කුමන මාර්ගය තෝරාගනීම්දෝ යන ප්‍රශ්නය ඇතිවෙයි. නමුත් දේවතාවා කියන්නේ දෙමන්හන්දිය පැත්තකින් තියන ලෙසයි. මේ ප්‍රඥාව පහළ වීමයි.*** ප්‍රඥාව පහළ වීමෙන් පසු සත්ත්වයාට නිවන් දැකීම සඳහා ගමනක් ඇත, නමුත් එය අවබෝධයෙන් දැන ඉගෙනගත් මාර්ගයක් නොවෙයි. ප්‍රශ්නය කරතබාගෙන මාර්ගය සොයාගිය ඥාණවන්තයාට ප්‍රඥාව පහළවීමෙන් පසු විමුක්තිය පෙනෙයි. ප්‍රශ්නයෙන් නිදහස් වූ බැවින් උපසමාය යන චිත්ත ස්වභාවය ඇති වන්නේ ප්‍රඥාව පහළ වීමෙන් පසුවයි. එම චින්ත ස්වභාවය ගීතයකට නැළවෙන කුඩා දරුවෙකුගේ චිත්ත ස්වභාවය මෙනි. මෙතෙක් ප්‍රශ්නයක් ඔසවාගෙන ගිය හිස දැන් එම බරින් නිදහස් වී ඇත. බුද්ධවචනය දකින්නේ ප්‍රඥාව පහළ වූ අයෙකි. "මාගේ වචනය ප්‍රඥාවන්තයින් සඳහා පමණක්" යයි බුදුන් වහන්සේලා දේශනා කරන්නේ එබැවිනි.

ප්‍රඥාව පහළවීමෙන් පසුව වුවද කෙලෙස් සන්සිඳීමක් නැත. එසේම ඇස පහළවීමට ඥාන පහළවීමට සහ ප්‍රඥාව පහළවීමට ක්ලේශයන්ගේ සන්සිඳීමක් අවශ්‍ය වන්නේ ද නැත. සටනකදී ත්‍රිවිධ හමුදාවේ මූලික අරමුණ සතුරා විනාශකර දැමීමයි. සියලු සාමාජිකයෝ එම අරමුණ වෙනුවෙන් කඳවුරු බඳිති. යුධ කඳවුරක සිටින්නේ හේවායෝ පමණක් නොවෙති. හේවායන්ට ආහාර සපයන්නෝ ද සිටිති, ඔවුන්ට වෛද්‍ය සේවා සපයන වෛද්‍යවරු ද

හෙදියෝද සහායකයෝද සිටිති. හමුදාවට අණදෙන සේනාධිපති සහ හමුදාපති ද සිටිති. සියල්ලන්ගේම අරමුණ සතුරා නැසීම වුවත් මුළුතැන්ගෙයි ආහාර පිසින්නෝ සතුරා නොනසිති, වෛද්‍යවරු හෙදියෝ සේනාධිපති හමුදාපති යුධ කලාපයට ගොස් සතුරා නොනසිති. එසේම ශීලය, ශ්‍රද්ධාව, විරිය, සතිය, සමාධිය යන ධර්ම කෙලින්ම කෙලෙස් නොනැසුවත් එම ධර්ම කෙලෙස් නැසීමට උපකාරී වෙයි. ප්‍රඥාවේ කාර්යය (කෙලෙස්) සිඳ බිඳ දැමීමය. ප්‍රඥාව ස්වකිය කෘත්‍යය අවසන් කර නිරුද්ධ වෙයි. නැවත අවශ්‍ය විටක පැනනගියි. කඳවුරු බඳින්නට පෙර හේවායෝ සතුරා විනාශ නොකරන්නා සේ ප්‍රඥාව පහළවූ පමණින්ම සතුරා නැසීමේ කාර්යය ආරම්භ නොකරයි. කෙලෙස් සතුරා නසන්නට ද මනා සැලැස්මක් තිබිය යුතුය.

*සත්‍යය සොයාගිය මට ඥාන පහළවීමත් සමග ඇතිවූ ප්‍රශ්නය ‘පන්සිල් අටසිල් භාවනා ආදී ව්‍රත ධර්මයක් අනුගමනය කිරීමෙන් සත්‍යය හෙවත් නිවන දකින්නට හැකිවෙයිද’ යන්නයි. මේ ප්‍රශ්නයට ගුරුවරයෙකුගෙන් (ඉන්ද්‍රියයන්ගෙන්) පිළිතුරක් නොමැති බව මට පැහැදිලිවී තිබුණි. නමුත් ප්‍රශ්නයට පිළිතුරු සෙවීමේ කාර්යය අතනොහැරියෙමි. මේ වකවානුවේ මට දැනගන්නට ලැබුන පණිවුඩයකින් කියවුනේ ශ්‍රී ලංකාවේ සිරිවර්ධන නමැති ගිහි අයෙක් මාර්ගඵල ලබා ඇතිබවත් එතුමාගේ ධර්මය අසා මාර්ගඵල ලැබූ ස්වර්ණා නමැති කාන්තාවක් එංගලන්තයට පැමිණ ධර්ම දේශනා කරන බවත් ය. එතුමියගේ දේශනා කිහිපයක් දුරකථනය හරහා නවසීලන්තයේ සිටි කිහිප දෙනෙක් ශ්‍රවණය කර තිබුණි. තුන්වන වාරයේදී මට ද ඒ සඳහා අවස්ථාව ලැබුණි. එතුමියගේ දේශනාව ආරම්භයේදීම එතුමිය ප්‍රකාශ කලේ සිරිවර්ධන මහත්මා දේශනා කරන ධර්මය ශීල සමාධි ප්‍රඥා නොව ප්‍රඥා ශීල සමාධි බවයි. එය ඇසීමත් සමග මට මෙතෙක් මා තුල තිබූ ප්‍රශ්ණය අතුරුදහන් විය. ඒ මොහොතේම ප්‍රඥාව පහළ විය. නමුත් එය ප්‍රඥාව පහළවීමක් බව ඒ මොහොතේ නොදැන සිටියෙමි. එය ප්‍රඥාව බව මා දැන ගත්තේ අවු 10 ක් පමණ ගතවී මේ මෑතකදීය.*

මෙතැනදී එක දෙයක් පෙන්වා දීමට කැමැත්තෙමි. මම ප්‍රඥාව පහළ කර ගත්තේ එතෙක් පිළිගෙන තිබූ වැරදි ධර්මයක්

වෙනුවට නිවැරදි ධර්මයක් ඇසීමෙන් යයි ඔබ සිතන්නේ නම් එයද මුළාවකි. ඉන්ද්‍රිය මුළාවක් වූ පිළිගත් ධර්මය තුල හරි වැරැද්දක් නැත. මාර්ගය ආරම්භ වන්නේ ප්‍රඥාව ශීලය සහ සමාධිය ඒවාට ආවේනික වූ කාර්යයන් ඉටුකරමිනි. ප්‍රඥාව පහළවීමට පෙර බෞද්ධයෝ තමන් ඉගෙනගත් ආකාරයට ශීලයද සමාධියද ප්‍රගුණ කරති. ඇස පහළවීමට එම ප්‍රගුණ කිරීම උපකාරී වෙයි (කරුණාකර රථ විනීත සූත්‍රය බලන්න).

සිද්ධාර්ථ තවුසා ප්‍රඥාව පහළ කරගත්තේ කෙසේද? ඇස පහළ කරගත් සිද්ධාර්ථ තවුසාට මෙතෙක් කරගෙන ගිය දුෂ්කර ක්‍රියාව ගැන විචිකිච්ඡාව පහළ විය, ගවේෂණය ආරම්භ විය. ගුරුවරුන්ගෙන් නිදහස්විය. ඇස පහළවීමෙන් පසු මෙතෙක් කාලයක් කරගෙන ගිය ආකාරයට 'වීර්යය' නිවනට මගක් වේද යන ප්‍රශ්නය එතුමාට ඇතිවිය. ඒ සමගම ඥාන පහළ විය. සිද්ධාර්ථ තවුසා එක් දිනක් වීනාවක් වයමින් ගමන් කරන තරුණ කාන්තාවක් දිටීය. උන්වහන්සේ වීනාවෙන් නිකුත්වන කන්කළු නාදය කෙරෙහි සිත යොමු කළේය. මෙතරම් වූ මධුර නාදයක් වීනාවෙන් නිකුත් වුයේ වීනාවේ තත නියම ස්වරයට සුසර කර ඇති බැවිනි. ක්ෂණයකින් උන්වහන්සේට මෙවැනි අදහසක් පහළ විය: "වීනාවේ තත යම් ස්වරයකට සුසර කරන්නේ යම්සේද ඒ ආකාරයට මගේ විර්යය නිවනට සුසර කළ හැකි නොවේද?" සිදුහත් තවුසා තමන් පහළකරගත් ඥානය හරහා තව ඉදිරියට විමර්ශනය කරන්නට විය. විනාවේ තත යම් ස්වරයකට සුසර කරන විට එම ස්වරයේ සංඛ්‍යාතය දැනගෙන තිබිය යුතුය. එම සංඛ්‍යාතයට කන හුරුකරගෙන එම සංඛ්‍යාතය අධ්‍යයනය කර තිබිය යුතුය. විනා තතෙහි ආතතිය වැඩිකරමින් සහ එය නාදකරමින් එහි සංඛ්‍යාතය කනට හුරුකරගෙන තිබූ ස්වර සංඛ්‍යාතය සමග සමාන වන විට තත සුසර වෙයි (මෙය අනුනාදය ලෙස හඳුන්වයි). මේ ආකාරයට තමන්ගේ වීර්යය නිවනට සුසර කරන්නේ කෙසේද යන්න විමර්ශනය කල විට එතුමාට පෙනුනේ මෙතෙක් කාලයක් තමන් විසින් සොයාගිය 'නිවන' කුමක්ද යන්න තමන් නොදන්නා බවයි. නොදන්නා නිවනකට තමන්ගේ වීර්යය සුසර කරන්නට නොහැකි බව පෙනීයාමත් සමග සිද්ධාර්ථ තවුසාට ප්‍රඥාව පහළ විය. ප්‍රශ්නය ගිලිහිණි, නිසලබව (උපසමාය) ඇතිවිය.

කෝලිය උපතිස්ස යහළුවන් දෙදෙනා අද මෙන් එදා තිබූ ධර්ම ප්‍රගුණ කල තරුණයන් දෙදෙනෙකි. සංජය පිරිවැජියාගේ ගුරු උපදෙස් අනුව යමින් ඔහුගේ ධර්මයට අනුව හැසිරීමෙන් කෝලිය උපතිස්ස දෙදෙනා විමුක්තිය සොයා ගියහ. ධර්මය හදාරමින් සිටින විට ඔවුන් දෙදෙනාට ගුරුධර්ම කෙරෙහි විචිකිච්ඡාව පහළවිය. එයම ඇස පහළවීමට හේතුවිය. තම ගුරුවරයා අතහැර වෙනත් ගුරුවරුන් සොයාගොස් ඔවුන්ගේ ධර්ම ගැන ගවේෂණයක යෙදුනි. එකිනෙකට වෙනස් වූ ධර්ම ශ්‍රවණය කිරීමෙන් පසු ‘ගුරුවරුන්ගේ ධර්ම වලට අනුව හැසිරීමෙන් විමුක්තිය ලබාගත හැකිද’ යන ප්‍රශ්නය මේ දෙදෙනාට ඇතිවිය. එයම ඥාන පහළවීමට හේතුවිය. තමන්ගේ ප්‍රශ්නය වෙනකෙකු ලවා විසදාගැනීම ඥානවන්තයාගේ ලක්ෂණයක් නොවෙයි. නමුත් ප්‍රශ්නය අතහරින්නේත් නැත. ඔවුන් දෙදෙනා විමුක්තිය සොයා දෙමගක ගියහ. මෙසේ යනවිට උපතිස්සට ඈත තියාම දැමුණු ඉරියව් ඇති ශ්‍රමණයන් වහන්සේ නමක් දක්නට ලැබුණි. උන්වහන්සේ පිඩු සිඟා ආහාර වළදා විවේක සුවයෙන් වැඩසිටි කල උපතිස්ස උන්වහන්සේ හමුවී සතුටුසාමීචියේ යෙදිනි. ඔබවහන්සේ යම් ධර්මයක් දේශනා කරන ආගමික සාතෘවරයෙක් දැයි උපතිස්ස ඇසිය. උන්වහන්සේගේ පිළිතුර වුයේ “මම ආගමික සාතෘවරයෙක් නොවෙමි. ගෞතම බුදුන්වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.” යන්නයි. එදා උපතිස්සට මුණගැසුනේ අස්සජි මහා රහතන්වහන්සේ ය. ඒ ක්ෂණයෙන්ම උපතිස්ස නැවත පෙරලා ප්‍රශ්න කලේ “එහෙනම් ඔබේ ගුරුවරයා ඔබ හසුරුවන්නේ කෙසේද” යන්නයි. එයට උන්වහන්සේගේ පිළිතුර වුයේ: “යේ ධම්මා හේතුප්පභවා තේසං හේතුං තථාගතෝ ආහ --තේසං ච යෝ නිරෝධෝ ඒවං වාදී මහා සමණෝ -” යන්නයි. හේතුන් නිසා හටගත් යම් ධර්මයක් ඇත්ද එම හේතුන් බුදුන් වහන්සේ පෙන්වා දෙයි, ඒවායේ නිරෝධයත් පෙන්වා දෙයි.

පළමු ගාථා පද දෙක ශ්‍රවණය කරන විටම උපතිස්සට ප්‍රඥාව පහළවිය (ඊටපසු විද්‍යාවත් ආලෝකයත් පහළවිය). උපතිස්සගේ ප්‍රශ්නය එකකි. නමුත් ඔහු ඇසුවේ අනෙකකි. ධර්මයට අනුව හැසිරීමෙන් විමුක්තිය සොයාගත හැකිද යන්න ඔහුගේ ප්‍රශ්නයයි. නමුත් ඔහු ඇසුවේ “ඔබගේ ගුරුවරයා ඔබ හසුරුවන්නේ කෙසේද “ යන්නයි. යමෙක් හැසිරෙන්නේ ධර්මයට අනුවය. ඔහු ඇසුවේ මේ

ධර්මය ගැනයි. අස්සජි තෙරුන්ගේ පිළිතුර වුයේ ධර්මය හටගන්නේ හේතුන් නිසා බවයි. මේ හේතු නිරෝධ වන විට ධර්මයද නිරෝධ වන බැවින් හේතුන් නිසා ඇතිවන ධර්මයට අනුව හැසිරීමෙන් විමුක්තිය ලගාකරගත නොහැකිය. උපතිස්සට ප්‍රඥාව පහළවිය. උපතිස්ස අස්සජි තෙරුන් වහන්සේගේ ධර්මය පිළිගත්තේ නැත. නමුත් වර්තමානයේ සියලු දෙනාම වාගේ හේතුඵල වාදය පිළිගනිති. ඔවුහු හේතුන් නිසා හටගත් ධර්මයට අනුව හැසිරී විමුක්තිය සොයති. මේ විමුක්තිය තාවකාලිකය.

සුනීත කුලහීන කසලශෝධක තරුණයෙකි. ඔහුට තක්සලාව තහනම් තැනකි. තක්සලාවෙන් පිටවන තරුණ කුමාරවරු වසුරුකඳ කර තබාගෙන යන සුනීතට උසුළුවිසුළු කරති. එය අසන සුනීත මුවින් නොබැණ මෙසේ මුමුණයි; මම නම් මේ වසුරුකඳ රැගෙන යන්නේ කරේ තබාගෙනය, නමුත් ඔබලා එය හිසේ තබාගෙන යයි''.

සුනීත ධර්මයට වසුරු යයි ගැරහු අයෙකි. සුනීතට තක්සලාව තහනම් වුයේ එහි විපාක වශයෙනි. නමුත් ඔහුට වසුරුකඳ ගැන මනා දැනුමක් තිබුණි. තක්ෂිලාවට ගිය කුමාරවරු උසස් රැකියා කරනවිට සුනීතට ඔහුගේ පිළිගැනීම (ධර්මය වසුරු යයි පිළිගැනීම) ගැන විචිකිච්ඡාව පහළවිය. එයම ඇස පහළවීමට හේතුවිය. සුනීතට ඥාණ පහළවනවිට මුළු ධර්මය කෙරෙහිම සැක පහළ වී තිබුණි. ධර්මය යනු වසුරුද යන ප්‍රශ්නය ඔහු තුළ තිබුණි. එම නිසා ඔහු මේ වසුරුකඳ කරතබාගෙන ගියේය. එක් දිනක සුනීත යන ගමන්මගෙහි බුදුන් වහන්සේ ඉදිරියට හමුවිය. බුදුන් වහන්සේට පාර ඉඩදී පැත්තකට විය. බුදුන් වහන්සේ ඇසුවේ එක පැනයකි; "සුනීත ඔබ කැමතිද ඔය වසුරුකඳ බිම තබන්න". ඔහු ළඟ තිබු වසුරුකඳ නම් අන්ත දෙකකින් යුත් ධර්මයයි. ඔහු ඒ වසුරුකඳ බිමතැබුවේය. ප්‍රඥාව පහළවිය, අවසානයේ රහත්විය. රහත්වුවෙක් කිසිම රැකියාවක නිරත නොවන බැවින් කරමත තිබු වසුරුකඳ ද බිම තැබුවේය.

භාහිය දාරුචිරිය සළුපිළි ඉවතදමා දරපතුරු දවටාගත් අයෙකි. ඔහු ඇසෙන් කනෙන් නාසයෙන් දිවෙන් හා ශරීරයෙන් ග්‍රහණය කරන්නට ධර්මයක් නැතැයි යන පිළිගැනීම තුල සිටි කෙනෙකි. නමුත් ගෞතම බුද්ධ පහළවී ධර්ම දේශනා කරන බව

අසන්නට ලැබීමෙන් ‘දේශනා කරන්නට ධර්මයක් නැත’ යන පිළිගැනීමේ සිටි දාරුචිරියට තමන්ගේ ධර්මය ගැන සැක පහළවිය. ඔහුට ඇස සහ ඥාන පහළ විය. ඔහු යොදුන් 2500 ක් මග ගෙවාගෙන ගෞතම බුදුන් වහන්සේ හමුවන්නට ගියේය. ඥාන පහළවූ පසු තමන්ගේ ප්‍රශ්නය සංසිදෙන තෙක් සිතට නිදහසක් නැත. ප්‍රශ්නය සැමවිටම හිසමත දරාගෙන සිටියි. යොදුන් ගණන් මග ගෙවාගෙන ප්‍රශ්නයට පිළිතුරු සොයායන්නේ එබැවිනි. භාහියට බුදුන් වහන්සේ හමුවන විට උන්වහන්සේ පිඬුසිඟා වඩින වෙලාවයි. භාහියට තිබු ප්‍රශ්නය ‘දේශනා කරන්න ධර්මයක් තිබේද’ යන්න වුවත් බුදුන් වහන්සේගෙන් ඒ ප්‍රශ්නය නැසුවේය. “මට ධර්මයක් කියන්නය”යි භාහිය බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. නමුත් ඔහුට පිළිතුරු ලෙස ලැබුනේ අනෙකකි; “මේ ධර්මය කියාදෙන්න වෙලාවක් නොවෙයි, පිඬුසිඟා වඩින වෙලාව”. දෙවන වරටත් භාහිය ධර්මයම ඉල්ලා සිටියේය. බුදුන් වහන්සේගෙන් පළමු පිලිතුරම ලැබුණි. තුන්වෙනුව බුදුන් වහන්සේට පිළිතුරු නොදී සිටිය නොහැකි විය. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති
සුතේ සුත මත්තං භවිස්සති
මුතේ මුත මත්තං භවිස්සති
විඤ්ඤතේ විඤ්ඤාත මත්තං භවිස්සති”

දැක්ක දේ තුල ඇසු දේ තුල ඉන් එහා ගමනක් නැති බවයි බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ. ‘දැක්කා දැක්ක පමණයි’ ආදී වශයෙන් සාමාන්‍ය ව්‍යවහාරයෙදී එම ගාථාවේ තේරුම දෙයි. එම දේශනාව අවසන් වනවිට දාරුචිරිය විඥානයේ උපත ලැබුවේය. දාරුචිරිය අසන්නට දකින්නට රස ගඳ ස්පර්ශ සහ විඥානය පෝෂණය වන්නට ධර්මයක් නැතිබව ඉන්ද්‍රිය ඉක්මවා දැක්කේය. එනම් සත්ධර්මය ශ්‍රවණය කළේය. දාරුචිරිය මේ සත්ධර්මය අසා තමන්ගේ ප්‍රශ්නයෙන් නිදහස්විය. ප්‍රඥාව පහළ කරගෙන අවසානයේ රහත්විය.

මේ බුද්ධ දේශනාව ඇසු දරපතුරු දවටාගෙන සිටි දාරුචිරිය ඇඳ ගැනීමට රෙදි කැබැල්ලක් සොයා මහමඟ යනවිට ගොනෙක් ඇන පිරිනිවන් පෑහ. රහත් වුවත් ඔහුට රෙදි කැබැල්ලක් ඉන දවටා ගැනීමට නොහැකිවිය, දේශනා කිරීමට ධර්මයක් නොමැතිවිය. ගෞතම බුදුන්වහන්සේ දාරුචිරියට දේශනා කල මේ ධර්මය ප්‍රගුණ

කරන අය අදත් සිටිති. ඇසවත් පහළවී නැති ඔවුහු 'අසන්නට, කියන්නට, විඥ්ඥාණ ගතවන්නට ධර්මයක් නැත' යන්න පුරුදු පුහුණු කරති. තථාගතයන් මේ පුහුණුවේ වරදක් දකින්නේද නැත. මෙසේ පුහුණු වෙමින් සසර ගමන් කරන ඔවුහු යම් කාලයකදී සළුපිලි උනා තබා දරපතුරු දවටාගනිති. සළුපිලි යනු ධර්මයයි. දාරුචිරියලාට ඇති එකම ධර්මය 'දේශනා කරන්නට ධර්මයක් නැත' යන දරපතුරුයි. ඇස පහළනොවී මෙසේ බිහිවන දාරුචිරියලාට පංච උපාදානස්කන්ධයක් නැත. සංයෝජන 10 සම්පූර්ණ නොමැති ඔවුහු මනුෂ්‍යයයෝ නොවෙති, තණකොළ ආහාරයට ගන්නා හරකෙක් හා සමානය (හරකෙක් ඇන දාරුචිරිය පිරිනිවන් පෑවේ එබැවිනි). යම් දවසක මේ දාරුචිරියලාට තමන් ඉන්නා තැන ගැන සැක පහළ වී 'බුදුන්' සොයාගොස් අවසානයේ ඉන දවටාගැනීමට වස්ත්‍රයක් නැතිවම රහත් වෙති.

ආලවක යක්ෂයාද විමුක්තිය සෙවීමේ පරමාර්ථයෙන් යම් ධර්මයක් ප්‍රගුණ කල අයෙකි. ඔහුගේ ධර්මතාවය වුයේ සිතුවිලි මරාදමා **'චින්තනනයෙන් එහා'** ඇති නිවනක් සෙවීමයි. ආලවක යක්ෂයාට දිනපතා දරු බිල්ලක් ලැබුණි. ඔහු දිනපතා එක් දරුවෙකු බැගින් ආහාරයට ගත්තේය. මෙහි දරුවා යනු සිතුවිලිය. රටේ රජ්ජුරුවෝ ආලවක යක්ෂයාගෙන් තමන්ගේ ජීවිතය බේරා ගත්තේ දිනකට එක් දරුවෙකු බැගින් යක්ෂයාට බිලිදීමට පොරොන්දු වීමෙනි. රාජපුරුෂයෝ රජ අණ පිළිපදිමින් නගර වැසියන්ගේ දරුවන් ආලවක යක්ෂයාට බිල්ලට දෙති. ඔබ තුල ක්‍රියාත්මකවන රාජ්‍යයේ රජතුමා නම් තණ්හාවයි. නගර වැසියන්ගේ දරුවෝ නම් සංස්බාර ධර්ම නිසා උපදින සිතුවිලිය. ආලවක යක්ෂයා කලේ සංස්බාර ලෝකය නිර්මාණය කරන හොඳනරක පව්පින් ආදී සිතුවිලි පහළවනවිටම මරාදැමීමයි. හොඳ නරක තේරුම්ගත නොහැකි ආලවක යක්ෂයාගේ විමානය නම් 'විඥානයයි'. ආලවක යක්ෂයාගේ හදවතේ තෙතමයක් නොමැත. ආදරය කරුණාව වැනි ගුණාංග නැති යක්ෂයා තුල වේදනාව (වේදනා උපාදාන ස්කන්ධය) යටපත්වී තිබුණි. බුදුන් තම විමානයට වඩින විට ආලවක යක්ෂයා නගරයේ සියළුම දරුවන් ආහාරයට ගෙන අවසන්කර තිබුණි. සිතුවිලි (දරුවන්) මරාදමා චින්තනයෙන් එහා ගොස් විමුක්තිය සොයන ආලවක යක්ෂයෝ අදත් සිටිති. සිතුවිලි වලින් තොරවනවිට

විචක්ෂණය යටපත්වන බැවින් මේ යක්ෂයන් තුල ධර්ම ගවේෂණයක් නැත. එසේවුවත් සංස්කාර ධර්ම මරාදැමූ ආලවක යක්ෂයාටද ඇස පහළවිය, ඥාන පහළවිය, ප්‍රඥාව පහළවිය. ඒ කෙසේද?

දිනපතා එක් දරුවෙකු බැගින් යක්ෂයාට බිල්ලට දී අවසානයේ රාජපුරුෂයින්හට එක දරුවෙකුවත් සොයාගැනීමට නොහැකිවිය. ඒ බව රජතුමාට දැන්වූ කල රජතුමාට මරණ භය ඇතිවිය. තමන්ගේ ජීවිතය බේරාගැනීමට දරුවෙකු බැගින් බිල්ලට දීම ඔහු යක්ෂයාට වූ පොරොන්දුවයි. දැන් මුළු රාජ්‍යටම ඉතිරි වී ඇත්තේ තමන්ගේ දරුවා පමණි. මෙතෙක් අනුන්ගේ දරුවන් බිල්ලට දී ජීවිතය බේරාගත් රජතුමාට දැන් තමන්ගේ දරුවා බිලිදීමට සිදුවී ඇත. **චින්තනයෙන් එහා** ගොස් විමුක්තිය සොයන අයට යම් දවසක ඇස පහල වන්නේ තමන්ගේ දරුවා බිල්ලට දීමට සිදුවන විටයි. තමන්ගේ දරුවා බිල්ලට දීමට සිදුවන විට වේදනා උපාදානස්කන්ධය මතුවී මනෝසංචේතනා පහළවෙයි. මෙතෙක් යටපත් කරගෙන සිටි වේදනා උපාදාන ස්කන්ධය මතුවූ අවස්ථාව මෙයයි. මෙතෙක් තමන් ප්‍රගුණ කල (චින්තනයෙන් එහා ගොස් විමුක්තිය සෙවීමේ) මාර්ගය ගැන ආලවක යක්ෂයින්ට විචිකිච්චාව ඇතිවී ඔවුන්ට ඇස පහළවන්නේ තමන්ගේ දරුවා බිල්ලට දීමට සිදුවන අවස්ථාවට පැමිණිවිටයි. රජතුමාගේ දරුවා බිල්ලට දීමට රැගෙන යනවිට වෙනදා සිදුනොවන්නක් එදා සිදුවී තිබුණි. ආලවක යක්ෂයා කැලයට ගොස් තිබුණි. කැලයෙන් පෙන්වන්නේ පංච උපාදානස්කන්ධයයි. වේදනා ස්කන්ධයේ මතුවීම එයින් පෙන්වයි. ආලවක යක්ෂයාට මෙතෙක් ප්‍රගුණ කල ධර්මය නිරෝධ විය, ඇස පහළවිය. නැවත විමානයට යනවිට බුදුන්වහන්සේ විමානයේ වැඩ සිටියහ. බුදුන්ගේ ආගමනය දරුවා මරාකෑමට බාදාවකි. ආලවක යක්ෂයා බුදුන්වහන්සේට විමානයෙන් පිටව යාමට අණ කළේය. අණට කීකරු වූ බුදුන්වහන්සේ විමානයෙන් පිටවිය. අණකළ පමණින්ම බුදුන්වහන්සේ පිටව ගියේ ඇයිදැයි යක්ෂයාට සැක ඇතිවිය. එය ඇස පහලවූ පසු ඇතිවන විචිකිච්ඡාවයි. සැකය දුරුකරගැනීමට යක්ෂයා බුදුන්වහන්සේට විමානය තුලට පැමිණීමට නැවත අණකළේය. බුදුන්වහන්සේ ආපසු වැඩියහ. මේ යක්ෂයන් දමනය කරන ක්‍රමයයි. ඔවුන් තුල සංස්කාර ලෝකයක් නොමැති

බැවින් ධර්මයක් දේශනාකර යක්ෂයෝ දමනය කල නොහැකිය. "මේ ශ්‍රමණයා විඩාවට පත්කර මරාගෙන කමි" යි සිතු යක්ෂයා බුදුන් වහන්සේට නැවත පිටව යාමට අණ කළේය. දෙවන වර ද තුන්වෙනි වර ද පිටව ගොස් නැවත පැමිණියද හතරවෙනි වර විමානය තුලම උන්වහන්සේ නතරවූයේ නැවත විමානයෙන් පිටනොවන බව ප්‍රකාශ කරමිනි. ආලවක යක්ෂයා තුල කාශ්‍යප බුදුන් වහන්සේගේ කාලයේ සිට රැගෙන ආ ප්‍රශ්න දහයක් තිබුණි. ආලවක යක්ෂයා මේ ප්‍රශ්න දහය දුම්මැස්සෙන් එලියට ගත්තේ ගෞතම බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න කිරීමටයි. එය ඥාණ පහළවීමයි. ආලවක යක්ෂයාට ප්‍රඥාව ගැන ප්‍රශ්නයක් ඇතිවිය. එබැවින් යක්ෂයා ගෞතම බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න කලේ "ප්‍රඥාව පහළ කර ගන්නේ කෙසේද" යන්නයි. බුදුන්වහන්සේගේ පිළිතුර වුයේ "ඇසීමෙන් ප්‍රඥාව ලැබෙයි **(සුස්සූසා ලභතෙ පඤ්ඤං)**" යන්නයි. අසන්නේ කුමන ධර්මයක් ද යන ප්‍රශ්නයට ගෞතම බුදුන් වහන්සේගේ පිළිතුර වුයේ **අප්පමත්තො විචක්ඛණො** යන්නයි. ආලවකයාට ප්‍රඥාව පහළවිය.

ආලවක යක්ෂයා ඉහත ප්‍රශ්ණය ඇසුවේ ඥාණ පහළවූ පසුවයි. ඥාණවන්තයා තුල ධර්ම පිලිගැනීමක් නොමැති බැවින් සැමවිටම විචක්ෂණය ඇත. මේ විචක්ෂණම ඥානවන්තයාගේ ප්‍රමාදයට හේතුවෙයි. විචක්ෂණය පහවනතෙක් විමුක්තිය නැත. ගෞතම බුදුන් වහන්සේ ආලවක යක්ෂයාට ප්‍රකාශ කලේ (විචක්ෂණය නිසා ප්‍රමාද වන බැවින්) අප්‍රමාදයට හේතුවන ධර්මයක් ශ්‍රවණය කලයුතු බවයි **(අප්පමත්තො විචක්ඛණො).** අප්‍රමාදයට හේතුවන්නේ සත්ධර්මයයි. ඥාණවන්තයාට පමණක් කළහැකි සත්ධර්ම ශ්‍රවණයත් සමගම විචක්ෂණයෙන් නිදහස් වී ප්‍රඥාව පහළවෙයි. ප්‍රඥාව පහළ කරගන්නා විට ධර්මය විචක්ඛයෙන් තොරවම ඉන්ද්‍රිය හයම ඉක්මවා ශ්‍රවණය කරයි. ඇසවත් පහළ නොවූ අයෙකුට විචක්ෂණයෙන් තොරව ධර්මය ශ්‍රවණය කිරීමට පුරුදු පුහුණු වී ප්‍රඥාව පහළ කරගත නොහැකිය. පුරුදු පුහුණු කිරීම තුල ප්‍රඥාව ඉගෙන ගනියි, ප්‍රඥාව වඩයි. නමුත් ඔවුන්ට ප්‍රඥාව පහළ නොවෙයි. ලැජ්ජාව කුමක්දැයි නොදන්නා ලැජ්ජාව නැති අයෙකුට ලැජ්ජාව කුමක්දැයි ඉගෙනගෙන, පුරුදු පුහුණු වී ලැජ්ජාව ඇතිකර ගත නොහැකිය. ධර්මය ප්‍රගුණ කර පුරුදු පුහුණු වී ප්‍රඥාව වැඩීමෙන්

ප්‍රඥාව පහළකර ගැනීමට යමෙක් දරන උත්සාහය විර්යය වැඩීමෙන් ලැජ්ජාව ඇතිකර ගැනීමට දරන උත්සාහය මෙනි.

**ආලවක යක්ෂයා සත්ධර්මය ශ්‍රවණය කර ප්‍රඥාව පහළ කරගත්තේය. ආලවක යක්ෂයාට දේශනා කල ධර්මය ඉන්ද්‍රිය ධර්මයක් ලෙස ප්‍රගුණ කරමින් ප්‍රඥාව පහළ කරගැනීමට වීර්ය දරන සත්ත්වයෝ සැමදා සිටිති. ඔවුන් විචක්ෂණයෙන් තොරව ධර්මය ශ්‍රවණය කිරීමට පුරුදුපුහුණු වෙති. මේ ප්‍රගුණ කිරීම තුලින් වන්නේ සත්ත්වයා නැවත අන්තයකට වැටීම පමණි. එමගින් ආලවක යක්ෂයෙක්ම නැවත බිහිවෙයි.**

දේශනා කරන යම් ධර්මයක් ඇත්නම් එය ඉන්ද්‍රිය ධර්මයකි. සත්ධර්මය දේශනා කලහැකි ධර්මයක් නොවෙයි. බුදුවරයෙකුටවත් සත්ධර්මය දේශනා කල නොහැකිය. දේශනා කරන්නේ වචනයි. වචනවල මූලය මුළාවයි. එය ඉන්ද්‍රිය භයේ ධර්මයකි. නමුත් බුදුවරයෙකුගේ හෝ වේවා ගුරුවරයකුගේ හෝ වේවා යම් ධර්මයක් ඉන්ද්‍රියයන් ඉක්මවා ශ්‍රවණය කර (සත්ධර්මය ශ්‍රවණය කර) ප්‍රඥාව පහළකර ගැනීමේ හැකියාව ඥානවන්තයාට ඇත.

***ප්‍රඥාව පහළ වීමෙන් පසු කවරෙකුගේ ධර්මයකට සවන් දුන්නද ප්‍රඥාවෙන් ධර්ම තෝරාබේරා ගැනීමේ හැකියාව ඇත. වම්මික සූත්‍රයේ ප්‍රඥාවේ ස්වභාවය උපමා කරන්නේ පෙරහන් කඩකටයි. දෙමංහන්දිය පැත්තකින් තබා ප්‍රඥාව පහළ වූ පසු තවදුරටත් තුඹස කනිනවිට පෙරහන්කඩක් හමුවෙයි.*** බුදුන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරන්නේ ලෝකෝත්තර අර්ථයකින් වුවත් ඇස පහළ නොවූ පෘතග්ජනයා එය ඉන්ද්‍රිය මුළාවෙන්ම ග්‍රහණය කරයි. ගුරුවරයා ධර්මය දේශනා කරන්නේ ලෞකික අර්ථයකින් වුවත් ප්‍රඥාවන්තයාට එහි ලෝකෝත්තර ස්වභාවය දැකීමේ හැකියාව ඇත. ප්‍රඥාව මඳකමින් සමහර ධර්ම දැකීමේ හැකියාව ආරම්භයේදී නොමැති වුවද එම ධර්ම පසුව දකියි. උදාහරණයක් ලෙස ඥාන පහළ වූවිට මට තිබූ ප්‍රශ්නය පන්සිල් අටසිල් සහ භාවනා ආදී ව්‍රත නිවන් දැකීමට අවශ්‍යයද නැද්ද යන්නයි. ප්‍රඥාව පහළ වන විට මම එම ප්‍රශ්නයෙන් නිදහස් වූවෙමි. එහි තේරුම මෙම ව්‍රත ධර්ම නිවන් දැකීමට අවශ්‍ය නැත යන්න නොවෙයි. ප්‍රඥාව පහළවූ විට එක්

අන්තයකටවත් වැටෙන්නේ නැත. නමුත් ඉතා මෑතකදී සතුන් මැරීම සොරකම් කිරීම ආදී ක්‍රියාවලින් සත්ත්වයා තිරිසන් භවවල උපත ලැබියහැකි බව මම දුටුවෙමි. එය ගෞතම බුදුන් වහන්සේද විවිධ තැන්වල දේශනා කර ඇත.

ඇස පහළ වන්නට පෙර සත්ත්වයා චතුරාර්ය්‍ය සත්‍යය ඉගෙන ගනියි, ප්‍රගුණ කරයි. සම්මාදිට්ඨියෙන් ආරම්භ වන ආර්යාෂ්ඨාංගික මාර්ගයද ප්‍රගුණ කරයි. වචන වල තේරුම ඉගෙනගෙන චින්තනය හරහා චතුරාර්ය සත්‍යය සහ ආර්යාෂ්ඨාංගික මාර්ගය වඩයි. එය අන්ධානුකරණයේ ප්‍රතිඵලයකි. ප්‍රඥාව පහළවීම වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ප්‍රඥාව පහළවූ පසු චතුරාර්‍ය්‍ය සත්‍යය සහ හේතුඵල ධර්මය දකින බැවිනි. චතුරාර්ය සත්‍යය දැකීමට චතුරාර්ය සත්‍යය ඉගෙන ගැනීමට අවශ්‍ය නැත. එබැවින් බුදුදහම හෝ චතුරාර්ය සත්‍යය ගැන කිසිත් නොදන්නා ඕනෑම ආගමිකයෙකුට ප්‍රඥාව පහළවීමෙන් චතුරාර්ය සත්‍යය දැකිය හැකිය. යෝගාවචරයා ප්‍රගුණකරන චතුරාර්ය සත්‍යය හෝ ආර්යාෂ්ඨාංගික මාර්ගය තුළ නිවන් මාර්ගය නැත. චතුරාර්ය සත්‍යය හෝ ආර්යාෂ්ඨාංගික මාර්ගය යනු වැඩියයුතු හෝ ප්‍රගුණ කලයුතු ධර්ම නොවන බැවින් ප්‍රඥාව පහළ කරගත් කෙනෙකුට මජ්ඣිමා පටිපදා ලෙස ධම්ම චක්ක සූත්‍ර දේශනාවේ හඳුන්වා ඇති මාර්ගයේ ගමන් කිරීමට චතුරාර්ය සත්‍යය හා ආර්යාෂ්ඨාංගික මාර්ගය අවබෝධකරගැනීම අවශ්‍යය නැත.

පංච උපාදානස්කන්ධයම ‘දුක්ඛ’ වන බැවින් දුක්ඛ සත්‍යය දකින්නට පංච උපාදානස්කන්ධය සම්පූර්ණ විය යුතුය. එබැවින් ප්‍රඥාව පහළවූ ප්‍රඥාවන්තයා තුල පංච උපාදානස්කන්ධය සම්පූර්ණ වනතෙක් චතුරාර්ය සත්‍යය දැකිය නොහැකිය. එහි පළමු දැකීම නම් ‘දුක්ඛ’ හෙවත් ‘සක්කාය’ හෙවත් පංච උපාදානස්කන්ධය දැකීමයි (සීහනාද සූත්‍රය බලන්න). ළදරුවියේ සිට මවගේ ආදරය සහ සෙනෙහස නොලැබුන කුමාරකස්සප හැදුනේ වැඩුනේ රජු යටතේ නාට්‍යාංගනාවන්ගේ සෙවණේය. එහි ප්‍රතිඵලයක් ලෙස සත් අවුරුදු වයසෙන් මහණ වූ කුමාරකස්සප සාමණේරයන්ට වේදනා ස්කන්ධය මතු නොවුනි. ආදරය සෙනෙහස ආදී කෙලෙස් වේදනා ස්කන්ධයත් සමග පැනනගින ධර්මතාවෝය. ප්‍රඥාව පහළ වී සිටි කුමාරකස්සප

පංච උපාදානස්කන්ධය සම්පූර්ණ වනතෙක් අන්ධවනයට වී බොහෝ කලක් සිටින්නට සිදුවිය. ***උන්වහන්සේ රහත් වුයේ වම්මික සූත්‍ර දේශනාවෙනි.***

***වම්මික සූත්‍රයේ පෙන්වන පරිදි දෙමංහන්දිය පැත්තකින් තැබූ පසු පෙරහන්කඩ හමුවෙයි. තවදුරටත් තුඹස හාරන විට ඊළගට ඉබ්බෙකු හමුවෙයි. සූත්‍රයේ පෙන්වන මේ ඉබ්බා නම් පංච උපාදානස්කන්ධයයි. මෙතන පෙන්වන්නේ ද චතුරාර්ය සත්‍යයේ පළමු ආර්ය සත්‍යයයි.***

දෙවන ආර්ය සත්‍යය දුක්ඛ (සක්කාය) සමුදයයි. පටිච්චසමුප්පාදය අනුව මේ උපාදානයට හේතුව තණ්හාවයි (..... වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදාන...). තණ්හාව යනු ලෝභය හෝ තෘෂ්ණාව හෝ රාගය හෝ නොවන බවවත් අඩුතරමින් තේරුම් ගතයුතුය. මේ තණ්හාව කුමක්ද යන්න වචන වලින් තොරව දකින්නේ ප්‍රඥාව පහළවූ පසුවයි.

තුන්වන ආර්ය සත්‍යය දුක්ඛ (සක්කාය) නිරෝධ සත්‍යයයි. පංච උපාදානස්කන්ධයට හේතුව තණ්හාවයි. මේ තණ්හාව කාම තණ්හා, භව තණ්හා සහ විභව තණ්හා යනුවෙනි තෙවදැරුම්ය. 'දුක්ඛ' පංචඋපාදානස්කන්ධයේ ප්‍රතිඵලයකි. එමනිසා දුක්ඛ නිරෝධය සඳහා තෙවදැරුම් තණ්හාව නිරෝධ කල යුතු බවයි බොහෝ ධර්මධාරි ගුරුවරුන්ගේ පිළිගැනීම. එමනිසා බොහෝ යෝගාවචරයන් තණ්හාව නැති කිරීමට කායික සහ මානසික වීර්යය යොදන්නේ අඩුතරමින් තණ්හාව යනු කුමක්ද යන්නවත් නොදැකය. ඔවුන් නිරෝධ කරන්න උත්සාහ කරන්නේ ඉන්ද්‍රියයන්ගෙන් දැන ඉගෙනගත් තණ්හාවකි.

තණ්හාවට හේතුව නොසොයා තණ්හාව නැතිකළ හැකිද? අස්සජි මහා රහතන්වහන්සේ උපතිස්සට දේශනා කල ධර්මය බලන්න. "හේතුන් නිසා හටගත් යම් ධර්මයක් ඇත්ද එම හේතුන් බුදුන් වහන්සේ පෙන්වා දෙයි, ඒවායේ නිරෝධයත් පෙන්වා දෙයි." ඔබට තණ්හාව තිබේනම් තණ්හාවට හේතුවක් ඇත. එබැවින් මේ තණ්හාව නිරෝධ කලහැක්කේ එම හේතුව නිරෝධ කිරීමෙන්

පමණි. හේතුඵල ධර්මය සත්ත්වයා තුල ප්‍රමුඛ වන්නේ විද්‍යාව පහළවීමෙන් පසුවයි. එතෙක් සක්කායදෘෂ්ඨිය ප්‍රමුඛ වෙයි. නමුත් යෝගාවචරයෝ ඇස පහළවීමටත් පෙර සිට පටිච්චසමුප්පාදය ප්‍රගුණ කරති. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු නැවත අන්ත වලටම අසුවෙති.

මම පටිච්චසමුප්පාද ධර්ම ප්‍රගුණ නොකෙලෙමි. තණ්හාවට හේතු නොසෙව්වෙමි. නමුත් මම ප්‍රඥාව පහළවීමෙන් පසු දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය දැක මාර්ගය පහළ කරගත්තෙමි. ඒ සඳහා ධර්ම දැනගැනීම හෝ ධර්ම ප්‍රගුණ කිරීම හෝ අවශ්‍ය නැත. යමෙක් තණ්හාවට, වේදනාවට, ඵස්සයට හේතුව සොයමින් පටිච්චසමුප්පාද ධර්මය ප්‍රගුණ කරනවා නම් එයත් අවබෝධකරගත් ඉන්ද්‍රිය ධර්මයකි. ඇස පහළවීමට පෙර එම ධර්මයද නිරෝධ විය යුතුය.

නිරෝධ සත්‍යය ආකාර තුනකින් දකින බව දම්සක්පැවතුම් සූත්‍රයේ පෙන්වා දෙයි;

1 දුක්ඛ නිරෝධ පිලිබඳ ආර්ය සත්‍යය

2 ඒ දුක්ඛ නිරෝධ වීමේ ආර්ය සත්‍යය සාක්ෂාත් කලයුතු බව

3 ඒ දුක්ඛනිරෝධ වීමේ ආර්ය සත්‍යය සාක්ෂාත් කරගත් බව.

දුක්ඛ නිරෝධය, දුක්ඛ නිරෝධය සාක්ෂාත් කලයුතු බව, සහ සාක්ෂාත් කරගත් බව යන මේ කරුණු තුනම සම්පූර්ණ වන්නේ මාර්ගයේ ගමන්කර ආර්ය අෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ කිරීමෙන් පසුවයි. තවම ආර්ය අෂ්ඨාංගික මාර්ගය ආරම්භවී නැත. මෙතැනදී සම්පූර්ණ වන්නේ ආකාර තුනෙන් පළමුවැන්න පමණි. නමුත් ප්‍රඥාව පහළවුවිට මාර්ගය පෙනෙයි. ප්‍රඥාව පහළ වූ පසුද තණ්හාව ඇතුළු අනෙක් සියලුම උපක්ලේශයන් නොඅඩුව පවතියි. මාර්ගයේ ගමන්කරන විට කෙලෙස් නැසී යනවා විනා කෙලෙස් නසමින් යන ගමනක් තථාගත මාර්ගය තුල නැත. කෙලෙස් නසමින් යන මාර්ගය තුල දරාගත් ධර්මයක් ඇත. නමුත් නිවන් මාර්ගය තුල එසේ ප්‍රගුණ කරමින් යන ධර්මයක් නැත. ඇස පහළවන විටම ධර්මය නිරෝධ වෙයි. දරාගත් පිළිගත් ධර්මයක් ඇස පහළ වූ පසු නැත.

රථ විනීත සූත්‍රයට අනුව චිත්ත විශුද්ධිය නමැති දෙවන රථයෙන් පටිපදා පරිනිර්වාණය කරා යන ගමනේදී යම් අවස්ථාවකදී චිත්ත විශුද්ධියේ ගමන සම්පූර්ණ වෙයි. එය ප්‍රඥාව පහළවීමයි. එවිට චිත්ත විශුද්ධිය නමැති රථය රථගාලේ නවතා දෘෂ්ඨි විශුද්ධිය නමැති රථයට නගියි. ප්‍රඥාව පහළවනවිට චිත්තයේ පිරිසිදුවීම සම්පූර්ණ වන්නේ තවදුරටත් සංස්කාර ලෝකය තුල උපතක් සිදුනොවන බැවිනි. සංස්කාර ධර්ම පිළිගැනීම නිසා දෘෂ්ඨිගත වූ සත්ත්වයා තුල දැන් එම දෘෂ්ඨියේ පිරිසිදු වීම ඇරඹෙයි. මේ අනුපාදා පරිනිර්වාණය දක්වා යන ගමනේදී හමුවන තුන්වන රථයයි.

ප්‍රඥාව පහළපහළ වූ පසු චිත්ත විශුද්ධිය නමැති රථය රථගාලේ නවතන බැවින් කෙලෙස් ප්‍රහීණ කරමින් නිවන් සොයායන ගමනක් ප්‍රඥාවෙන් පසු නැත. එය කෙලෙස් ප්‍රහීණ කරමින් රහතුන් වැඩිමග ඔස්සේ යමන් කරන යෝගාවචාරයෝ අඩුතරමින් තේරුම්ගත යුතුය. රෙදිකඩක් සහ රජකයෙක් උපමාකොට ගෞතම බුදුන්වහන්සේ දේශනා කල වත්ථූපම සූත්‍රය කෙලෙස් සහිතව මාර්ගයේ ගමන් ගන්නා ආකාරය පෙන්වයි. එදා තිබුන හින්දු දහමට අනුව ඔවුන් විශ්වාස කලේ කෙලෙස් ප්‍රහීණ කර නිවන් සොයායන මාර්ගයකි. දැනුදු යෝගාවචරයා තුල ක්‍රියාත්මක වන්නේ එවැනි මාර්ගයක් බව මට පෙනීගියේ වර්ෂ 2014 ක් වූ ජූලි 20 දා ඉරිදා ලංකාදීප පත්‍රයේ මාලබේ අරංගල කහන්තොට පාරේ ශ්‍රී ශෛලාරාමාධිපති රාජකීය පණ්ඩිත දර්ශනපති විචිත්‍ර ධර්ම කථික කථිකාචාර්ය ඇත්කඳුරේ සුමරසාර හිමියන්ගේ මගපෙන්වීම යටතේ අසංක ආටිගල විසින් පලකරන ලද වත්ථූපම සූත්‍රය කියවීමෙන් පසුවයි. එය මෙසේයි: “දිනක් බුදුරජාණන්වහන්සේ මහා සංඝයා පිරිවරාගෙන චාරිකාවේ වැඩම කරන සේක. ඒ මග නුදුරෙහි රජකයෙක් වස්ත්‍රයකට සායම් දමමින් සිටියි.

බුදුන්වහන්සේ එතන නතර වී “මහණෙනි බලන්න අර රජකයා රෙදි සායම් දමන අපූරුව” යි භික්ෂූන් වහන්සේලාගේ අවධානය එදෙසට යොමු කළහ. “මහණෙනි, යම් විදියකට ඔය සායම් දමන රෙදිකඩෙහි කුණු පැල්ලම් මඩ පැල්ලම්, ලප තිබුනොත් මේ සායම් දැමීම ඔහුට කල හැකිද?”

"ස්වාමිනි, එවිට මේ රෙදිකඩ අපිරිසිදුයි. එමනිසා සායම් දමා අගනා මෝස්තරයක් කල නොහැකියි." "මහණෙනි, මේ රෙද්ද ලස්සනට පාට කලයුතු නම් එය කවර ආකාරයෙන් තිබිය යුතුද?"

ස්වාමිනී එය ඉතාම පිරිසිදුව, කුණු කිලිටි වලින් තොරව තිබිය යුතුය.

"එසේම පින්වත් මහණෙනි, මෙයද දැනගන්න. රෙදි සායම් කරන්නෙකු කිලිටි වූ මළ බැඳුනු වස්ත්‍රයක් නිල්පාට හෝ කහ පාට හෝ රතු පාට හෝ මදටිය රතුපාට හෝ සායම් කිරීමට සූදානම් වුවහොත් වස්ත්‍රය අපිරිසිදු නිසා එය නොමනා පැහැය ගත්තක්ම වෙයි. අපිරිසිදු පෙනුමක් ඇත්තක්ම වෙයි. එසේම සිත කිලිටි වූ කල්හි දුගතියම බලාපොරොත්තු විය යුතුය". ඉහත සටහන් වුයේ සුමනසාර හිමියන්ට අනුව උන්වහන්සේ තේරුම්ගත් වත්ථුපම සූත්‍රයයි.

සුමනසාර හිමියන්ගේ ධර්මයට අනුව වර්ණ ගැන්වීමට පෙර වස්ත්‍රය කුණු කහට පැල්ලම් ආදිය ඉවත් කල යුතුය. එසේම කිලිටි වූ අපිරිසිදු වූ සිතෙන් දුගතිය මිස නිර්වානයක් බලාපොරොත්තු විය නොහැකිය. මෙය එදා මෙදාතුර පවතින්නාවූ වේදාන්ත ධර්මයයි. වර්තමානයේ ද ඔවුන් එදාමෙන් කෙලෙස් නසමින් නිවන් සොයන්නේ වේදාන්ත ධර්ම අනුගමනය කරමිනි. දුකට හේතුව තණ්හාව යයි කියමින් තණ්හාව නැසීමට වෙරදරන්නේ එබැවිනි.

නමුත් බුද්ධ වචනය එය නොවන්නේය. වත්ථුපම සූත්‍රයේ එන රජකයා දක්ෂයෙකි. කහට පැල්ලම් වලින් තොරවූ වස්ත්‍රයක් වර්ණ ගැන්වීම තුල රජකයාගේ දක්ෂතාවයක් තිබේද? එය ඕනෑම අයෙකුට කල හැකි කාර්යයකි. එසේනම් රජකයාගේ දක්ෂතාවය කුමක්ද?

සෝදා ඉවත් කල නොහැකි පැල්ලම් වස්ත්‍රයේ ඇතිවිටම වර්ණ රටා යොදා එම වස්ත්‍රය වර්ණ ගැන්වීම රජකයා තුල ඇති දක්ෂතාවයයි. සමහර වර්ණ වලට යම් වර්ණ සහිත පැල්ලම් මකා දැමීමේ හැකියාව ඇත. ඒ සම්බන්ධව මනා දක්ෂතාවයක් ඇති රජකයා කහට පැල්ලම් තිබෙන විටදීම වස්ත්‍රය මනාලෙස වර්ණ

ගන්වයි. කිසිම පැල්ලමක් නැති සුදු වර්ණ වස්ත්‍රයක් තමන්ට කැමති ආකාරයට වර්ණ ගැන්විය හැකිබව සැබැවකි. එය සම්පූර්ණයෙන් කෙලෙස් ප්‍රහින වූ තැන පෙන්වයි. නමුත් ඊට පෙර මජ්ඣිමා පටිපදාවේ ගමන කරන ප්‍රඥාවන්තයාට ආලෝකය පහළ වීමට පෙර (බුද්ධ පහළවීමට පෙර) උපක්ලේශ දහසයක්ම පවතින්නේය. ආලෝකය පහළ වීමෙන් පසු නැසී යන්නේ මක්ඛ (ගුණවතුන්ගේ ගුණ මැකීම සහ ගුණ නැතියවුන්ගේ නැතිගුණ කීම), පලාස (අන් අයගේ වැරදි නැසීම), ඉස්සා (ඊර්ෂ්‍යාව), මච්ජරිය (මසුරුකම), මායා (මුළා කිරීම), සාඨෙයිය (කපටිකම) යන උපක්ලේශ පමණක් බවද එම ලිපියේම සඳහන් වෙයි. මෙම උපක්ලේශයන් තිබියදීම යමෙක් බුද්ධ පහළකර ගැනීම, කහරුපකායේට පැල්ලම් තිබියදීම වස්ත්‍රය වර්ණ ගැන්වීමේ රජකයා සතු දක්ෂතාව හා සමාන වෙයි.

**7**

# විද්‍යාව පහළ වීම (විජ්ජා උදපාදී) හෙවත් ආර්ය මාර්ගයට වැටීම

ප්‍රඥාව පහළකරගත් සත්ත්වයා දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය සහ නිරෝධ සත්‍යය දැක ආර්ය මාර්ගයට වැටෙයි. මාර්ගසත්‍යය වූ එය ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. විජ්ජා උදපාදී ලෙස හඳුන්වන විද්‍යාව පහළවීමද එයයි. මාර්ගයට වැටෙන විට ක්ලේශයෝ එලෙසම පැවතුනද එතැනදී කෙලෙස් භේද කරන විද්‍යාව පහළ වෙයි. මාර්ගයට වැටීමත් සමග සම්මා දෘෂ්ඨිය පහළවෙයි.

සම්මා දෘෂ්ඨිය පහළ වූ සත්ත්වයා අකුසලය දැනගනියි, අකුසල මූලය දැනගනියි. කුසලය දැනගනියි, කුසල මූලය දැනගනියි. සම්මා දෘෂ්ඨිය පහළවීමත් සමගම අකුසල් නැතිකර කුසල් වැඩීමක් සිදුවන බව මින් අදහස් නොකෙරෙයි. මෙතැනදී වන්නේ දැනගැනීම පමණි. විද්‍යාව පහළවී මාර්ගයට අවතීර්ණවීම යම් දවසක සියලුම ක්ලේශයන් ප්‍රහාරණය වීමට හේතුවෙයි. මාර්ග සහ ඵල අනුව කතාකරනවා නම් මෙය සෝවාන් මාර්ගයට වැටීමයි. මෙසේ ආර්ය මාර්ගයට අවතීර්ණ වීම ස්ථිර වශයෙන්ම සසර ගමන නතරවීමට හේතුවෙයි.

බොහෝ ගුරුවරු මාර්ගය සහ ඵලය එකක් ලෙස ගෙන කතා කලද මාර්ගයට වැටීම එකකි, ඵලය අනෙකකි. මේ මාර්ග සහ ඵල වේදාන්ත ධර්ම වලින් ලද ආභාෂයකි. සම්මා දෘෂ්ඨියෙන් ආරම්භ වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය වීර්යය යොදා වැඩියහැකි මාර්ගයක් නොවෙයි. මාර්ගයට වැටෙන විටම සම්මා දෘෂ්ඨිය පහළවෙයි.

සතර සතිපට්ඨානය තුල "කායේ කායානුපස්සනා විහරති" ලෙස හඳුන්වන්නේද මේ මාර්ගය පහළ වීමයි. විද්‍යාව පහළ වීමත් සමග සිදුවන කයේ වාසය කිරීම චින්තනයෙන් ප්‍රගුණ කල හැකි දෙයක් නොවෙයි. යෝගාවචරයන් මේ කායානුපස්සනාව ප්‍රගුණ කරන්නේ චින්තනයෙන් කය පිලිබඳ සිහිය පිහිටුවීමෙනි. නමුත් 'කායේ කායානුපස්සනා විහරති' යන්නෙහි තේරුම යෝගාවචරයින් විසින් සිදුකරනු ලබන චින්තනයෙන් කය ගැන සිහිකිරීම නොව කයෙහි සිහිය පිහිටුවා කයෙහි වාසය කිරීමයි. කයෙහි සිහිය පිහිටුවන විට සිත හා මන තුල සිහිය ක්‍රියාත්මක නොවෙයි.

විද්‍යාව පහළවීම (විද්‍යා උදපාදී) චින්තනය ඉක්මවයි, මන ඉක්මවයි. එමෙන්ම විද්‍යාව පහළවීම පැහැදිලිවම අත්දැකියි. විද්‍යාව පහළකරගැනීමෙන් තොරව තථාගත දර්ශනයක් නොමැති බැවින් දර්ශනයට පත්වුයේ යයි මුළාවූ අය තමන්ට විද්‍යාව පහළවුයේ දැයි පරික්ෂා කරගෙන තම මුළාවෙන් නිදහස් විය හැක. උම්මග්ග ජාතකයේද මේ මාර්ගයට වැටීම සඳහන් කර ඇත්තේ ප්‍රඥාව පරීක්ෂා කිරීම ලෙසයි. උම්මග්ග ජාතකයේ රථ ප්‍රශ්නයෙන් මාර්ගයට වැටීම පරික්ෂා කරයි.

ඇස ඥාණ සහ ප්‍රඥාව පහළකර ගන්නේ සත්වයෙක් වුවත් මනුෂ්‍යයා ඇතුළුව කිසිම සත්වයෙක් ආර්ය මාර්ගයට අවතීර්ණ වන්නේ නැත. ආර්ය මාර්ගයට සත්වයෙකුට අවතීර්ණ විය නොහැකිය. කිසිම ධර්මයක් තුල පිහිටා තථාගත මාර්ගයට අවතීර්ණ විය නොහැක්කේ ඒ නිසයි. විද්‍යාව පහළවීමෙන් තොරව, එනම් මාර්ගයට වැටීමකින් තොරව තථාගත දර්ශනයක් නොමැති බැවින් තථාගත දර්ශණයට පත්වුයේ යයි මුළාවූ කෙනෙකුට එම මුළාවෙන් නිදහස් වීමට මවිසින් පෙන්වා දෙන **විද්‍යාව පහළවීම** මනා පිටුවහලක් වනු ඇත.

මෙම මරණයෙන් නිදහස් වන්නාවූ ආර්ය මාර්ගයට වැටෙන්නේ කෙසේද? පැහැදිලිවම ඇස, ඥාන, සහ ප්‍රඥාව පහළ වීමෙන් පසුව පමණක් ආර්ය මාර්ගයට අවතීර්ණ වෙයි. ආර්ය මාර්ගයට වැටෙන විට සංසාරයේ පළමු වරට රූපකායේ පමණක් සිහිය පිහිටයි, කයේ වාසය කරයි. "කායේ කායානුපස්සනා විහරති"

ලෙස හඳුන්වන්නේ එයයි. විද්‍යාව පහළවන මේ මොහොතේදී ඇස ක්‍රියාත්මක වුවද, ඇස හරහා ආලෝකය ගමන් කර රූපය නිර්මාණය වුවද චින්තනයේ සහ මනෙහි සිහිය නොපිහිටන බැවින් ඇසෙන් කිසිම කෙනෙක් හෝ දෙයක් පෙනෙන්නේ නැත. ඒ ආකාරයටම කණෙන් ඇසීමක් හෝ දිවෙන් රස ගැනීමක් නාසයෙන් ගන්ධයක් හෝ ශරීරයෙන් ස්පර්ශයක් ඇති නොවෙයි. නමුත් එතන ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරිත්වය ඇත. ඉන්ද්‍රියයන් නිසා වර්ණ, ශබ්ද ආදී රූප ඇතිවෙයි. නමුත් විද්‍යාව පහළවනවිට රූපකායේ පමණක් සිහිය පිහිටුවා නාම ධර්මයන්ගෙන්ද චින්තනයෙන්ද මනෙන්ද නිදහස් වෙන බැවින් විද්‍යාව පහළ වී මාර්ගයට වැටෙනවිට කෙලෙස් සහිත ලෝකයක් නිර්මාණය වන්නේ නැත. එබැවින් ඉන්ද්‍රියයන් පහම ශීලයේ පිහිටයි. මෙය සංසාරයේ එක්වරක් පමණක් සිදුවන්නෙකි. උම්මග්ග ජාතකයේ කාලගෝල කථාවේ දික්පිටියා පංචශීලයේ පිහිටුවන්නේ මේ අවස්ථාවේදීය. මෙතැන් පටන් සක්කායදෘෂ්ඨිය තිබුනද හේතුඵල ධර්මය විසින් චින්තනය මෙහෙයවයි.

බුද්ධ පහළවීමට පෙර මාර්ගයට වැටීම හෙවත් විද්‍යාව පහළවීම සුළුපටු දෙයක් නොවෙයි. මෙය පැහැදිලිවම විද්‍යාව පහළකරගන්නා විසින් අත්දකියි. මෙම අවස්ථාව මගහැර තථාගත දර්ශනයක් දකින්නට නොහැකිය. විද්‍යාව පහළවනවිට චින්තනය තුල සිහිය නොපිහිටන බැවින් (පුද්ගලයෙක් නොමැති බැවින්) ඒ මොහොතේ සිදුවූයේ කුමක්ද යන්න දන්නේ නැත. දැනගැනීම චින්තනයේ ප්‍රතිඵලයකි. චින්තනය තුල ඇත්තේ අවිද්‍යාවයි. විද්‍යාව පහලවනවිට චින්තනය ක්‍රියාත්මක නොවෙයි. යමෙක් සිහි විසඥ වූ විටද තමන් ඒ බව දන්නේ නැත. නමුත් විද්‍යාව පහළවීම විසඥ වුවක් නොවන්නේ මේ මොහොතේදී සිහිය කයේ පිහිටන බැවිනුත් ඇදවැටීමක් සිදුනොවන බැවිනුත් නිසාය. විද්‍යාව පහළවීමට පෙර සහ පසු ශරීරයට අපහසුතාවයක් ඇතිවන්නේද නැත. මෙතැනදී කයේ පමණක් සතිය (සිහිය) පිහිටන බැවින් චින්තනයත් මනසත් ඉතා සුළු මොහොතකට කයෙන් වෙන්වෙයි. එම සුළු මොහොතට සිදුවන මේ වෙන්වීම නිසා දින කිහිපයක් ගතවන තෙක් ශාරීරික මහන්සියක් සිතට දැනෙන්නේ නැත. දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයෝ පැමිණ ප්‍රඥාව පරීක්ෂාවට ලක්කරන්නේ විද්‍යාව

පහළවන මේ මොහොතට පසුවයි. (උම්මග්ග ජාතකයේ රථ ප්‍රශ්නය කියවන්න).

සතර සතිපට්ඨානය නිවන් දැකීමේ ඒකායන මාර්ගය ලෙස දක්වා තිබෙන්නේ එහි පළමු පට්ඨානය වූ කායානුපස්සනාව මාර්ගයට වැටීමත් සමගම පහළ වන බැවිනි. මෙතැනදී කයේ පමණක් සිහිය හෙවත් සතිය පිහිටයි. බොහෝ යෝගාවචරයන් මේ සතර සති පට්ඨානය වැඩුවද, ප්‍රඥාව පහළ වීමෙන් පසු සතිය (සිහිය) විවිධ ස්ථානයන්හි පිහිටනවා විනා ඒවා වැඩිය හැකි ධර්ම නොවෙයි. කායානුපස්සනාව වඩනවා යැයි කියමින් යෝගාවචරයින් කරන්නේ කයේ සිහිය පිහිටුවීම නොව චින්තනයෙන් කය ගැන සිහිකිරීමයි.

*විජ්ජා උදපාදී ලෙස හඳුන්වන 'විද්‍යාව' මවිසින් පහළකරගත්තේ මෝටර්රථය පදවමින් සිටින විටකදිය. එය සිදුවූයේ නවසීලන්තයේ හැමිල්ටන් නගරයේ ජනාකීර්ණ මාර්ගයකදී සඳා පුවරුවක් ඉදිරිපිටදීය. සංසාරය පුරාවටම මරණය උරුමව තිබූ කයේ මොහොතකට සතිය (සිහිය) පට්ඨාන විය. චින්තනය තුල සිහිය නොපිහිටා කය තුල පමණක් සිහිය පිහිටා ජනාකීර්ණ මාර්ගය දිගේ මෝටර්රථය පැදවිය. චින්තනය හෝ මන තුල සිහිය නොපිහිටි නමුත් කය සෘජු විය. චින්තනයෙන් තොරව කයෙන් කෙරෙන කාර්යයන් හේතුඵල ධර්මයට අනුව ක්‍රියාත්මක විය. කය ක්‍රියාත්මක වුවද ඒ මොහොතේ මෝටර්රථය පදවන්නෙක් නොවිය (රූපකාය යනු සත්වයෙක් නොවෙයි). ඇසෙන් දැකීමක් හෝ කණෙන් ඇසීමක් හෝ නොවීය. අතීත වර්තමාන සහ අනාගත කාලාත්‍රයෙන් තොරවූ ඒ මොහොතේ කුමක් සිදුවුයේදැයි චින්තනය හරහා නොදැන සිටියෙමි. එතෙක් චින්තනයෙක් කල කාර්යය මේ අවස්ථාවේදී හේතුඵල ධර්මය විසින් බාරගත් අතර මෝටර්රථයක් පැදවීමේදී කලයුතු සියළු කාර්යයන් හේතුඵල ධර්මය විසින් ඉටුකරන ලදී.*

*නැවත ඉන්ද්‍රියන්ට අවදිවනවිට සඳා පුවරුවක් ඉදිරියේ මෝටර්රථය නතරවී තිබුණි. මේ සිද්ධියෙන් පසු මට විඩාව සම්පූර්ණයෙන්ම නැතිවිය. එසේම මරණය යනු මනසින් සාදාගත්*

*ධර්මතාවයක් බව ප්‍රත්‍යක්ෂ විය. එයද දෘෂ්ඨියක් වුවත් එය සම්මා දෘෂ්ඨියයි, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ආරම්භයයි.*

විද්‍යාව පහළවීම ඕනෑම ඉරියව්වකින් සිදුවිය හැක. සිද්ධාර්ථ තවුසා විද්‍යාව පහළකර ගැනීම එතුමා සිහිමුර්ජා වී මාර්ගයේ වැටී සිටීමෙන් බෞද්ධ සාහිත්‍ය තුල පෙන්වයි. නමුත් එය සිහිමුර්ජාවී ඇදවැටීමක් නොව සයනය වී සිටිවිටෙක මාර්ගය පහළවීමයි. මෙය සිහිමුර්ජා වීමක් ලෙස හඳුන්වන්නේ වෙනත් වචනයක් එයට ආදේශ කල නොහැකි බැවිනි. ඇත්තවශයෙන්ම මෙය වෛද්‍ය විද්‍යාවේ හඳුන්වන සිහිමුර්ජාව නොවෙයි. මොළයට රුධිර සැපයුම හා ඔක්සිජන් සැපයුම නතර වුවිට යම් අයකු සිහිමුර්ජා වියහැක. එවිට මොළයේ ස්නායු වල ක්‍රියාකාරිත්වය දුර්වල වීමක් සිදුවිය හැක. නමුත් කයේ සතිය පිහිටන මේ විද්‍යා උදපාදී ලෙස හඳුන්වන බුද්ධ මාර්ගය පහළවනවිට ශරීරයේ ක්‍රියාකාරීත්වය ඉතා හොඳින් පවතියි. නමුත් කය හසුරුවන පුද්ගලයෙක් නැත.

විද්‍යාව පහළවී ආර්ය මාර්ගයට වැටෙනවිට දෘෂ්ඨී විශුද්ධිය සම්පූර්ණ වී සම්මා දෘෂ්ඨිය පහළවෙයි. දෘෂ්ඨී විශුද්ධිය නමැති රථයේ ගමන අවසන් වෙයි. එය රථගාලේ නවතා කංඛාවිතරණ විශුද්ධිය නමැති රථයේ ගමන ඇරඹෙයි. එය හතරවන රථයයි. මෙතැනදී පෙර සඳහන් කර ඇති පරිදි හේතුඵල ධර්මය ක්‍රියාත්මක වන අතර එමගින් සක්කායදෘෂ්ඨිය සමග ක්‍රියාත්මක වූ ධර්ම ප්‍රහාරණය වෙයි. කංඛාවිතරණ විශුද්ධිය, දෘෂ්ඨී විශුද්ධිය හේතුව කොටගෙන ඇතිවෙයි. යෝගාවචරයින් පවසන පරිදි කංඛාවිතරණ විශුද්ධිය යනු විදර්ශනා භාවනා මගින් වැඩිය හැකි මාර්ගයක් නොවෙයි.

# 8

# ආලෝකෝ උදපාදී
# (ආලෝකය පහළවීම)

පෙර සඳහන් කල පරිදි විද්‍යාව පහළවී ආර්ය මාර්ගයට වැටෙනවිට සත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොරව රූපකායේ වාසය කරයි (කායේ කායානුපස්සනා විහරති). මාර්ගයට වැටීමෙන් පසු හේතුඵල ධර්මයට අනුව චින්තනය ක්‍රියාත්මක වෙයි. හේතුඵල ධර්මය ප්‍රමුඛ වුවත් සක්කායදෘෂ්ඨියද නොනැසී පවතියි. මෙතැනදී දස සංයෝජනයම සම්පූර්ණ වී ඇති බැවින් විද්‍යාව පහළවීමෙන් පසු සත්ත්වයා මනුෂ්‍යයෙක් ලෙස උපත ලබයි. ආර්ය මාර්ගයට වැටුන සත්ත්වයා මෙම ජීවිත කාලය තුල යම් දවසක ස්ථිර වශයෙන්ම ආලෝකය පහළකරගනියි. බුද්ධ පහළවීම ලෙස මවිසින් හඳුන්වන්නේද මේ ආලෝකය පහළවීමයි. හින්දු දහමට අනුව මෙය සෝවාන් ඵලයයි. සසර ගමනේදී මෙතෙක් ඝන අන්ධකාරයෙන් වැසී තිබුන 'මරණය' තුල ආලෝකය පහළවී මරණයෙන් නිදහස් වීම 'බුද්ධත්වයයි'.

*බුද්ධ පහළවීමට පෙර එතෙක් මවිසින් කරගෙන ගිය ධර්ම ශ්‍රවණය ඇතුළු සියළුම ගවේෂණයන් සම්පූර්ණයෙන්ම නතරවිය. සංස්කාර ධර්ම තුල උපත අවසන් විය. ඒ කාල වකවානුවේදී මම නවසීලන්තයේ හැමිල්ටන් නගරයේ ජීවත්වීමි. ගවේෂණය අතහැරුණ පසු ලංකාවෙන් ගෙන්වා ගත් ටෙලිනාට්‍ය බැලීමට යම් කාලයක් වැය කෙළෙමි. මා විසින් නරඹමින් සිටි ටෙලිනාට්‍යය 'සබඳ පබිලිස්' විය. වේදනා උපාදානස්කන්ධය තුල උපත ලැබීමට, එනම් මනුෂ්‍ය උපත සම්පූර්ණ වීමට අවශ්‍යය මනෝසංචේතනා ඇතිවීමට එම ටෙලිනාට්‍යය බැලීම මට මනා පිටුවහලක් විය (ප්‍රඥාව පහළවීම ශ්‍රවණය නිසා සිදුවුවත් බුද්ධ පහළවීමට ධර්ම ශ්‍රවණය*

වැදගත් වන්නේ නැත). එම කාලයේදීම බුද්ධ පුත්‍රයෙකුට දානයක් දීමේ අවශ්‍යතාව ද මගේ මනසේ අභ්‍යන්තරයෙන්ම පැනනැගී තිබුණි. දානය සඳහා ක්‍රියාත්මක වීමක් මවිසින් සිදු නොවූ නමුත් ඒ සඳහා මග පෑදුනි. අප නගරයේ වෙසෙන බෞද්ධයන් විසින් වෙසක් පොහොය නිමිත්තෙන් භක්ති ගීත ගායනාවක් සංවිධානය කරතිබුණි. එයට පන්සලේ ගරුතර ස්වාමීන්වහන්සේ ද වැඩම කර සිටියහ. හාමුදුරුවන් ගැන නිතර සොයා බලන එක් උපාසිකා මාතාවක් උන්වහන්සේගෙන් පසුදින දානය ගැන විමසා බැලීය. උන්වහන්සේගේ පිළිතුර වූයේ පසුදින පමණක් නොව එදිනද දානය නොලැබුණු බවයි. එම උපාසිකා මාතාවත් සමග එකතු වී පසුදින දානය පිළියෙළ කර උන්වහන්සේට පිළිගැන්වූයෙමු. පසුදින සැන්දෑ යාමයේ නිදන කාමරයේ කන්නාඩි මේසය ඉදිරිපිට යමක් සොයමින් සිටින විට මෙතෙක් ඇසෙන් දුටු වස්තු වෙනුවට එක් වරම ආලෝකය පහළවූ අතර කෙලෙස් වලින් සම්පූර්ණයෙන් නිදහස් ව සතිය පිහිටුවිය. මේ අවස්ථාවේදී දෑස් සම්පූර්ණයෙන්ම විවෘතව තිබුන අතර ආලෝකය හැර වෙන යමක් ඇසෙන් නොදුටුවෙමි. එය 'ආලෝකෝ උදපාදී ලෙස හඳුන්වන බුද්ධ පහළවීමයි. ඊළඟ දිනයේදී තවදුරටත් මරණයක් නොමැති බව ක්ෂණිකවම මගේ මනසට පහළවිය. ආලෝකෝ උදපාදී ලෙස හඳුන්වන ආලෝකය පහළවීම යනු සමහර යෝගාවචරයින්ට දෑස් පියාගත්විට දකින ආලෝක ලප නොවෙයි.

මෙතෙක් කාලයක් කෙනෙක් දෙයක් දුටු ඇස හරහා ආලෝකය පමණක් පහල වන්නේ කෙසේද යන්න මම ඔබට පෙන්වා දෙමි. ආලෝකය පහළ වීමට පෙර සත්වයා මනුෂ්‍යයෙක් ලෙස වේදනා ස්කන්ධයේ උපත ලබයි. උපත තුල පැවැත්මක් නැත. සත්වයාගේ පැවැත්ම පංච උපාදානස්කන්ධය තුල සිදුවෙයි. ජරාව සහ ව්‍යාධිය ඇත්තේ ද මෙම පැවැත්ම තුලයි. මෙම පැවැත්ම සතර ආකාරයක ධර්ම නිසා සිදුවෙයි. තණ්හාවටද හේතුවන මෙම ධර්ම හතර නම් නාමරූප, සළායතන, ඵස්ස සහ වේදනා වෙයි. උම්මග්ග ජාතකයේ මෙම ධර්ම සතර පිළිවෙලින් සේනක, පුක්කුස, කාවින්ද සහ දේවින්ද නම්වූ පඬිවරුන් තණ්හාව නමැති රජුට කරන සේවය ලෙසද, තණ්හුප්පාද සූත්‍රයේ චීවර හේතුකොටගෙන, පිණ්ඩපාතය හේතුකොටගෙන, සේනාසනය හේතුකොටගෙන සහ ගිලන්පස

*හේතුකොටගෙන ඇතිවන තණ්හාව ලෙස ද පෙන්වා දෙයි. බුද්ධ පහළවන විට සේනකාදී පණ්ඩිතයෝ තණ්හාව නමැති රජුට කරන සේවය අතහරියි. බුද්ධ පහළවීමට පෙර ඇස ඥාණ ප්‍රඥාව සහ විද්‍යාව පහළවීමත් එම පහළවීම් තුල ශීල විශුද්ධිය චිත්ත විශුද්ධිය දෘෂ්ඨි විශුද්ධිය සහ කංඛාවිතරණ විශුද්ධිය චිත්ත සන්තානය තුල ඇතිවීමත් නිසා මෙම නාමරූප, සලායතන, ඵස්ස සහ වේදනා යන ධර්ම හතරෙහි ක්‍රියාව මොහොතකට නතර වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇසෙන් ග්‍රහණය කරන ලද ආලෝක සඥාව නාමරූප ලෙස හෝ සලායතන ලෙස හෝ ඵස්සය ලෙස හෝ වේදනාව ලෙස හෝ පිළියෙළ නොවී ආලෝකය ලෙසම දකියි, ආලෝකය පහළවෙයි. එය වර්ණ රූපයයි. මෙසේ ආලෝකය පහළවන්නේ විජ්ජා උදපාදී ලෙස හඳුන්වන විද්‍යාව පහළවී ආර්ය මාර්ගයට අවතීර්ණ වනවිට රූපකයේ සතිය පිහිටවූ බැවිනි. විද්‍යාව පහළනොවී කිසිම සත්වයෙකුට බුද්ධ පහළ නොවෙයි. බුද්ධ පහළවනවිට අතීත මතකයෙන්ද අනාගත අපේක්ෂාවන්ගෙන්ද නිදහස් වෙයි. බොහෝ යෝගාවචරයෝ ධර්ම ප්‍රගුණ කිරීමෙන් මේ අතීතයෙන් හා අනාගතයෙන් තොරවූ චින්තනය පහළකර ගැනීමට වීර්ය දරති. ඔවුන් ධර්මය නමැති උගුලට අසුවී අන්තයකට වැටෙයි. ඔවුන් ආලෝකය පහළකරගන්නවා වෙනුවට ශූන්‍යතාව පහළකරගනියි.*

දර්ශණය පහළවුයේ යයි කියන බොහෝදෙනෙක් මෙකල වැඩවාසය කරති. දර්ශණයෙන් මුළාවූ අය බොහෝය. චින්තනයේ හෝ මනසේ සිදුවන යම් විශේෂ විපර්යාසයකට දර්ශණය යයි ඔවුහූ රැවටෙති. බුද්ධ පහළවීමෙන් පසු දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කරන්නේ යෝගාවචරයා මේ මුළාවෙන් ගලවා ගැනීමටයි. තථාගත දර්ශණය ඉබේ පහළවන්නක් නොවෙයි. ධර්මයක් ප්‍රගුණ කර පහළකරගන්නක්ද නොවෙයි. තථාගත දර්ශණය හෙවත් බුද්ධ පහළවීමට පෙර හේතුඵල ධර්මය ක්‍රියාත්මක වන අතර තථාගත දර්ශණයද හේතු සම්පූර්ණ වීමෙන්ම පහළවෙයි. තථාගත දර්ශණයට පෙර විද්‍යා උදපාදී ලෙස හඳුන්වන විද්‍යාව පහළවෙයි. එය මාර්ගයට වැටීමයි. මාර්ගයට වැටීමෙන් තොරව ඵලයක් නොමැත. කිසිම යෝගාවචරයෙක් (සෝවාන් ආදී) මාර්ගය කුමක්දැයි නොදනියි. විද්‍යාව පහළවීමේදී කයේ සිහිය පිහිටුවීම මාර්ගයට පිළිපන් ආර්ය පුද්ගලයා පැහැදිලිවම අත්දකියි. විද්‍යාව පහළවීමට ප්‍රඥාවත්, ප්‍රඥාව

පහළවීමට ඥාණයත්, ඥාණ පහළවීමට ඇස පහළවීමත් හේතුවෙයි. එබැවින් යමෙකුට ඇස පහළවීම, ඥාණ පහළවීම, ප්‍රඥාව පහළවීම, විද්‍යාව පහළවීම සහ ආලෝකය පහළවීම පිළිබඳව තමන්ගේ අත්දැකීමක් නොමැති නම් පහලවූ තථාගත දර්ශනයක් නැත. මෙසේ මවිසින් දේශනාකරන දම්සක්පැවතුම් සුත්‍රය ශ්‍රවණයකර තමන්ගේ දර්ශණය සම්බන්ධයෙන් විචිකිච්ඡාව පහළ වන්නේ නම් එයම මුළාවට පත්වූ යෝගාවචරයින්ගේ ඇස පහළවීමට හේතුවෙයි.

විද්‍යාව පහළවී ආර්ය මාර්ගයට අවතීර්ණ වුවද යම් යම් හේතු සපිරෙන තෙක් බුද්ධ පහළ නොවෙයි. පහතින් පෙන්වා දෙන්නේ ආර්ය මාර්ගයට අවතීර්ණ වූ මනුෂ්‍ය සත්වයා ප්‍රේත විමානයෙන් අත්මිදෙන තෙක් බුද්ධ පහළ නොවන බවයි. රූපස්කන්ධය සහ නාම ස්කන්ධ උපාදානය වීමෙන් පංච උපාදානස්කන්ධය පහළවන බව පැහැදිළිය. එමගින් සිතුවිලි සහ මනෝසංචේතනා පහළවෙයි. කුඩා කාලයේ සිට පංච උපාදානස්කන්ධය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නේ චින්තනයේ ක්‍රියාකාරිත්වයෙනි. සක්කායදෘෂ්ඨිය පහළවීමෙන් පසු ආරම්භ වන සත්ත්වයාගේ ජිවන පැවැත්ම හරියට කර්මාන්තයක් මෙනි. මෙම කර්මාන්තයේ පැවැත්ම සඳහා පෝෂණය (ආහාර) අවශ්‍යවෙයි. ඵස්සය එක් ආහාරයකි. නමුත් ඵස්සය වූ පමණින්ම කර්මාන්තයේ පැවැත්ම ගෙනයා නොහැක. පැවැත්ම සඳහා මනෝසංචේතනා නමැති ආහාරය අවශ්‍ය වෙයි. ඵස්සය සලකන්නේ දන්දියයුතු ආහාරයක් ලෙසයි. ඵස්සය දානය කලවිට මනොසංචේතනා ඇතිවෙයි. මනෝසංචේතනා කර්මාන්තයේ දියුණුව සඳහා යොදවයි. මනොසංචේතනා නොමැති කල කර්මාන්තයකුත් නැත, ජිවත්වීමකුත් නැත. උදාහරණයක් ලෙස කුඩා ළදරුවෙක් ගත්විට ඵස්සයත් මනෝසංචේතනාත් අල්ප වශයෙන් ක්‍රියාත්මක වෙයි. එපමණක් නොව මනුෂ්‍යය උත්පත්තියක් ලැබූ පසුවද (මම මෙතන මනුෂ්‍යය උප්පත්තියක් ලෙස පෙන්වන්නේ වේදනාව තුල සිදුවන උපතයි) මනොසංචේතනා නිසිපරිදි ක්‍රියාත්මක නොවෙන අවස්ථා ඇත. මනෝසංචේතනා ඇති නොවීම මනුෂ්‍යයා ප්‍රේත විමානයේ පහළවීමට හේතුවක් වෙයි. එය ආර්ය මාර්ගයට වැටුන මනුෂ්‍යයාට බුද්ධ පහළවීමට ද බාදාවක් වෙයි. එය ත්‍රිපිටකයේ ප්‍රේත වස්තුවෙන් පෙන්වා දී ඇත.

විද්‍යාව පහළකරගත් සත්ත්වයා මනුෂ්‍යයෙක් වූ පමණින්ම ආලෝකය පහළ නොවන්නේ ඉහත පෙන්වා ඇති මනෝසංචේතනා අවශ්‍ය තරමට ක්‍රියාත්මක නොවීම නිසයි. විද්‍යාව පහළකරගත් මනුෂ්‍යයා ද උත්පත්තිය සහ මරණයට අසුවී ඇත. මරණයට අසුවූ මනුෂ්‍යයා ප්‍රේතයෙක් ලෙස පහළවිය හැක. ප්‍රේතයන් උපදින හෝ මැරෙන හෝ සත්ත්ව කොට්ඨාශයක් නොවෙයි. ඔවුන් යම් තැනක පහළවෙයි. ප්‍රේතයාට කුසල් අකුසල් කල නොහැකි නමුත් ඔවුන්ට පින් ලබාගෙන කුසල් වර්ධනය කරගතහැක. මේ පින් ලබාගැනීමෙන් ප්‍රේතයෝ තමන් ඉන්නා ප්‍රේත ආත්මයෙන් නිදහස් වී ඉහළ තලයකට පැමිණෙති. එය දේව තලයක් විය හැකිය. ප්‍රේත විමානයෙන් නිදහස් වන තෙක් බුද්ධ පහළ නොවන බැවින් දන් දීම ආදී කුසල් කර පින් පමුණුවා මේ ප්‍රේතයන් ඔවුන් සිටිනා තැනින් නිදහස් කලයුතුය.

ත්‍රිපිටකයේ පෙන්වා ඇති පරිදි මේ ප්‍රේත විමාන වල සිටින ප්‍රේතයන්ට ආහාර තිබේ. එනම් එතන ඵස්ස ආහාරය ඇත. පරිපූර්ණත්වයට පත් මනුෂ්‍යයා තුල ඵස්ස ආහාරය දන්දීම නිසා මනෝසංචේතනා ඇතිවෙයි. එය වේදනා උපාදානස්කන්ධයේ පහළවීමයි (ඵස්ස පච්චයා වේදනා). මනොසංචේතනා පහළ නොවන විට මේ බඹයක් පමණ වූ ශරීරය තුල සිදුවන කර්මාන්තය ඇනහිටියි. එවිට මනුෂ්‍යයාගේ මරණින් පසු ප්‍රේතයා පහළවෙයි (මෙතන 'මරණය' යනු සම්මුති මරණය නොවෙයි). ප්‍රේතයාට අවශ්‍ය තරම් ආහාර ඇති නමුත් මනෝසංචේතනා නොමැති කමින් ආහාර වින්දනය (පරිභෝජනය) කල නොහැකිය. සමහර ප්‍රේතයන්ගේ ගලනාලය ඉදිකටු තුඩක් මෙන් සිහින්ව පිහිටා ඇතයි ධර්මයේ සඳහන් වෙයි. එයින් පෙන්වන්නේ මනෝසංචේතනා නොමැති කමින් වින්දනයේ ක්‍රියාකාරීත්වය ඉතා අඩු බවයි. රස දැනෙයි, නමුත් වින්දනය නැත. එබැවින් රස-වින්දනය කල නොහැකිය. ඵස්ස ආහාරයත් සමග තෘෂ්ණාව පහළ වෙයි. මේ තෘෂ්ණාව සංසිඳුවා ගැනීමට අවශ්‍ය මනෝසංචේතනා නොමැති බැවින් ප්‍රේතව උපදියි.

දිව නමැති ඉන්ද්‍රිය ඵස්සයට ප්‍රධාන වෙයි. එබැවින් අනෙකුත් තෘෂ්ණාවන් ට වඩා රසතෘෂ්ණාව වඩා ප්‍රබලවෙයි. එමනිසා ප්‍රේතයන් බොහෝවිට පහළවන්නේ රසතෘෂ්ණාව මුලික කරගෙනය. ප්‍රේතයන්

තෘෂ්ණාවෙන් පෙළෙන්නේ ආහාරයේ රසය වින්දනය කරගැනීමට නොහැකි නිසාය. ඔවුන්ගේ රස නහර පිනායාමක් සිදුවන්නේ නැත. එබැවින් මේ ප්‍රේතයෝ ඔවුන් සිටිනා තැනින් නිදහස් කිරීමට නම් ප්‍රනීත ආහාර දන්දී පින් අනුමෝදම් කල යුතුය. එම පින් අනුමෝදම් වන්නේ තමන් තුලම සිටින ප්‍රේතයන්ටය. මේ ප්‍රේතයා එම පින් අනුමෝදම් කරගෙන වේදනා ස්කන්ධය මතුවී (ප්‍රේත විමානයෙන් නිදහස් වී) දිව්‍ය විමාන වල පහළවෙයි.

ප්‍රනීත ආහාර දන් දීමෙන් ප්‍රේතයා නිදහස් වන්නේ කෙසේද? සැම පුද්ගලයෙකුම ආහාරයට ගිජු බවක් ඇත. ආහාරයට ඇති 'පෙරේතකම' ලෙස සාමාන්‍ය ව්‍යවහාරයේ එය හඳුන්වයි. තමන්ට මේ රස ආහාර උවමනා පරිදි ඇතිවිටක අවශ්‍ය සැමවිටම ආහාරය ගන්නා බැවින් - ඵස්සය නමැති ආහාරය දන්නොදෙන බැවින් - මේ පෙරේතකම නොසංසිඳෙයි. මනොසංචේතනා ක්‍රියාත්මක නොවීම එයට හේතුවයි. එවිට රස නහර පිනවීමක්, වින්දනයක් සිදුනොවෙයි. පෙරේතකමෙන් නිදහස් වීමට නම් මනෝසංචේතනා මතුවිය යුතුය. එතෙක් ප්‍රේතයා ප්‍රේත විමානය තුළ සිරවෙයි. නමුත් තමන් වෙනුවෙන් සකස් කර ඇති ප්‍රනීත ආහාරය තවකෙනෙකුට දන්දීමට සිදුවුවහොත්? එවිට එම ප්‍රනීත ආහාරය තමන්ට අහිමි වන බව තමන් දනියි. එසේම මේ දානය උසස් පුද්ගලයෙකුට දෙන දානයක් බැවින් එමගින් යම් ප්‍රීතියක් ඇතිවෙයි. මෙම දානය ඉඳුල් නොකර ඉතා ගෞරවයෙන් දෙන දානයකි. ඒ තුල මනෝසංචේතනා ඇතිවෙයි. දානය දෙනවිටද දීමෙන් පසුව තමන්ට අහිමි වූ ආහාරය ගැන සිතන විට තවතවත් තෘෂ්ණාව දැඩිවෙයි. නමුත් ශ්‍රද්ධාවෙන් යුතුව දෙන දානයක් බැවින් එම තෘෂ්ණාව ඉක්මවා හැඟීම් - මනෝසංචේතනා - පහළවෙයි. මේ තෘෂ්ණාව ඉස්මතු වීමත් දානය තුල ඇතිවන ප්‍රීතියත් සමග තවතවත් මනෝසංචේතනා ඇතිකරවයි. පිරිසක් සමග එකතුව මේ දානය දෙනවිට එතුලින්ද රාගය මානය ආදී මන ධර්ම මතුවන බැවින් තව තවත් මනෝසංචේතනා ඇතිවෙයි. ඒවිට ප්‍රේතයාට තමන් සිරවී සිටි ප්‍රේතවිමානයෙන් නිදහස් වී දේව විමාන වල පහළවෙයි. ප්‍රේතයාගෙන් නිදහස් වූ පසු වේදනාව ක්‍රියාත්මක වෙයි (ඵස්ස පච්චයා වේදනා). මනුෂ්‍යය උත්පතිය ලබන්නේ වේදනා ස්කන්ධයේ බැවින් ප්‍රේත විමානයෙන් මිදී දිව්‍ය විමානයේ සැරිසරා නැවත මනුෂ්‍යයෙක් ලෙස උපත ලබයි. ඇණගිට තිබූ කර්මාන්තය නැවත

ක්‍රියාත්මක වෙයි. මනුෂ්‍ය උපත සඳහා දානය කොතරම් වැදගත් ද යන්න මෙයින් පැහැදිලි වෙයි. දානය කරන්නේ ඵස්සය නැමැති ආහාරයයි. **'බුද්ධ' පහළවන්නේ දෙව් මිනිස් සැප කෙළවර බව දැන් ඔබට පැහැදිලි ඇතැයි සිතමි.**

බිම්බිසාර රජතුමා වේළුවන ආරාමය සාදා බුදුන්වහන්සේට පූජාකළ පසු එදින රාත්‍රියේ සිහිනෙන් ආහාර ඉල්ලා හඬා වැළපෙන ප්‍රේතයන් කොට්ඨාශයක් දුටුවේය. පසුදින මේ සිහිනය ගැන බුදුන්වහන්සේගෙන් විමසූ විට උන්වහන්සේගේ පිළිතුර වූයේ ප්‍රේතයන් ලෙස ඉපදී සිටින මළගිය ඥාතීන් කොටසක් එසේ සිහිනෙන් පෙන්නුම් කර ඇති බවයි. ආහාර දන් දී එම පින් අනුමෝදම් කර ඔවුන් එම ප්‍රේත ආත්මයෙන් නිදහස් කරගත හැකි බවද බුදුන්වහන්සේ පෙන්වා දුන් සේක. බිම්බිසාර රජතුමා සිහිනෙන් දුටුවේ තමන්ගේම යටපත් වී තිබූ මනෝ සංචේතනා බව බුද්ධිමත් ඔබට වැටහිය යුතුය. එතන මළගියඥාතීන් යනු යටපත් වූ මනෝ සංචේතනාය. ප්‍රේතයෝ පහළවන්නේ මනෝසංචේතනා යටපත් වී ඇති බැවිනි. බුදුන් දකින්නට පෙර මනුෂ්‍යයා ප්‍රේත විමානයෙන් නිදහස් විය යුතුය.

රූපය තුල මරණය සිදුවන බැවින් සත්වයාට ඇසෙන් වර්ණ රූප දැකිය නොහැකිය. නමුත් බුද්ධ පහළවනවිට සංසාරයේ පළමුවරට මෙතෙක් මරණයෙන් වැසී තිබූ වර්ණ රූපය දකියි. ආලෝක උදපාදී ලෙස හඳුන්වන, මරණයෙන් නිදහස් වී බුද්ධ පහළවීම යනු එයයි. බුද්ධ පහළවීමෙන් පසු තවදුරටත් මරණයක් නැත.

ආලෝකය පහළකරගන්නේ මනුෂ්‍යයෙක් පමණි. වේදනාවේ උපත ලබන මනුෂ්‍යයා තුල රාගය, විචිකිච්ඡාව සහ අපේක්ෂාව ඇත. මනුෂ්‍යයෙක් හැර වෙනත් කිසිම සත්ත්වයෙකුට මේ ධර්මතා තුනම එකවර පිහිටන්නේ නැත. මනුෂ්‍යයෙක් වීම දුර්ලභ කාරණයක් වන්නේ එබැවිනි. සංයෝජන දහයකින් බැඳී, වේදනා ස්කන්ධයේ උපදින මනුෂ්‍යයා රූප, වේදනා, සඥා, සංඛාර සහ විඥාන නම්වූ පංචස්කන්ධයම උපාදානය කරයි.

ආලෝකය පහළවීමට පෙර මට දානයක් දීමට අවශ්‍යතාවයක් පැනනැගීමත්, ඒ සඳහා අවස්ථාවක් ඇතිවීමත් ඊටපසු දින බුද්ධ දැකීමත් සිදුවූ බැවින් දානය සහ බුද්ධ පහළවීම අතර යම් සම්බන්ධතාවයක් ඇතිබව පැහැදිලි වූ නමුත් ප්‍රේත වස්තුව පහළවන තෙක් මෙම සම්බන්ධතාව මට ප්‍රහේලිකාවක්ම විය. නමුත් ප්‍රේත වස්තුව විවෘත වූ පසු එම ප්‍රශ්නයෙන්ද නිදහස් විය. බුද්ධ පහළවීමට පෙර ප්‍රේත විමානයේ සිටි බැවින් එයින් නිදහස් වන තෙක් බුද්ධ පහළවීමට ප්‍රේත ආත්මය බාධාවක් වී තිබූ බව අද මට ප්‍රත්‍යක්ෂ විය (මම මෙතන 'ආත්මය' යන වචනය සඳහන් කරන්නේ එය සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිතා වන වචනයක් බැවිනි).

ධම්මචක්කප්පවත්තන සූත්‍රදේශනාව අවසානයේ කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන්ඵලයට පත්වූ බව පොත්පත්වල සඳහන් වුවත් (මගේ 'බුද්ධ පහළවිය' නමැති පොතේද ඒ බව සඳහන් කර ඇත) දීර්ඝව පාලි වචන විමර්ශනය කර බැලුවිට "කොන්ඩඤ්ඤඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදී යංකිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මංති" යන පාලි පාඨය තුල එවැන්නක් සඳහන් කර නැතිබව පෙනීයයි. මේ සූත්‍ර දේශනාවේ ඉහත සඳහන් පාඨයෙන් කියවෙන පරිදි කොණ්ඩඤ්ඤ තවුසා එතැනදී ඇස පහළකරගෙන ඇත. තවුසා ආලෝකය පහළකර ගත්තේ බුද්ධ වචනය දිව්‍ය බ්‍රහ්ම ආදී ලෝක තුල පැතිරුණු පසුවයි. මෙහි දිව්‍ය සහ බ්‍රහ්ම ලෝක පහළ වන්නේ ද තමන් තුලම බව ඔබට පැහැදිලි විය යුතුය.

ආලෝකය පහළවීමේදී පංච උපාදානස්කන්ධය තුල ක්‍රියාකාරිත්වය නොමැති බැවින් ආර්ය ශ්‍රාවකයා තුල මෙතෙක් ක්‍රියාත්මක වූ සක්කායදෘෂ්ඨිය විචිකිච්ඡා සහ ශීලබ්බතපරාමාස යන සංයෝජන තුනම ප්‍රහාරණය වෙයි. නමුත් පංච උපාදානස්කන්ධයේ පැවැත්ම නොනැසී පවතින බැවින් කාමරාග සහ පටිඝය නම් වූ සංයෝජන දෙක අනාගාමි ඵලය තෙක් නොනැසී පවතියි. බුද්ධ පහළවී මේ සංයෝජන ප්‍රහාරණය වනවා විනා සංයෝජන නැතිවීමෙන් බුද්ධ පහළවනවා නොවෙයි. නමුත් මෙකල බොහෝ යෝගාවචරයෝ පංච උපාදානස්කන්ධයම නැතිකර නිවන ප්‍රගුණ කරති.

මනුෂ්‍යයාට වල්ගයක් නැත. බොහෝ සිව්පාවුන්ට වල්ග ඇත. ඒ බව දන්නා යම් සිව්පාවෙකු තම වල්ගය කපා දැමීමෙන් මනුෂ්‍යයෙක් වන්නට සිතනවා වියහැක. යෝගාවචරයා සක්කායදෘෂ්ඨිය යන සංයෝජනය නැතිකර දමා ආර්ය පුද්ගලයෙක් වීමට කල්පනා කිරීම සිව්පාවා තම වල්ගය කපාදමා මනුෂ්‍යයෙක් වීමට සිතනවා වැනිය.

ආර්ය මාර්ගයට වැටෙනවිට සම්මා දෘෂ්ඨිය පහළවෙන බව පෙර සඳහන් කෙළෙමි. සම්මා දිට්ඨි සූත්‍රයෙන්ද එය මනාව පැහැදිලි වෙයි. ආලෝකය පහළ කරගෙන බුද්ධ දකිනවිට සම්මා සංකප්ප පහළවෙයි. එතන අතීත ස්මරණයක් නැත, අනාගත බලාපොරොත්තුවක් ද නැත. කෙලෙස්වලින් තොර වූද අතීතයෙන් හා අනාගතයෙන් තොරවූද මේ සංකල්පනාව 'සම්මා සංකප්ප'යයි.

9

# සත් සතිය

ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා සතියක් ගැන සඳහන් වෙයි. එතන 'සතිය' යනු සිහියයි. සතර සතිපට්ඨානයෙ 'සති' යන්නෙහි තේරුමද සිහියයි. **නමුත් ත්‍රිපිටකධාරීන්ට අනුව ගෞතම බුදුන්වහන්සේ වැඩ වාසය කලේ යයි කියන සත්සතියේ එන 'සතිය' දින හතේ 'සතිය' විය.**

ඒ අනුව ගෞතම බුදුන් වහන්සේ බුද්ධත්වයෙන් පසු ගතකල සත්සතිය යනු දින 49 ක් වූ සති හතක්ද නැතිනම් බුද්ධ පහළවීමෙන් පසු සිහිය (සතිය) පිහිටවූ අවස්ථා හතක්ද යන්න විමසා බැලිය යුතු කරුණකි. බුද්ධ පහළවීමෙන් පසු මා ලැබූ අත්දැකීම් හේතුකොටගෙන සත්සතිය යනු කුමක්ද යන්න මවිසින් විමර්ශනය කරන ලදී. සත්සතිය ගතකල ආකාරය හා ස්ථාන ගැනත් සඳහන් වී ඇති කරුණු සැලකිල්ලට ගත්විට මට පෙනීගියේ බුද්ධ පහළවීමෙන් පසු විවිධ අවස්ථාවන්හිදී මවිසින් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන තුල සිහිය පිහිටවූ තැන් සමග 'සත්සතිය' මනා සම්බන්ධතාවයක් ඇති බවයි.

සියළුම බුදුවරු බුද්ධත්වය ලැබීමෙන් පසු වැඩවසන සත්සතිය ගාථාවකින් මෙසේ දක්වා ඇත.

පඨමං බෝධි පල්ලංකං - දුතියංච අනිම්මිසං
තතියං චංකමනං සෙට්ඨං - චතුත්ථන් රතනාඝරං
පන්චමං අජපාලංච - මුචලිං දේන ඡට්ඨමං
සත්තමං රාජායතනං

## පඨමං බෝධි පල්ලංකං- පළමු සතිය

පඨමං බෝධි පල්ලංකං ලෙස හඳුන්වන්නේ බෝධි මූලයේ සිහිය පිහිටුවීමයි. එය බුද්ධ පහළ වූ පළමු සතියයි. මෙතන බෝධිය කුමක්ද? බෝධි මූලය කුමක්ද? අලගද්දූපම සූත්‍රයට අනුව ධර්මය නමැති පහුර සාදන්නේ කොළ පරඬලා වලිනි. වරක් කොළ මිටක් කඩාගත් ගෞතම බුදුන් වහන්සේ කොළ මිට උපමාකොට දේශනා කලේ “මහණෙනි, මවිසින් දේශනා කල ධර්මය මේ අතේ ඇති කොළ හා සමානයි, මවිසින් දේශනා නොකළ ධර්මය මේ කැලයේ ඇති කොළ හා සමානයි” යනුවෙනි.

ඇසටු බෝධිය නම් පංච උපාදානස්කන්ධයයි. මේ ඇසටු බෝධියේ කොළ නම් **සංස්ඛාර ධර්මයයි**, පුෂ්පය නම් **සඤ්ඤාවයි**. පුෂ්පය **විඤ්ඤානය** නමැති ඵලය සාදයි. එය ඉදිරි පරම්පරාව ගෙනයයි. ගසේ එතුණු වැල **වේදනාවයි**. ඇසටු බෝධියේ  කඳ යනු **රූපස්කන්ධයයි**. මේ බෝධියට මුල් තුනක් ඇත. එම මුල් තුන නම් **අනිත්‍ය, දුක්ඛ අනාත්ම** නම්වූ ත්‍රිලක්ෂණයයි. ත්‍රිලක්ෂණය නිසා පංච උපාදානස්කන්ධය නමැති ගස අතුපතර විහිදා වැඩෙයි. කඳේ එතුන වැල කඳ විශාල වනවිට තරයේ අල්ලා ගනියි, උපාදානය වෙයි. කඳ මිරිකී වේදනාවට පත්වෙයි. ගස වටා එතුන වැල කඳ ඇතුලට කිඳා බසියි. එපමණක් නොවෙයි. ගස වටා එතුන වැලෙන් තවත් කාර්යයක් කරයි. වැල ගසේ කඳවටා එතුන පසු කඳේ පොත්ත හරහා පහළට ආහාර ගමන් කිරීම යම් ප්‍රමාණයකට නතර වන බැවින් ගෙඩි හොඳින් පෝෂණය වෙයි. ගසේ හොඳින් ඵල හටගැනීම සඳහා ද  ගස වටා වැල් එතීම ප්‍රයෝජනවත් වෙයි. එසේම වැල අතුපතර විහිදී ගොස් සම්පූර්ණ ගසම වැලෙන් එතී ගිය අවස්ථා ද ඇත. එවැනි පංච උපාදානස්කන්ධයක් ඇති සත්ත්වයෝද මෙලොව ජීවත්වෙති. මේ වේදනා ස්කන්ධයේ ක්‍රියාකාරිත්වයයි. වේදනාව නොමැතිව උපාදානස්කන්ධය පහළ නොවෙයි. කඳ වටා එතුන වැල නොමැතිවද  ඇසටු බෝධිය පවතියි, මල් හටගනියි, ගෙඩි හටගනියි, වර්ගයා බෝ කරයි. නමුත් බෝධිය සම්පූර්ණ නැත. එසේම වේදනා ස්කන්ධය නොමැතිව සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාන ස්කන්ධ පමණක්

දරාගෙන සිටින සත්ත්වයෝ ද මේ බඹයක් පමණ ශරීරය තුලම වාසය කරමින් තම වර්ගයා බෝ කරමින් ජීවත් වෙති. නමුත් ඔවුහු මනුෂ්‍යයන් නොවෙති. තථාගත දර්ශණයට පත්වූයේ යයි මුළාවූ යෝගාවචරයෝ වැල නැති ගස මෙනි.

අනිත්‍යය, දුක්ඛ. අනාත්මය දැක ඇසටු බෝධි මූලයේ වැඩසිට කඳට (රූපයට) පිටදී 'බුද්ධ' වාසය කරයි. සියළුම සත්ත්වයෝ රූපයෙදී මරණයට පත්වෙති. මෙම මරණය ඉක්මවීමෙන් බුද්ධ පහළ වෙයි. බුදුන් වහන්සේ බෝධියට පිටදී වැඩසිටීමෙන් පෙන්වන්නේ මරණය ඉක්මවීමයි. බෝධි මූලයේ වැඩසිටීම යනු අනිත්‍යය දුක්ඛ අනාත්ම නම් වූ ත්‍රිලක්‍ෂණය දැකීමයි.

බුද්ධ මාර්ගය යනු පංච උපාදානස්කන්ධය නමැති බෝධිය කපා දැමීම නොව පංච උපාදානස්කන්ධයට හේතු වූ ත්‍රිලක්‍ෂණය දැකීමයි- බෝධි මූලයේ වැඩසිටිමයි. නමුත් පංච උපාදානස්කන්ධය සිඳබිඳ දමන යෝගාවචරයා කරන්නේ බෝධිය කපාදැමීමයි.

කෙලෙස් ප්‍රහාරණය ආරම්භ වන්නේ බුද්ධ පහළ වීමෙන් පසුවයි. කෙලෙස් ප්‍රහාරණයට පෙර යටපත් වී ඇති කෙලෙස් මතුවිය යුතුය. සැඟවී ඇති සතුරා නැසිය නොහැකිවාක් මෙන් යටපත් කල ක්ලේශයන් ප්‍රහාරණය කරන්නට නොහැකිය. බුද්ධ පහළවීමෙන් පසු එනම් පළමු සතියෙන් පසු ආරම්භවන්නේ මේ කෙලෙස් ප්‍රහාරණය වීමේ කාර්යයයි. බුද්ධ පහළ වීමත් සමග මක්ඛ (ගුණවතුන්ගේ ගුණ මැකීම සහ ගුණ නැතියවුන්ගේ නැතිගුණ කීම), පලාස (අන් අයගේ වැරදි නැසීම), ඉස්සා (ඊර්ෂ්‍යාව), මච්ජරිය (මසුරුකම), මායා (මුළා කිරීම), සාඨෙයිය (කපටිකම) යන උපක්ලේශයන් ප්‍රහාරණය වෙයි.

ආලෝකය පහළවීමත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ පෙන්වන 'සම්මා සංකප්පයත්' පළමු සතියේම සිදුවෙයි. **මාර්ගඵල අනුව මේ සෝවාන් ඵලයයි.**

## දුතියංච අනිම්මිසං- දෙවන සතිය

*දුතියංච අනිම්මිසං යනු දෙවන සතියයි. එය අනිමිසලෝචන පූජාව ලෙස හඳුන්වයි. මේ 'සතියේදී' ඇසිපිය නොහෙලා බෝධිය දෙස බලාසිටියි. මේ 'සතිය' මට පහළවූයේ බුද්ධත්වයෙන් දිනකිහිපයකට පසුවයි. නවසීලන්තයේ වයිකාටෝ විශ්ව විද්‍යාලයේ මගේ කාර්යාලයට වී සිටින විට අනිමිසලෝචනය සිදුවිය. ඇසට කිසිම විඩාවක් නොමැතිව ඇසිපිය හෙලීමක් ද නොමැතිව දෙවන 'සතිය' ගත කෙළෙමි. ඉන්ද්‍රියයන් (ඇස) ක්‍රියාත්මක වුවද එය චින්තනයෙන් තොරවිය. 'විඩාවෙන්' තොරවූයේ ඒ නිසයි.*

අනිමිසලෝචන පූජාවේදී වේදනා ස්කන්ධය තුල සතිය සිහිටුවා වාසය කරයි. වේදනා ස්කන්ධයේ පමණක් සිහිය පිහිටුවීම තුල චින්තනයට හේතුවන සංස්කාර ධර්ම වලින් සම්පූර්ණයෙන් මිදෙන අතර මනෝසංචේතනා පමණක් ක්‍රියාත්මක වෙයි. "වේදනා වේදනානුපස්සනා විහරති" ලෙස සතර සතිපට්ඨානයේ හඳුන්වන්නේ මේ අනිමිසලෝචන පූජාවයි. මේ සතියේදී ඉන්ද්‍රිය ධර්ම ක්‍රියාත්මක නොවන බැවින් ඉන්ද්‍රියයන්ට (ඇසට) කිසිම විඩාවක් ඇති නොවෙයි.

ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරන ආර්ය පුරුෂයා ආර්ය මාර්ගයට (සෝවාන් මාර්ගයට) වැටෙන විට සම්මා දෘෂ්ඨියත්, බුද්ධ පහළවනවිට (සෝවාන්ඵලය) සම්මා සංකප්පයත්, පහළ කරගැනීමෙන් පසු අනිමිසලෝචනය තුල සතිය පිහිටන විටදී 'සම්මා වාචා' පහළවෙයි. සාමාන්‍යයෙන් ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයත් සමග කෙලෙස් සහිත 'වචන' සමග සිතුවිලි හටගනියි. වේදනාව තුල වාසය කරනවිට මනෝසංචේතනා පමණක් ක්‍රියාත්මක වන අතර කුසල අකුසල පව්පින් ආදී සිතුවිලි නැත. එමනිසා වචනය 'සම්මා' වෙයි.

**මාර්ග සහ ඵල වලට අනුව මේ සකෘදාගාමී මාර්ගයයි.**

**රථ විනීත සූත්‍රයට අනුව කංඛාවිතරණ විශුද්ධිය නමැති රථයේ ගමන ද ඊළඟ රථගාලේදී නතරවෙයි. එතැනදී ආලෝකය හෙවත් බුද්ධ පහළවෙයි. එය සෝවාන්ඵලයයි. ඵලය තුල ගමනක්**

**නැත. නැවත ගමන ආරම්භ වන්නේ සකෘදාගාමී මාර්ගයට පැමිණි පසුවයි. 'මේ නිවන් මගය මේ නිවන් මග නොවේය' යයි තත්ත්වාවබෝධයෙන් දැනගතහැකි වන්නේ සකෘදාගාමී මාර්ගයේදීය. එනම් මග්ගාමග්ග ඤාණ දස්සනය පිරිසිදු වීම (විශුද්ධිය) ඇරඹෙයි. කංඛාවිතරණ විශුද්ධිය නමැති රථය රථගාලේ තබා මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය නමැති රථයෙන් ගමන් අරඹයි. මෙය පස්වන රථයයි.**

## තතියං චංකමනං සෙට්ඨන්- තුන්වන සතිය

ඇසෙන් ග්‍රහණය කරගත්තේ ආලෝක සඥාවක් වුවත් ඉන්ද්‍රිය මුළාව නිසා බාහිර දෙයක් හෝ කෙනෙක් ඇතැයි පිළිගනියි. ආලෝක සඥාවක් මගින් දෙයක් කෙනෙක් දකින්නේ මොළයේ පෙර තැන්පත් කරගෙන තිබූ රූපයෙනි. ඇසෙන් දැක්ක දේ රූපසඥාවක් ලෙස තැන්පත් කරගනියි. නැවත එම රූපය ඇසෙන් දුටුපසු හඳුනා ගන්නේ තැන්පත් කරගෙන තිබූ රූපසඥාව මතුවීමෙනි. එබැවින් ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය තුල බාහිර රූපසඥාවත් අභ්‍යන්තර රූපසඥාවත් අතර ප්‍රතිවිරුද්ධ ගමනක් සෑම විටම ඇති බව පෙනීයයි. සත්ත්වයා තුල ඇතිවන මේ ඉන්ද්‍රිය ගමන කෙලෙස් සහිත එකකි. නමුත් 'තතියං චංකමනං සෙට්ඨං' ලෙස හඳුන්වන බුද්ධ පහළවී තුන්වන සතියෙදී කෙලෙස් වලින් තොර ගමනක යෙදෙයි. 'රුවන් සක්මන' ලෙස හඳුන්වන්නේ මේ ගමනයි. මෙතනදී බුදුන් තවත් බුද්ධ රූපයක් මවාගෙන එකිනෙකට මුහුණ ලා රුවන් සක්මනේ යෙදෙන බව පොතපතේ සඳහන් වෙයි.

*මවිසින් තුන්වන සතිය ගතකලේ පැපුවානිච්ගිනියාවේ පදිංචිව සිටි කාලයේ රූපවාහිනිය නරඹමින් සිටින අවස්ථාවකදීය. බාහිර රූපයත් අභ්‍යන්තර රූපයත් අතර එක්වරම කෙලෙස් වලින් තොරව ඉන්ද්‍රිය හරහා රුවන් සක්මන සිදුවිය. එම සතියේදී සිදුවන ක්‍රියාව (ගමන) කෙලෙස් වලින් තොර බැවින් 'සම්මා' වෙයි. එය ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ එන 'සම්මා කම්මන්ත'යයි.*

**මාර්ගඵල අනුව මෙය සකෘදාගාමී ඵලයයි.**

## චතුත්ථන් රතනාසරං- හතරවන සතිය

'රුවන්සක්මනෙන් පසු රුවන්ගෙයි වාසය කරයි. එය 'චතුත්ථන් රතනාසරං' ලෙස හඳුන්වන හතරවන සතියයි. මෙතැනදී ඉන්ද්‍රිය ගමන සම්පූර්ණයෙන්ම නතරවෙයි. ඇස, කණ, නාසය, දිව ශරීරය නම්වූ ඉන්ද්‍රියයන් පහම වැසෙයි. එතන චින්තනය තිබුනද මේ චින්තනය කෙලෙස් වලින් තොරවෙයි. එමනිසා එය දොර කවුළු වැසූ 'රතනාසරං' වෙයි. මෙතන ඉන්ද්‍රිය වලින් තොරව ජීවත්වීමක් ඇත. කෙලෙස් බරින් තොර එම ජීවිතය 'සම්මා ආජීව' වෙයි. සතර සතිපට්ඨානයේ "චිත්තේ චිත්තානුපස්සනා විහරති" ලෙස හඳුන්වන්නේ මේ චිත්තයේ සිහිය පිහිටුවීමයි. එතන 'සිතුවිලි' වලින් තොරව චිත්තය තුල වාසය කිරීමක් සිදුවෙයි.

*බුද්ධ පහළවීමෙන් හතරවන සතියේ 'සම්මා ආජීවය' පහළවුයේ පැපුවානිච්ගිනියාවේ නිවසේ සිටින විට ඇස පියවී තිබුන අවස්ථාවකදීය. සියළුම ඉන්ද්‍රියයන් වැසී ඇතිවිට කෙලෙස් වලින් තොරව වාසය සිදුවිය. කෙලෙස් වලින් තොර බැවින් රුවන් ගෙයි වාසය කිරීම ලෙස එය හඳුන්වයි. මෙම සිදුවීමෙන් පසු බොහෝ වෙනස්වීම් ඇතිවිය. මෙයින් පසු ඉන්ද්‍රිය අවදිය පවත්වා ගැනීමට සැමවිටම යම් කාර්යයක නිරත වීමට මට සිදුවිය. කිසිම කාර්යයකින් තොරව පුටුවක හෝ හාන්සි වුවිට සිතුවිලි ක්‍රියාත්මක නොවන බැවින් ක්ෂණයකින් නින්දට වැටුණි. දැන් භාවනාවක් ලෙස කලද එදා ගෞතම බුදුන් කල සක්මන් මළු තිබුනේ බුද්ධ පහළවී හතරවන සතියෙන් පසු ඇතිවන නින්දට වැටීමෙන් වලක්වාලීම සඳහායි. ඇවිදීමට තරම් ශාරීරික සෞඛ්‍යය නොමැති අයට ආනාපානසතිය අනුදැන වදාරා තිබුණි.*

සර්වඥතා ඥානය පහළවන්නේ හතරවන සතියෙන් පසුවය. මවිසින් දේශනා කරන ලද බොහෝ ධර්ම පහළවුයේ හතරවන සතියෙන් පසුවයි. මනේන්ද්‍රිය විවෘත වන්නේ හතරවන සතියෙන් පසු බැවින් මෙතැන සිට මන ධර්ම පහළවෙයි. මෙතෙක් ලෝභයෙන් හා ද්වේශයෙන් වැසි තිබුන කාමරාගය සහ පටිඝය මතුව එයි. ඒවා මුල් සංයෝජන පහෙන් අවසාන දෙකයි. මතුනොවී කිසිම සංයෝජනයක් ප්‍රහාරණය නොවෙයි. ලෝභය යනු කුමක්ද,

කාමරාගය යනු කුමක්ද යන්නත් මෙම ක්ලේශයන්ගේ වෙනසත් වෙන්කර හඳුනා ගත හැක්කේ සතර වන සතියෙන් පසුවයි. එසේම ද්වේශය සහ පටිඝය ද එකිනෙකට වෙනස් ධර්මයන්ය. කුමාර අවදියේ පස්කම් සැප විඳිමින් කාමසුකල්ලිකානු යෝගය අනුගමණය කල සිද්ධාර්ථ කුමාරයා කාමරාගය යටපත් කර තිබුණි.

**මාර්ගඵල අනුව නම් මේ අනාගාමි මාර්ගයයි.**

අනාගාමි මාර්ගය යනු පටිපදා ඥාණ දස්සන විශුද්ධියේ ආරම්භයයි. උදයව්‍යය ඥාණයේ පටන් අනුලෝම ඥාණය තෙක් වූ මහා විදර්ශනා ඥාණ පහළවීම මෙතැනදී ආරම්භ වන බව ත්‍රිපිටකයේද සඳහන් වෙයි. රථ විනීත සූත්‍රයට අනුව මේ හයවන රථයේ ගමනයි.

## පන්චමං අජපාලංච-පස්වන සතිය

“පන්චමං අජපාලංච” යනු පස්වන සතියයි. මෙතෙක් බෝධිය මුලික කරගත් බුදුන් පස්වන සතියෙදී අජපල් නුගරුක මුලට සැපත්වෙයි. අජපල් නුගරුක එදා ප්‍රසිද්ධව තිබුනේ එළුවන් ලගින ස්ථානය ලෙසයි. බුදු කෙනෙකුගේ බුද්ධත්වයෙන් පසු පස්වන සතිය (සිහිය) පිහිටුවන්නේ එතනයි. එළුවා හරකා මෙන් නොව තෝරාබේරා ගැනීමකින් තොරව කටුපඳුරුත් ආහාරයට ගනියි. පස්වන සතියෙදී ආර්ය පුරුෂයාගේ ස්වභාවයත් එවැනිය. හොඳ නරක වෙන්කිරීමක් නොමැතිය.

*මවිසින් මේ දම්සක්පැවතුම් සූත්‍රය ගැන සටහන් තබමින් සිටින විට මීට මාසයකට පමණ පෙර මේ ‘සම්මා වායාමය’ පහළ වී අජපල් නුගරුක මුල වාසය කළේය. එතැනදී මනෝ සංචේතනා ප්‍රහාරණය වූ අතර මනෝ සංචේතනා පවත්වාගැනීමට මානසික විර්යය දැරීමට සිදුවිය. එය මවිසින් ඇස පහළ කරගැනීමෙන් පසු මාර්ගය තුල ගමන කිරීමට කරන ලද පළමු වන මානසික වීර්යයයි. එම මානසික විර්යය ‘සම්මා වායාමය’යි.*

පස්වන සතිය තෙක් බෝධිය මුල්කරගෙන අනිමිසලෝචන පූජාව, රුවන් සක්මන සහ රුවන් ගෙය ඇසුරු කරගෙන සතිය

පැවැත්වුවද පස්වන සතියෙන් පසු තවදුරටත් බෝධිය මුල් කරගෙන බුද්ධ වැඩ නොසිටියි. එයට හේතුව මෙතෙක් වේදනා ස්කන්ධය නිසා ඇතිවූ පංච උපාදානස්කන්ධය තවදුරටත් නොපැවතීමයි: බෝධිය ඇත, වැලත් ඇත, නමුත් බෝධිය වටා එතුන වැල් නැත. බුදුන්වහන්සේ පිටදුන් පසු නැවත බෝධියේ එල හටගන්නේත් නැත. එතන දැන් උපාදානස්කන්ධයක් නැත. තවදුරටත් ගර්භාෂය තුල එනම් වේදනාව තුල උපතක් සිදුනොවෙයි. කරණීයමෙත්ත සූත්‍රයේ 'න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී' ලෙස පෙන්වා ඇත්තේ නැවත ගර්භාවාසයකට නොඑන පස්වන සතියෙන් පසු ස්වභාවයයි. එළුවන් ලගින බැවින් පස්වන සතියේ වැඩවාසය කරන අජපල් නුගරුක වැල් වලින් එතෙන්නේ නැත. සියළුම වැල් එළුවන් විසින් කා දමයි.

පස්වන සතියට පෙර මගේ පටිසය ප්‍රබල ලෙස ක්‍රියාත්මක වූ අතර එමනිසා අන්‍යයන් සමග ගැටුම් වලටද එළඹුණි. පස්වන සතියට පෙර තෝරාබේරා වෙන්කර ගැනීම ආර්ය පුද්ගලයා තුල ඇත. ගැටුම්වලට එළබෙන්නේ එබැවිනි. නමුත් පස්වන සතියේදී කාමරාග සහ පටිසය සම්පූර්ණයෙන් ප්‍රහාරණය වන බැවින් ගැටුම් වලින් තොරවෙයි.

මවිසින් පෙර පෙන්වා දෙන ලද ප්‍රේත වස්තුව ගැන සටහන් තැබුවේ පස්වන සතිය පහළවීමෙන් පසුවයි. පස්වන සතියේදී මනෝසංචේතනා ප්‍රහාරණය වන බැවින් ප්‍රේත විමානයට ගමන් කල හැකියි. මුගලන් මහා රහතන්වහන්සේ ප්‍රේත විමානයට ගොස් ප්‍රේතයන් මුණගැසුණ බව ත්‍රිපිටකයේ ද සඳහන් වෙයි.

වේදාන්ත ධර්ම වලට අනුව අනාගාමි ඵලය ලෙස හඳුන්වන මේ පස්වනසතිය පහළ වූ පසු සක්කායදෘෂ්ඨිය, විචිකිච්ඡා, ශීලබ්බතපරාමාස, කාමරාග, පටිසය යන සංයෝජන පස සම්පූර්ණයෙන් ප්‍රහාරණය වෙයි. අනාගාමි ඵලයෙන් පසු ව්‍යාපාද, ක්‍රෝධ, උපනාහ (බද්ධ වෛරය), ප්‍රමාද (සතියෙන් තොරවීම) යන උපක්ලේශයන් ප්‍රහාරණය වෙයි. ප්‍රමාදය වලක්වා ගැනීමට 'සිහිය' පිහිටුවීමට වීර්ය දැරීම පස්වන සතියේ පහළ වන 'සම්මා වායාම'යයි. තවමත් අභිජ්ජා (දැඩි ලෝභය), ථම්බෝ (සිතෙහි තද ගතිය), සාරම්භ (එකට එක කරන ස්වභාවය), මාන, අතිමාන මද (ධනයෙන්

කුලයෙන් මත්වීම) යන උපක්ලේශයන් ඉතිරිව පවතියි. අනාගාමි ඵලයෙන් පසු ද ගිහිගෙය තුල වාසය කිරීමට කිසිම බාධාවක් නැත.

මුවලිං දේන ජට්යමං යනු හයවන සතිය වන අතර සත්සතියේ අවසාන සතිය හඳුන්වන්නේ "සත්තමං රාජායතනං" ලෙසයි. එය රහත් ඵලයයි. හයවැනි සතියේදී 'සම්මා සතිය' පහළවෙයි. හත්වන සතියේදී 'සම්මා සමාධිය' පහළවෙයි.

ශීල විශුද්ධිය, චිත්ත විශුද්ධිය, දෘෂ්ඨි විශුද්ධිය, කංඛාවිතරණ විශුද්ධිය, මග්ගොමග්ග ඥාණ දස්සන විශුද්ධිය සහ පටිපදා ඥාණ දස්සන විශුද්ධිය ආදී ෂඩ් විශුද්ධීන්ගේ සම්පූර්ණ වීමෙන් ඉපදිය යුතු සොතාපත්ති, සකෘදාගාමි අනාගාමී අර්හත් යන මාර්ග ඥාණ පහළකර ගැනීම ඥාණ දර්ශන විශුද්ධියයි. රථවිනීත සූත්‍රයට අනුව මේ සත්වන රථයයි. රහත් මාර්ගයෙදී ගමන් අරඹන සත්වන අවසාන රථයෙන් අනුපාදා පරිනිර්වාණය තෙක් ගමන් කරයි.

**මෙකල සිටින තථාගත දර්ශණය පහළවූයේ යයි කියන බොහෝ දෙනෙක් බෝධිය ශුද්ධ පවිත්‍ර කරමින් ඒ වටා එතුන වැල් කපාදමමින් විමුක්තිය සොයන්නෝ වෙති. ඔවුහු වේදනා ස්කන්ධය යනු කුමක්දැයි නොදනිති. මේ යෝගාවචාරයෝ ඔවුන් පහළකරගත් දර්ශනයෙන් එහා කිසිවක් නැතැයි කියති, මාර්ගඵල ප්‍රතික්ෂේප කරති. බුද්ධ පහළවීමෙන් පසු ගතකල සත්සතිය ගැන හෝ අවබෝධයක් ඔවුන්ට නැත. ඔවුන් 'සත්සතිය' දින හතලිස් නවයකට සමාන කරන්නේ එබැවිනි.**



## බුද්ධ පහළ වී

# දම්සක් පැවතුම් සූත්‍රය

## දේශනා කළ වගයි

ආලෝකෝ උදපාදි ලෙස හඳුන්වන
තථාගත දර්ශනය පහළ කර ගත් ආර්ය පුරුෂයා
දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කර
තමන් විසින් පහළ කර ගත්
ඇස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව සහ ආලෝකය
ලොවට පෙන්වා දෙයි.

ISBN-978-0-9804613-4-3

විකිණීම සඳහා නොවේ.

COVER DESIGN- creations